ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

වාර්ෂික වාර්තාව – 2021

වාර්ෂික වාර්තාව – 2021

මෙය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2021 වසරේ ක්‍රියාකාරකම් පිළිබඳ වාර්ෂික වාර්තාවයි. එය 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 30 වැනි වගන්තියට අනුකූලව ඉදිරිපත් කර ඇත.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
ප්‍රධාන කාර්යාලය
අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 04
දුක: (94) 0112505580, 2505581, 2505582
ෆැක්ස්: (94) 0112505541
විද්‍යුත් තැපෑල: sechrcsl@gmail.com
වෙබ් අඩවිය: www.hrcsl.lk

කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩලය
2021

සභාපති

ආචාර්ය ජගත් බාලසූරිය
(2021.01.01 සිට 2021.10.01 දක්වා)

විනිසුරු රෝහිණී මාරසිංහ
(2021.12.17 සිට ඉදිරියට)

කොමසාරිස්වරු

වෛද්‍ය එම්. එච්. නිමල් කරුණාසිරි

ආචාර්ය විජිත නානායක්කාර

අනුසුයා ශන්මුගනාදන් මහත්මිය

එච්. කේ. නවරත්න වේරදුව මහතා
(2021.01.01 සිට 2021.10.01 දක්වා)

පූජ්‍ය කළුපහන පියරතන හිමි
(2021.12.17 සිට ඉදිරියට)

සභාපතිනියගේ පණිවුඩය

කෝවිඩ්-19 වසංගතය ආරම්භයෙන් පසු දෙවන වසර වන 2021 වසර පෙර නොවූ විරූ අභියෝග රැසක් සැමට ගෙන ආවේය. සමාජයේ සෑම අංශයක්ම දුෂ්කරතාවන්ට මුහුණ දුන්නද, විශේෂයෙන් ආන්තික හා අවදානමට ලක්විය හැකි ප්‍රජාවන්ගේ මානව හිමිකම් කෙරෙහි බලපෑමින් අර්බුදය ව්‍යුහාත්මක අසමානතාවයන් උග්‍ර කළේය.

එවැනි වර්ධනය වන අභියෝග හමුවේ, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, එම අවස්ථාවට ක්‍රියාකාරීව නැගී සිටිමින් මානව හිමිකම් ක්ෂේත්‍රය තුළ බලපෑමකාරී මැදිහත්වීම් සිදු කළේය. මානව හිමිකම් සුරැකීමේ සහ ප්‍රවර්ධනය කිරීමේ කොමිසමේ වරම ක්‍රියාත්මක කිරීමේදී කොමිසමේ වාර්ෂික කාර්ය සාධනය ඉස්මතු කරන වාරිත්‍රානුකූලව නමුත් අත්‍යවශ්‍ය ප්‍රකාශනයක් වන වාර්ෂික වාර්තාව ප්‍රකාශයට පත් කිරීමේදී ඊට මාගේ පණිවුඩය ලබා දීම පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි සභාපතිනිය ලෙස මම සතුටු වෙමි.

සමාලෝචිත වසර තුළ කොමිෂන් සභාව විසින් සිදු කරන ලද බොහෝ කාර්යයන් අතර, තීරණාත්මක මැදිහත්වීම් කිහිපයක කැපී පෙනෙන ලක්ෂණ මෙහි ඉස්මතු කර ඇත. වසංගත කාලසීමාව තුළ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීමේ ප්‍රයත්නයන්හිදී කොමිෂන් සභාව කෝවිඩ්-19 වසංගතය පැතිරීම වැළැක්වීමේ ජාතික මධ්‍යස්ථානයේ ප්‍රධානියා වෙත කරුණු 11ක් සමඟ මාර්ගෝපදේශ නිකුත් කළේය. කොවිඩ් රෝග විනිශ්චය කරන ලද රෝගීන්ගේ අයිතිවාසිකම්, ඔවුන්ගේ සමීපතම පවුල්/භාරකරුවන්, ආබාධ සහිත පුද්ගලයන් රැකබලා ගන්නන් සහ රෝහල්වල සහ ප්‍රතිකාර මධ්‍යස්ථානවල අවශ්‍ය සුබසාධන ප්‍රමිතීන් මෙම මාර්ගෝපදේශවලට ඇතුළත් විය.

කෝවිඩ්-19 වෛරසයට එරෙහිව ප්‍රතිශක්තීකරණය සඳහා එන්නත් ශ්‍රී ලංකා රජයට ලැබුණු විට, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලිපියක් යොමුකරමින් ඉදිරි පෙළ සේවකයන්ට එන්නත ලබා ගැනීම සඳහා ප්‍රමුඛතා ක්‍රමයක් ස්ථාපිත කරන ලෙස නිර්දේශ කළේය.

කෝවිඩ්-19 වසංගතය අතරතුර පොලිස් අත්අඩංගුවේ සිටින රැඳවියන්ට ඔවුන්ගේ නීතිඥයින් සහ ඥාතීන් බැලීමට ඇති අයිතිය අහිමි කර ඇති බව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව නිරීක්ෂණය කළේය. ඔවුන්ට ප්‍රමාණවත් සුබසාධන පහසුකම් ද ලබා දී නොතිබිණ. පොලිස් අත්අඩංගුවේ පසුවන රැඳවියන්ගේ අයිතිවාසිකම් සහ සුබසාධනය තහවුරු කිරීම සඳහා සියලු පියවර ගන්නා ලෙස මානව හිමිකම් කොමිසම පොලිස්පතිවරයාගෙන් ඉල්ලා සිටි අතර, නිරෝධායන නීති උල්ලංඝණය කරන්නන් සියලු දෙනාටම කිසිදු භේදයකින් තොරව සහ නිරෝධායන මාර්ගෝපදේශයන්ට අනුකූලව සමානව සලකන ලෙසද කොමිසම පොලිස්පතිවරයාගෙන් ඉල්ලා සිටියේය.

2021 වසරේ අවසාන භාගයේදී දිවයිනේ විවිධ ස්ථානවල ගෑස් උදුන් පිපිරීම් පිළිබඳ සිද්ධීන් රැසක් වාර්තා විය. පාරිභෝගික කටයුතු අමාත්‍යාංශය, පාරිභෝගික කටයුතු අධිකාරිය, ශ්‍රී ලංකා ප්‍රමිති කාර්යාංශය, ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලිට්රෝ ගෑස් සමාගම සහ ලාෆ් ගෑස් සමාගම යන ආයතන සම්බන්ධ කරගෙන මානව හිමිකම් කොමිසම මෙම ගැටලුව පිළිබඳව කඩිනමින් විමර්ශනය කර විපතට පත් පාර්ශව වෙත වන්දි ගෙවීමට නිර්දේශ කරනු ලැබීය.

පොලිස් අත්අඩංගුවේ පසුවන සැකකරුවන්ගේ ආරක්ෂාව සහ අයිතිවාසිකම් තහවුරු කිරීම පොලිස් දෙපාර්තමේන්තුවේ මූලික වගකීමක් වන බැවින් අත්අඩංගුවේ සිටියදී සිදුවන මරණ සහ වධහිංසා සම්බන්ධයෙන් පොලිස්පතිවරයාගෙන් විමසීම් කරන ලදී. එසේ කිරීමට අපොහොසත් වීමෙන් රටේ නීතියේ ආධිපත්‍යය පිළිබඳ මහජන විශ්වාසය බිඳ වැටීමට හේතු වන බැවින් රැඳවියන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීමට සියලු පියවර ගැනීමේ අවශ්‍යතාවය මානව හිමිකම් කොමිසම අවධාරණය කළේය.

2018-2020 දක්වා පවත්වන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ බන්ධනාගාර අධ්‍යයන වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම් කිරීම සඳහා මානව හිමිකම් කොමිසම අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්, බන්ධනාගාර ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශයේ ලේකම් සහ බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා ද කැඳවා ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන්, එම වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම අධීක්ෂණය කිරීම සඳහා ක්‍රියාකාරී කමිටුවක් පත් කරන ලදී.

සමාලෝචිත වර්ෂය තුළ සිවිල් සමාජ සංවිධාන සමඟ සබඳතා ශක්තිමත් කිරීම ප්‍රමුඛතාවයක් ලෙස සලකනු ලැබීය. ඒ අනුව කොමසාරිස්වරු යාපනය, වවුනියාව, මඩකලපුව, ත්‍රිකුණාමලය, අම්පාර, මාතර, මන්නාරම සහ අනුරාධපුරය වෙත ගොස් සිවිල් සමාජ සංවිධාන නියෝජිතයින් මුණ ගැසුණහ. කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් ගමනාගමනයේ සිදු වූ සීමාවන් නිසා පුද්ගල උපදේශන සිදු කළ නොහැකි වුවද, කුඩා කණ්ඩායම් සමඟ සාකච්ඡා පැවැත්වූ අතර එය ඉතා ඵලදායී බව ඔප්පු විය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වසර තුළ සිදු කරන ලද තවත් වැදගත් මැදිහත්වීමක් වන්නේ පළමු ශ්‍රේණියට රජයේ පාසල්වලට ඇතුළත් කර ගැනීම් සම්බන්ධ චක්‍රලේඛය සංශෝධනය කිරීමට අධ්‍යාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත කරන ලද නිර්දේශයයි. ප්‍රධාන නිර්දේශ අතරට ඉඩම් අයිතිය වෙනුවට පදිංචිය මත ලකුණු වෙන් කිරීම, 'පදිංචි' කාණ්ඩයේ ප්‍රතිශතය 60% දක්වා වැඩි කිරීම සහ 'ආදි ශිෂ්‍ය' කාණ්ඩයේ ප්‍රතිශතය 15% දක්වා අඩු කිරීම ඇතුළත් වේ. ප්‍රාථමික පාසල්වලට ඇතුළත් වීමේ ක්‍රියාවලියේදී සිදුවන සියලු ආකාරයේ වෙනස්කම් කිරීම් සහ මූලික අයිතිවාසිකම් උල්ලංඝණය කිරීම් තුරන් කිරීම සඳහා තිරසාර වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට ද කොමිසම අදහස් කරයි.

යුරෝපා සංගමය විසින් ශ්‍රී ලංකාවට ලබා දෙන ජීඑස්පී ප්ලස් (GSP +) සහනය පිළිබඳ සමාලෝචනයක් ද වර්ෂය තුළ සිදු විය. ශ්‍රී ලංකාවට පැමිණි යුරෝපා සංගම් නියෝජිත පිරිස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව හමුවී කෝවිඩ්-19 වසංගතය තුළ මුහුණ දෙන සියලු අභියෝගවල මානව හිමිකම් අංශවල තත්ත්වය පිළිබඳව අදහස් හුවමාරු කර ගත්හ. කම්කරු අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් කම්කරු සංවිධාන සහ කාන්තා සංවිධානවලට අදාළ ගැටලු පිළිබඳව ද යුරෝපා සංගම් නියෝජිත පිරිස අවධානය යොමු කළහ.

තුන්වන පාර්ශව විසින් ලැබුණු වාර්තා මත පදනම්ව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 'ඒ' ශ්‍රේණියේ ජාතික මානව හිමිකම් ආයතනයක් ලෙස 2021 ඔක්තෝම්බර් මාසයේදී ජාතික මානව හිමිකම් ආයතනවල ගෝලීය සන්ධානය විසින් විශේෂ සමාලෝචනයකට ලක් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ජාතික මානව හිමිකම් ආයතනවල ගෝලීය සන්ධානයේ ව්‍යවස්ථාවේ 18.1 වගන්තියට අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව "බී" ශ්‍රේණියට

පහත හෙළීමට නිර්දේශ කරන ලදී. මෙම තීරණය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් අභියෝගයට ලක් කරන ලද අතර ජාතික මානව හිමිකම් ආයතනවල ගෝලීය සන්ධානය විසින් මෙතෙක් ස්ථිර තීරණයක් ගෙන නොමැති අතර, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සිය පැවරුම්භාරය දිගටම පවත්වාගෙන යයි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සිදු කරන ලද කාර්යයන් ආවරණය කරමින් සිය වාර්ෂික වාර්තාව සම්පාදනය කිරීමට හැකි වීම ගැන ආඩම්බර වන අතරම, 2021 වර්ෂයේදී ශ්‍රී ලංකාව තුළ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම හා ආරක්ෂා කිරීමේ අත්‍යවශ්‍ය ප්‍රයත්නයන්හිදී කොමිෂන් සභාවේ කාර්යයට සහාය වූ සියලුම පාර්ශවකරුවන්ට මගේ කෘතඥතාව පළ කිරීමට මෙය අවස්ථාවක් කර ගනිමි. ශ්‍රී ලංකා රජය, සිවිල් සමාජ සංවිධාන, රාජ්‍ය නොවන සංවිධාන, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ විදේශ දූත මණ්ඩල රට තුළ මානව හිමිකම් තහවුරු කිරීම සඳහා දක්වන නොසැලෙන සහයෝගය වෙනුවෙන් අපි කෘතඥ වෙමු.

ස්තුතියි.

විනිසුරු රෝහිණී මාරසිංහ
සභාපතිනිය
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

අන්තර්ගතය

කොමිෂන් සභාවේ සාමාජික මණ්ඩලය

සභාපතිනියගේ පණිවුඩය **3**

අන්තර්ගතය 4

කෙටි යෙදුම් 7

2021 වර්ෂයේ ශ්‍රී ලංකාවේ පැවති මානව හිමිකම් තත්ත්වය 11

1 වන පරිච්ඡේදය: කොමිෂන් සභාව 13

1.1. කොමිෂන් සභාව පිළිබඳ හැඳින්වීම 13

1.1.1 දැක්ම 13

1.1.2 මෙහෙවර 13

1.1.3 හරයාත්මක සාරධර්ම 13

1.1.4 උපාය මාර්ගික කේන්ද්‍රීය ක්ෂේත්‍ර 14

1.1.5 කොමිෂන් සභාවේ ලාංඡනය 14

1.2. පැවරුම් කාර්යභාරයෙහි ස්වභාවය සහ විෂය ක්ෂේත්‍රය **1**4

1.3. සංවිධාන ව්‍යුහය 16

2 වන පරිච්ඡේදය: පරීක්ෂණ හා විමර්ශන 18

2.1. හැඳින්වීම 18

2.1.1. සේවා ක්‍රම ශක්තිමත් කිරීම 18

2.1.2. මානව හිමිකම් තොරතුරු පද්ධතිය (HURIN) දියත් කිරීම 18

2.1.3. අභියාචනා යාන්ත්‍රණය හඳුන්වා දීම 18

2.1.4. 2021 දී පැමිණිලි හැසිරීමේ ස්වභාවය 19

2.1.5. 2021 දී අවසන් කළ පැමිණිළි 19

2.2. නිර්දේශ 26

2.3. විශේෂ පරීක්ෂණ හා මැදිහත්වීම් 27

2.3.1. අනුරාධපුර බන්ධනාගාරයේ සිදුවීම් පිළිබඳ විමර්ශනය 27

2.3.2. අත්අඩංගුවේ සිටියදී සිදුවූ මරණය 27

2.3.3. ගෘහස්ථ එල් පී (LP) ගෑස් සිලින්ඩර පිපිරීම සම්බන්ධයෙන් විමර්ශනයක් 27

2.4. එක්සත් ජාතීන්ගේ සාම සාධක භටයන් ලෙස යෙදවීමට නියමිත ශ්‍රී ලංකා හමුදා සාමාජිකයින් සුපරීක්ෂා කිරීම 28

2.5. ස්වයං සිද්ධි විමර්ශන 29

2.5.1. සිද්ධි අංක. HRC/SUO/MOTU/01/21 29
2.5.2 සිද්ධි අංක. HRC/SUO/MOTU/04/21 29
2.5.3. සිද්ධි අංක HRC/SUO/MOTU/06/21 29
2.5.4 සිද්ධි අංක HRC/SUO/MOTU/08/21 29
2.5.5 සිද්ධි අංක HRC/SUO/MOTU/09/21 30
2.5.6 සිද්ධි අංක HRC/MTR/Suomotu/07/21/V 30
2.5.7. සිද්ධි අංක HRC/MTR/Suomotu08/21/G 30
2.5.8. සිද්ධි අංක. HRC/AP/suomotu/01/09/2021 (S) 30
2.6. රැස්වීම් 31
2.6.1. බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා සමග රැස්වීම 31 32
2.6.2. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වූ රැඳවියන් සම්බන්ධයෙන් පොලිසිය සමඟ 2021/12/29 දින පැවති රැස්වීම 32

3 වන පරිච්ඡේදය: පර්යේෂණ හා අධීක්ෂණ 34
3.1. හැඳින්වීම 34
3.2. ජාතික බන්ධනාගාර අධ්‍යයනය පිළිබඳ පසු විපරම 34
3.3. විශේෂ අධීක්ෂණය සහ මැදිහත්වීම් 34
3.3.1. "බුරවි" සුළි කුණාටුව හේතුවෙන් අවතැන් වූ ජනතාව 34
3.3.2. වැවිලි ප්‍රජාවගේ අයිතිවාසිකම් 35
3.3.3. සරණාගතයින්ගේ අයිතිවාසිකම් 35
3.3.4. ළමා ගෘහ සේවය තුරන් කිරීම 35
3.4. රැඳවුම් ස්ථාන සහ රැකවරණ නිවාස නිරීක්ෂණය කිරීම 36
3.4.1. රැඳවුම් නියෝග ලියාපදිංචි කිරීම 36
3.5. කෝවිඩ්-19 එන්නත් සඳහා ප්‍රමුඛත්වය දීම 38
3.6. නිරෝධායන නීති උල්ලංඝණය කරන පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම පිළිබඳ මාර්ගෝපදේශ 38
3.7. කෝවිඩ්-19 වසංගතයෙන් සිරකරුවන් ආරක්ෂා කිරීම පිළිබඳ නිර්දේශ 38

4 වන පරිච්ඡේදය: අධ්‍යාපනය සහ බාහිර කටයුතු 39
4.1. හැඳින්වීම 39
4.2. ජාත්‍යන්තර අනුස්මරණ දින සැමරුම් 39
4.2.1. වධහිංසාවට ලක්වූවන්ට සහාය දැක්වීමේ ජාත්‍යන්තර දිනය-2021

4.2.2. ජාත්‍යන්තර කාන්තා දිනය - 2021 40
4.2.3. ජාත්‍යන්තර මානව හිමිකම් දිනය - 2021 42
4.3. මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන් 42
4.3.1. දැනුවත් කිරීමේ වැඩසටහන් 42
4.4. අනෙකුත් රාජ්‍ය ආයතන/වැඩසටහන් සමඟ දැනුම බෙදාගැනීම 42
4.5. මාධ්‍ය සමඟ සම්බන්ධ වීම 44
4.5.1. මාර්ගගත වේදිකා සහ ක්ෂණික ඇමතුම් සේවාව භාවිතා කිරීම 44
4.6. සිවිල් සමාජය සමඟ සම්බන්ධ වීම 44
4.6.1. ප්‍රාදේශීය සිවිල් සමාජ සම්බන්ධීකරණ කමිටු 45
4.6.2. සිවිල් සමාජ සංවිධාන විසින් සංවිධානය කරන ලද උත්සව වලට සහභාගී වීම 45
4.6.3. සිවිල් සමාජය සඳහා පුහුණුව 45

5 වන පරිච්ඡේදය: ජාත්‍යන්තර සහයෝගීතාවය 46
5.1. හැඳින්වීම 46
5.2. කලාපීය මානව හිමිකම් සන්ධාන සමඟ සබඳතා ශක්තිමත් කිරීම 46
5.3. බ්‍රිතාන්‍ය මහ කොමසාරිස්වරිය සමඟ රැස්වීම 46
5.4. යුරෝපීය කොමිසමේ නියෝජිතයින් සමඟ රැස්වීම 46
5.5. කොමිෂන් සභාවේ ශ්‍රේණිගත කිරීම 47
5.6. ශ්‍රී ලංකාවේ නවසීලන්ත මහ කොමසාරිස්වරයා සමඟ රැස්වීම 47
5.7. ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ නියෝජිතයන් සමඟ සාකච්ඡාව 47

6 වන පරිච්ඡේදය: මානව සම්පත්, පරිපාලනය සහ මූල්‍ය 48
6.1. හැඳින්වීම 48
6.2. මානව සම්පත් කළමනාකරණය 48
6.3. මූල්‍ය සම්පත් කළමනාකරණය 49
6.4. සීමාවාසික / ආධුනික පුහුණු වැඩසටහන 50

උපග්‍රන්ථ
උපග්‍රන්ථය 1 - ශ්‍රී ලංකාවේ මානව හිමිකම් කොමිසමේ ක්‍රියාකාරිත්වය: සිතියම
උපග්‍රන්ථය 2 - නිර්දේශ මාලාව

කෙටි පද මාලාව

A&F	පරිපාලන සහ මූල්‍ය
APF	ආසියා ශාන්තිකර සංසදය
CCD	කොළඹ අපරාධ කොට්ඨාශය
CID	අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව
CORE Justice	සංගත, විවෘත, ප්‍රතිචාරාත්මක සහ ඵලදායී සාධාරණත්ව වැඩසටහන
CTF4HR	මානව හිමිකම් සඳහා වූ ප්‍රජා කාර්යසාධන බලකා
DIG	නියෝජ්‍ය පොලිස්පති
DMS	කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව
DoP	බන්ධනාගාර දෙපාර්තමේන්තුව
ED&SP	අධ්‍යාපන හා විශේෂ වැඩසටහන්
EU	යුරෝපීය සංගමය
HQI	මූලස්ථාන පරීක්ෂක
HRCSL	ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
I & I	විමර්ශන හා පරීක්ෂණ
ICCPR	සිවිල් හා දේශපාලන හිමිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය
IGP	පොලිස්පති
IR	ජාත්‍යන්තර සබඳතා
JMO	අධිකරණ වෛද්‍ය නිලධාරී
LGBTIQ	සමරිසි කාන්තා, සමරිසි පිරිමි, ද්විලිංගික, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර් ලිංගික හා විවාද සම්පන්න
MFA	ආසියා සංක්‍රමණික සමුළුව
NGOs	රාජ්‍ය නොවන සංවිධාන
NPM	ජාතික වැළැක්වීමේ ක්‍රමවේදය
OMP	අතුරුදහන්වූ පුද්ගලයන් පිළිබඳ කාර්යාලය
OPCAT	වධහිංසා වලට එරෙහි ජාත්‍යන්තර සම්මුතියේ වෛකල්පිත සංධාන කෙටුම්පත
R&M	පර්යේෂණ හා අධීක්ෂණ
SOR	බඳවා ගැනීමේ පරිපාටිය
TID	ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය
UN	එක්සත් ජාතීන්ගේ සංවිධානය
UNDP	එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන
UNHCR	එක්සත් ජාතීන්ගේ සරණාගතයින් පිළිබඳ මහ කොමසාරිස්

ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය - 2021

2020 වර්ෂයේදී මෙන්ම, සමාලෝචිත වර්ෂය වසංගතය හේතුවෙන් බොහෝ දුෂ්කරතා ඇති වූ කෝවිඩ් - 19 වසංගතයේ ප්‍රතිවිපාක සහිත කාල පරිච්ඡේදයකි. 2020 ජනවාරි මාසයේ පළමු ආසාදිතයා හඳුනාගැනීමෙන් පසු, ශ්‍රී ලංකාව වසංගතයේ රැළි දෙකක් සාර්ථකව කළමනාකරණය කර ඇති නමුත් 2021 අප්‍රේල් මාසයේදී ආරම්භ වූ තුන්වන රැල්ල පාලනය කිරීමට අරගල කරමින් සිටියේය.

රෝගය පැතිරීම පාලනය කිරීම සඳහා ශ්‍රී ලංකා රජය දැඩි ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, දිවයින පුරා ප්‍රදේශ හුදකලා කර ගමන් සීමා කිරීම් පනවා ඇත. තුන්වන රැල්ල සමඟින්, වැළැක්වීමේ පියවරයන් බලාත්මක කිරීම, රට පුරා කෝවිඩ්-19 ප්‍රතිකාර පහසුකම් ශක්තිමත් කිරීම සහ කෝවිඩ්-19 එන්නත් කිරීමේ වැඩසටහන, විශේෂයෙන් ඉහළ අවදානම් සහිත ප්‍රදේශවල සහ අවදානමට ලක්විය හැකි ජනගහනය අතර ක්‍රියාත්මක කිරීම කෙරෙහි අවධානය යොමු කරන ලදී. 2021 වසර පුරා වසංගතය පාලනය කර ගැනීමට කඩිනම් එන්නත් වැඩසටහන සැලකිය යුතු ලෙස ඉවහල් වූ බව පැහැදිලිය. සෞඛ්‍ය අමාත්‍යාංශයේ සංඛ්‍යා ලේඛනවලට අනුව මාත්‍රා මිලියන 39.4 ක් භාවිතා කිරීමෙන් පුද්ගලයින් මිලියන 14.4 ක් සම්පූර්ණයෙන් එන්නත් කර ඇත (65.9%). මෙම තත්ත්වයන් යටතේ වසර තුළ මානව හිමිකම් පිළිබඳ සමහර ක්ෂේත්‍රවල දියුණුවක් පෙන්නුම් කළ අතර, අනෙකුත් ක්ෂේත්‍රවලට විශේෂයෙන්ම කෝවිඩ් - 19 වසංගතය යටතේ රජයේ ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් පුරවැසියන්ට තම අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමට ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් සීමා කිරීම වැළැක්වීම සඳහා සංකේන්ද්‍රිත උත්සාහයන් අවශ්‍ය විය.

කෝවිඩ් - 19 සන්දර්භය තුළ අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම් රාශියක් සිදු වූ අතර දිවයිනේ ප්‍රදේශ කිහිපයක රඳවා තබා ගැනීම් වාර්තා විය. විශේෂයෙන්ම ගුරු සංගම් වැටුප් වර්ධක ඉල්ලා උද්ඝෝෂණය කිරීමේදී ඔවුන් පොලිසිය විසින් අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගෙන නිරෝධායන මධ්‍යස්ථානවල රඳවා තබා ගත් අතර, රජයේ කෘෂිකාර්මික ප්‍රතිපත්තිවලට එරෙහිව විරෝධතා දැක්වූ විරෝධතාකරුවන් වසංගතය නිදහසට කරුණක් කරගෙන ඔවුන් පාලනය කිරීම සඳහා තහනමක් පැනවීය. මෙම සිදුවීම් විරෝධතාකරුවන්ගේ අදහස් ප්‍රකාශ කිරීමට සහ සාමකාමීව රැස්වීමට ඇති අයිතිය යටපත් කරයි. මෙම කාලය තුළ තවදුරටත් අත්අඩංගුවේ පසුවන පුද්ගලයින්ගේ මරණ සහ නීතියට පිටින් සිදුවූ ඝාතන සිදුවීම් ද සිදු විය. මෙම සිද්ධීන් ප්‍රධාන වශයෙන්ම ඉලක්ක කර ඇත්තේ මත්ද්‍රව්‍ය ජාවාරම්කරුවන් සහ පාතාල කණ්ඩායම් ය. අනුරාධපුර බන්ධනාගාරයේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වූ රැඳවියන් හිරිහැරයට ලක් වූ සිදුවීම් කිහිපයක් බන්ධනාගාර තුළ සිදු විය.

කෝවිඩ්- 19 හේතුවෙන් ආර්ථික, සමාජ, සංස්කෘතික අයිතීන් කිහිපයක් උල්ලංඝණය විය. විශේෂයෙන් රැකියා, අධ්‍යාපනය, සෞඛ්‍ය, ආහාර සහ සමාජ ආරක්ෂණ ක්ෂේත්‍රවලට බලපෑම් එල්ල විය. මෙම තත්ත්වය හේතුවෙන්, අවදානමට ලක්විය හැකි පුද්ගලයන් වඩාත් අවදානමට ලක් වූ අතර, විශේෂයෙන්ම ළමුන්, ආබාධ සහිත පුද්ගලයන්, වැඩිහිටියන් සහ සමරිසි කාන්තා, සමරිසි පිරිමි, ද්විලිංගික, සංක්‍රාන්ති සමාජභාවී, අන්තර් ලිංගික හා විවාද සම්පන්න ප්‍රජාව සහ වතු කම්කරුවන් විවිධ අංශවලින් විවිධ වෙනස්කම්වලට ලක් විය.

දුර්වල ප්‍රමිතියෙන් යුත් ද්‍රව පෙට්‍රෝලියම් වායුව හේතුවෙන් පාරිභෝගිකයින් පීඩාවට පත් වී ඇති අතර, ගෑස් සිලින්ඩර පිපිරීම හේතුවෙන් දිවයිනේ ප්‍රදේශ කිහිපයක මරණ වාර්තා විය. කෝවිඩ් - 19 සීමා කිරීම් හේතුවෙන් ආහාර මිල වැඩි වූ අතර, ඵලදායී මිල පාලන යාන්ත්‍රණයක් නොතිබුණි.

පොහොර සහ රසායනික ද්‍රව්‍ය ලබා ගැනීමේදී ගොවියෝ දැඩි දුෂ්කරතාවන්ට මුහුණ දුන්හ. මේ නිසා බොහෝ ගොවීන් තම වගාව අත්හැර දමා ජීවනෝපාය අහිමි කර ගත්හ. රජය පරිසරය සුරැකීම සඳහා රසායනික පොහොර සහ පළිබෝධනාශක අවම කිරීමේ ප්‍රතිපත්තිය හඳුන්වා දුන්නේය. තවද, දේශීය වගාකරුවන් දිරිමත් කිරීම සඳහා රජය ඇතැම් කෘෂිකාර්මික ආහාර ද්‍රව්‍ය සීමා කළ නමුත් කහ වැනි ඇතැම් කෘෂිකාර්මික නිෂ්පාදනවල මිල විශාල ලෙස ඉහළ ගියේය.

2021 වසර කෝවිඩ් වසංගත ගැටලු හේතුවෙන් අභියෝගාත්මක වසරක් විය. එබැවින් සිවිල්, දේශපාලන, ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතීන්ට දැඩි බලපෑමක් එල්ල විය. ජනතාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, ගරු කිරීම සහ ඉටු කිරීමේ මූලික වගකීම රජය සතු වේ.

1 වන පරිච්ඡේදය

1.1 කොමිෂන් සභාව පිළිබඳ හැඳින්වීම

මානව හිමිකම් කොමිෂන් සභාව යනු රට තුළ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා පිහිටුවා ඇති ස්වාධීන කොමිෂන් සභාවකි. කොමිසම ශ්‍රී ලංකාවේ ජාත්‍යාන්තර මානව හිමිකම් බැඳීම් පිළිබඳව ද අවධානයෙන් සිටින අතර, රට මෙම බැඳීම්වලට අවනත වන බව සහතික කිරීමට උත්සාහ කරයි.

1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් 1996 දී කොමිෂන් සභාව පිහිටුවන ලදී. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි නීතිමය පදනම සහ මෙහෙයුම් මූලධර්ම පනත මගින් දක්වා ඇත. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව යනු ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 20 වැනි සංශෝධනය යටතේ නියමිත කොමිෂන් සභාවකි. කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයින් පත් කරනු ලබන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නිර්දේශය මත ජනාධිපතිවරයා විසිනි. කොමිසම පාර්ලිමේන්තුවට වග කිව යුතුය.

1.1.1 දැක්ම

විවිධත්වය පිළිගනු ලබන හා සැමගේ මානව හිමිකම් වලට ගරු කරන්නා වූ සමාජයක්.

1.1.2. මෙහෙවර

“ජනතාවගේ ස්වාධිපත්‍යය මත පදනම් වූ ප්‍රජාතන්ත්‍රවාදය තුළ, මානව අයිතිවාසිකම්, මානව අභිමානය සහ නීතියේ ආධිපත්‍යය ප්‍රවර්ධනය සහ සුරැකීම උදෙසා නායකත්වය සැලසීම”.

1.1.3. හරයාත්මක සාරධර්ම

- මානව ගරුත්වයට ගරු කිරීම
- විවිධත්වයට ගරු කිරීම
- සමානාත්මතාවය සහ වෙනස් කොට නොසැළකීම
- සාමය, සත්‍යය සහ සාධාරණත්වය
- ස්වාධීනත්වය
- වගවීම
- සේවය
- නිහතමානිත්වය
- සාධුගුණය
- විනිවිදභාවය

1.1.4. උපායමාර්ගික කේන්ද්‍රීය ක්ෂේත්‍ර

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2021 - 2024 සඳහා උපාය මාර්ගික සැලැස්ම කෙටුම්පත් කරන ලදී. එහි ප්‍රධාන ඉලක්ක වන්නේ,

ඉලක්කය 1: ශ්‍රී ලංකාවේ සියලුම පුරවැසියන්ගේ මානව හිමිකම් ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම

ඉලක්කය 2: මානව හිමිකම් ආරක්ෂා කිරීම සඳහා ප්‍රවේශ විය හැකි සහ ප්‍රතිචාරාත්මක ජාලයක් පිහිටුවීම

ඉලක්කය 3: මානව හිමිකම් සංස්කෘතිය ගොඩනැගීම

ඉලක්කය 4: කළමනාකරණ පද්ධතියේ කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම

ඉලක්කය 5: මානව හිමිකම් සහතික කිරීම සඳහා අනෙකුත් ආයතන සමඟ හවුල්කාරිත්වයෙන් කටයුතු කිරීම

1.1.5. කොමිෂන් සභාවේ ලාංඡනය

ජාතික මට්ටමින් මානව අයිතිවාසිකම් සුරැකීම සහ ප්‍රවර්ධනය උදෙසා ජාතික මානව හිමිකම් ආයතනවල වගකීම කොමිෂන් සභා ලාංඡනයෙන් පිළිබිඹු වෙයි. මිනිස් සංහතියේ ජීව ගුණය හා නිර්මාණශීලිත්වය නිල් පාටින් නිරූපනය කරයි. ආරක්ෂාව හා ආරක්ෂාව සැපයීම් සඳහා පියවර ගැනීම දැතින් අදහස් වේ. මානව හිමිකම් වල විශ්වීයබව හා ජාත්‍යන්තර තලයෙන් ආරක්ෂාව සැළසීම ලෝක ගෝලය මගින් හුවා දැක්වේ. ශ්‍රී ලංකා සිතියම තුළින් මානව හිමිකම් ජාතික මට්ටමින් ආරක්ෂා කිරීමට පියවර ගැනීමේ අවශ්‍යතාවය පෙන්නුම් කෙරේ. කාන්තාවකගේ, පිරිමි පුද්ගලයෙකුගේ සහ දරුවෙකුගේ රූප මගින් මානව හිමිකම් ආරක්ෂාවීම සැමට සමානව සිදුවිය යුතු බව නිරූපනය කරන්නකි.

1.2. පැවරුම් කාර්යභාරයේ ස්වභාවය හා විෂය ක්ෂේත්‍රය

මානව හිමිකම් කොමිෂන් සභා පනත මගින් මූලික අයිතිවාසිකම් සහ මානව හිමිකම් සම්බන්ධයෙන් කොමිෂන් සභාවේ අධිකරණ බලය පිළිගනී. මූලික අයිතිවාසිකම් යනු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ III පරිච්ඡේදයේ සහතික කර ඇති ඇතැම් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් මෙන්ම ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් වේ. "සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය සහ ආර්ථික, සමාජීය සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතිය මගින් ප්‍රකාශිත සහ පිළිගත් අයිතිවාසිකම්" ලෙස පනතේ මානව හිමිකම් අර්ථ දක්වා ඇති අතර මේ අනුව ජාතික ප්‍රමිතීන් ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර නීතිමය බැඳීම්වලට අනුකූල බව සහතික කිරීමට කොමිෂන් සභාවට බලය ලබාදේ.

කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත කාර්යයන් (පනතේ 10 වැනි වගන්තියේ දක්වා ඇති පරිදි):

- මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සහ මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීම සහ ඒවා පිළිපැදීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියා පටිපාටි සම්බන්ධ පැමිණිලි පරීක්ෂණය සහ විමර්ශනය කිරීම;

- මූලික අයිතිවාසිකම් කඩකිරීම් හෝ ආසන්න කඩකිරීම් සම්බන්ධ පැමිණිලි පිළිබඳ පරීක්ෂණය සහ විමර්ශනය කිරීම, සහ සමථකරණයෙන් සහ මැදිහත්වීමෙන් විසඳීමට විධිවිධාන සැලසීම;
- මූලික අයිතිවාසිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා නීති සම්පාදනය සහ පරිපාලන නියෝග සහ ක්‍රියා පටිපාටි සැකසීමේදී රජයට උපදෙස් දීම සහ සහාය වීම;
- ජාතික නීති සහ පරිපාලන භාවිතයන් ජාත්‍යන්තර මානව හිමිකම් ප්‍රමිතීන් හා ප්‍රමිතීන්ට අනුකූල බව සහතික කිරීම සඳහා ගත යුතු ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම.
- මානව හිමිකම් ක්ෂේත්‍රයේ ගිවිසුම් සහ අනෙකුත් ජාත්‍යන්තර සාධනපත්‍රවලට දායක වීමේ හෝ ඒවාට එකඟ වීමේ අවශ්‍යතාවය පිළිබඳව රජයට නිර්දේශ ඉදිරිපත් කිරීම; හා
- මානව හිමිකම් සම්බන්ධයෙන් දැනුවත් කිරීම සහ අධ්‍යාපනය ලබා දීම ප්‍රවර්ධනය කිරීම.

ව්‍යවස්ථාපිත කාර්යයන් ඉටු කිරීම සඳහා, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව බලාත්මක කළ යුතු අවස්ථා (පනතේ 11 වැනි වගන්තියේ දක්වා ඇති පරිදි):

- මූලික අයිතිවාසිකම් උල්ලංඝණයවීම් හෝ උල්ලංඝණය වීමට අත්‍යාසන්න තත්ත්වයන් පරීක්ෂා කිරීම.
- කොමිෂන් සභාව විසින් ඊට අයත් බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය යැයි හැඟෙන අනු කමිටු සංඛ්‍යාවක් පළාත් මට්ටමින් පත් කිරීම
- මූලික අයිතිවාසිකම් උල්ලංඝණයවීම් හෝ උල්ලංඝණය වීමට අත්‍යාසන්න තත්ත්වයන්ට අදාළව ඕනෑම අධිකරණයක විභාග වෙමින් ඇති නඩු කටයුතු වලට අදාළ අධිකරණයේ අවසර ඇතිව මැදිහත්වීම;
- අධිකරණ නියෝගයකින් හෝ වෙනත් ආකාරයකින් රඳවාගෙන සිටින පුද්ගලයන්ගේ සුභසාධනය අධීක්ෂණය කිරීම, ඔවුන්ගේ රැඳවුම් ස්ථාන නිතිපතා පරීක්ෂා කිරීම සහ ඔවුන්ගේ රැඳවුම් කොන්දේසි වැඩිදියුණු කිරීම සඳහා අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කිරීම;
- ශ්‍රේෂ්ඨාධිකරණය විසින් නියෝග කරනු ලබන එවැනි පියවර ගැනීම හා ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කොමිෂන් සභාව වෙත යොමු කරන ඕනෑම කරුණකට අදාළව කටයුතු කිරීම:
- වැඩසටහන්, සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීම මගින් මානව හිමිකම් වලට අදාළ පර්යේෂණවල නිරත වීම හා දැනුවත්භාවය ඉහළ නැංවීම සහ එවැනි පර්යේෂණවල ප්‍රතිඵල සමාජගත කිරීම සහ බෙදා හැරීම;
- කොමිෂන් සභාවට පැමිණිලි කරන අගතියට පත් තැනැත්තෙකුට හෝ එම අගතියට පත් තැනැත්තා වෙනුවට ඉදිරිපත් වන පුද්ගලයාට ඔහු විසින් සාධාරණව දරන ලද වියදම් පියවීමට අවශ්‍ය මුදල් ප්‍රමාණයක් වියදම් කිරීමට කොමිෂන් සභාවට ඇති පරම හිමිකම.
- තම කර්තව්‍යයන් ඉටු කිරීමට අවශ්‍ය හෝ හිතකර වන වෙනත් එවැනි සියලු දෑ කිරීම.


1.3. සංවිධාන ව්‍යූහය

සභාපතිනියකගෙන් සහ කොමසාරිස්වරුන්ගෙන් සමන්විත වන්නාවූ කොමිෂන් සභාව විසින් කොමිෂන් සභාවේ ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටු කිරීම සඳහා ප්‍රතිපත්තිමය තීරණ ගැනීම සිදු කෙරේ. කොමසාරිස් මණ්ඩල රැස්වීම් සෑම මාසයකම පැවත්වේ.

මේ වන විට කොමිෂන් සභාව කාර්ය මණ්ඩල සාමාජිකයින් 144 දෙනෙකු සහිත අංශ 04 කින් සමන්විත වේ. ඒවා නම් පරීක්ෂණ සහ විමර්ශන, අධ්‍යාපන සහ විශේෂ වැඩසටහන්, පර්යේෂණ සහ අධීක්ෂණ සහ පරිපාලන සහ මූල්‍ය යන අංශයි. අවශ්‍ය කාර්ය මණ්ඩල බඳවා ගැනීමෙන් පසුව ජාත්‍යන්තර සබඳතා අංශයක් ද කොමිෂන් සභාවට ස්ථාපිත කිරීමට හැකි වනු ඇත. එක් එක් අංශය අධ්‍යක්ෂවරයකුගේ මූලිකත්වයෙන් සභාපතිවරයා හෝ කොමසාරිස් / කොමසාරිස්වරුන්ගේ අධීක්ෂණය යටතේ කටයුතු කෙරේ.

මීට අමතරව, කොමිෂන් සභාව ප්‍රාදේශීය කාර්යාල 10 ක් (අම්පාර, අනුරාධපුර, බදුල්ල, මඩකලපුව, යාපනය, කල්මුණේ, මහනුවර, මාතර, ත්‍රිකුණාමලය සහ වවුනියාව) සහ උප කාර්යාල තුනක් (කිලිනොච්චි, මන්නාරම සහ පුත්තලම) සහ ජංගම කාර්යාලයක් මගින් සේවා ලබා දේ. (උපග්‍රන්ථය 1 බලන්න) සෑම ප්‍රාදේශීය කාර්යාලයක්ම ප්‍රාදේශීය සම්බන්ධීකාරකයෙකුගේ මූලිකත්වයෙන් හා සභාපතිනිය සහ/ කොමසාරිස්වරයෙකු/ කොමසාරිස්වරුන්ගේ අධීක්ෂණය යටතේ ක්‍රියාත්මකව පවතී. මානව අයිතිවාසිකම් සඳහා වැඩි ආරක්ෂාවක් සැපයීම සහ කොමිෂන් සභා කටයුතු ජනතාවට සමීප කරවීම පිණිස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක වෙයි. ජනතා බහුතරය කොමිෂන් සභා කාර්යාවලියට ප්‍රවේශ වන්නේ ප්‍රාදේශීය සහ උප කාර්යාල පද්ධතිය ඔස්සේය. ඒ අනුව, ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය ප්‍රදේශයන්හි ජනතාව අතර හුදෙක් සම්බන්ධකයක් වීම අභිබවා යමින්, කොමිෂන් සභාවෙහි කාර්යභාරය ඉටු කිරීමෙහි ලා ප්‍රාදේශීය හා උපකාර්යාල තීරණාත්මක භූමිකාවක නියැලෙති. පැමිණිළි භාර ගැනීම, උල්ලංඝණයන්ට අදාළ චෝදනා විමර්ශනය කිරීම, සිදුවූ බව කියැවෙන මානව හිමිකම් උල්ලංඝණයන් සම්බන්ධයෙන් උපදේශනය, ආරාවුල් විසඳීමෙහි ලා බෙරුම්කරණය, උල්ලංඝණයන්ට අදාළ නිර්දේශ සඳහා ප්‍රධාන කාර්යාලයට යොමු කිරීම, අධීක්ෂණ කටයුතු ඉටු කිරීම, ප්‍රාදේශීය මට්ටමින් දැනුවත්වීම් ඉහළ නැංවීමේ වැඩසටහන් පැවැත්වීම සහ සිවිල් සංවිධාන සමග සහයෝගිතාවය හා සම්බන්ධීකරණය පවත්වා ගැනීම ඇතුළු ක්‍රියාකාරකම් පරාසයක් මෙම කාර්යාල විසින් සිදු කෙරේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සංවිධාන ව්‍යුහය



2 වන පරිච්ඡේදය

පරීක්ෂණ හා විමර්ශන

2.1 හැඳින්වීම

පරීක්ෂණ සහ විමර්ශන කටයුතු පරීක්ෂණ හා විමර්ශන අංශයට පවරා ඇති අතර එහි ප්‍රධාන වගකීම වන්නේ 1996 අංක 21 දරන මානව හිමිකම් කොමිෂන් සභා පනත සහ වගන්තිවලට අනුව මූලික අයිතිවාසිකම් කඩවීම් හෝ අත්‍යාසන්න උල්ලංඝණයන් පිළිබඳ පැමිණිලි විභාගය සහ විමර්ශනය කිරීමයි. ඒ අනුව මෙම අංශයේ කාර්ය භාරය මානව හිමිකම් කොමිෂන් සභා පනතේ පහත වගන්ති මත පදනම් වේ.

10 (අ). මූලික අයිතිවාසිකම්වලට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීම සහ මූලික අයිතිවාසිකම්වලට ගරු කිරීම සහ ඒවා පිළිපැදීම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් ක්‍රියා පටිපාටි සම්බන්ධ පැමිණිලි විභාගය සහ විමර්ශනය කිරීම;

10 (ආ) උල්ලංඝණය කිරීම් හෝ අත්‍යාසන්න උල්ලංඝණය කිරීම් හෝ මූලික අයිතිවාසිකම් පිළිබඳ පැමිණිලි විභාගය සහ විමර්ශනය කිරීම සහ අදාළ විධිවිධානවලට අනුකූලව සමථකරණයෙන් සහ මැදිහත් වීමෙන් ඒවා විසඳීමට විධිවිධාන සැලසීම;

කොමිෂන් සභාවට මහජනතාවගෙන් පැමිණිලි ලැබෙන අතර, ඒ සමඟම මූලික අයිතිවාසිකම් කඩවීම් හෙළිදරව් වන ගැටලු පිළිබඳව ස්වයං මැදිහත්වීමෙන් විමර්ශනය කිරීමට පනතේ 14 වැනි වගන්තිය යටතේ කොමිෂන් සභාවට බලය පවරා ඇත.

2.1.1 සේවා ක්‍රම ශක්තිමත් කිරීම

නව සේවා ක්‍රම හඳුන්වාදීම, ක්‍රියාත්මක කිරීම සහ පවතින යාන්ත්‍රණයන් වැඩිදියුණු කිරීම මගින්, මූලික අයිතිවාසිකම් කඩවීමට ලක්වන මහජනතාවගේ පැමිණිලි සහ දුක්ගැනවිලි පිළිබඳව කටයුතු කරන පරීක්ෂණ හා විමර්ශන අංශයේ කාර්යක්ෂමතාව සහ ප්‍රතිචාර දැක්වීම කොමිෂන් සභාව විසින් සහතික කර ඇත.

2.1.2 මානව හිමිකම් තොරතුරු පද්ධතිය (HURIN) දියත් කිරීම

පැමිණිලි යාන්ත්‍රණය ක්‍රමවත් කිරීමට සහ විද්‍යුත් ක්‍රම භාවිතයෙන් පැමිණිලි ලැබීමට පහසුකම් සැලසීමට කොමිසම මානව හිමිකම් තොරතුරු පද්ධතිය (HURIN) දියත් කළේය.

2.1.3 අභියාචනා යාන්ත්‍රණය හඳුන්වා දීම

නිර්දේශ නිකුත් කර අවසන් කරන ලද පැමිණිලි සඳහා හැර අනෙකුත් සියලුම පැමිණිලි සඳහා 2018 දී හඳුන්වා දුන් අභියාචනා යාන්ත්‍රණය 2021 දී සාර්ථකව ක්‍රියාත්මක විය. කෝවිඩ්-19 වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස අභියෝගාත්මක සේවා කොන්දේසි තිබියදීත්, පැමිණිලි නැවත සලකා බැලීම සඳහා හේතු තිබේද යන්න තීරණය කිරීමට 2021 දී සැලකිය යුතු අභියාචනා සංඛ්‍යාවක් සමාලෝචනය කරන ලදී.

2.1.4 2021 වසරේදී පැමිණිලි වල හැසිරීමේ ස්වභාවය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත 2021 වසරේ පැමිණිලි 6322ක් ලැබී ඇත. පැමිණිලි 6322න් 3228ක් (51%) ප්‍රාදේශීය කාර්යාල වෙත ලැබී ඇති අතර, ඉතිරිය ප්‍රධාන කාර්යාලයට ලැබී ඇත. පසුගිය වසර හා සසඳන විට මුළු පැමිණිලි සංඛ්‍යාවන් අතර සැලකිය යුතු වෙනසක් නොමැත. කෝවිඩ් - 19 වසංගත තත්ත්වය 2021 වසර පුරා පැවතුන අතර, පෙර වසරවල මෙන්ම, ඕනෑම පුද්ගල කාණ්ඩයක් සඳහා වැඩිම පැමිණිලි සංඛ්‍යාව 26% ක් ලැබී ඇත්තේ අත්අඩංගුවේ දී වධහිංසා පැමිණවීම්, අත්තනෝමතික ලෙස අත්අඩංගුවට ගැනීම්, රඳවා තබා ගැනීම්, හිරිහැර කිරීම සහ පුද්ගලික නිදහස උල්ලංඝණය කිරීම් සම්බන්ධයෙන්ය. පෙර වසර හා සසඳන විට පුද්ගලික නිදහස පිළිබඳ පැමිණිලි සංඛ්‍යාව අඩු වී ඇත. රාජ්‍ය ආයතනවල අක්‍රීයතාවය සම්බන්ධ මුළු පැමිණිලි සංඛ්‍යාව 1080ක් වන අතර, ඉන් 592ක් පොලිසියට එරෙහි පැමිණිලි වේ. රැකියා සම්බන්ධ පැමිණිලි කාණ්ඩය 811 ක් වූ අතර එය මුළු පැමිණිලිවලින් 13% කි. ප්‍රධාන කාර්යාලයට සහ ප්‍රාදේශීය කාර්යාලවලට ලැබුණු විවිධ කාණ්ඩවල පැමිණිලිවල සංඛ්‍යාලේඛන 1 වගුවේ දක්වා ඇත.

2.1.5 2021 වසරේදී අවසන් කළ පැමිණිලි

මෙම වසරේ පැමිණිලි 4319 ක් අවසන් කර ඇති අතර, පැමිණිලිකරුවන් උනන්දු නොවීම හේතුවෙන් මෙම නඩු වලින් 37% ක් (1588) අවසන් විය. කෙසේ වෙතත්, පැමිණිලි 369 ක් විසඳා ඇත. අවසන් කරන ලද පැමිණිලි පිළිබඳ විස්තර 2 වගුවේ දක්වා ඇත.

ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල වලට ලැබුණු පැමිණිලිවල විස්තර - 2021

පැමිණිලි වර්ග	ප්‍රදේශය												ප්‍රාදේශීය කාර්යාල	ප්‍රධාන කාර්යාලය	මුළු එකතුව
	අම්පාර	අනුරාධපුර	බදුල්ල	මඩකලපුව	යාපනය සහ කිලිනොච්චි	කල්මුනේ	මහනුවර	මාතර	නිකුණාමලය	පුත්තලම	මන්නාරම	වවුනියාව			
පුද්ගලික නිදහස	17	112	21	51	109	51	93	155	39	56	25	84	813	803	1616
1) වධහිංසා (ශාරීරික හා මානසික)	3	36	1	5	26	4	18	13	4	7	5	12	134	168	302
2) අවමන් සහගත සැලකීම	-	-	-	-	6	-	-	2	1	-	-	3	12	-	12
3) හිංසනය	2	4	13	9	30	25	23		9	34	11	32	192	199	391
4) ලිංගික අතවර	-	-	-	-	-	-	-	1	-	-	-	-	1	7	8
5) තර්ජනය කිරීම්	-	7	-	10	23	3	-	34	2	1	-	18	98	-	98
6) අත්තනෝමතික අත් අඩංගුවට ගැනීම / රඳවා තබා ගැනීම	12	65	7	27	24	19	51	99	23	14	9	19	369	403	772
7) අත්අඩංගුවේදී මරණයට පත්වීම්	-	-	-	-	-	-	-	2	-	-	-	-	2	11	13

8) නීති විරෝධී සාතන	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
9) බලහත්කාරයෙන් හෝ අකමැත්තෙන් කළ අතුරුදහන් කිරීම්	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	-
10) සිරකරුවන්ගේ අයිතිවාසිකම්	-	-	-	-	-	-	1	4	-	-	-	-	5	15	20
11) වෙනත් සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම්	-	-	-	4	2	2	2	2	-	-	-	-	12	3	15
12) රැකියා	17	48	38	24	30	34	120	51	8	17	3	34	424	387	811
13) අධ්‍යාපනය	-	3	7	25	9	13	52	60	-	1	1	11	182	135	317
14) රාජ්‍ය සුබසාධන සේවා	-	-	-	3	16	8	15	4	4	1	3	4	58	-	58
15) යටිතල පහසුකම් සහ උපයෝගීතා	1	-	4	-	3	7	11	1	-	2	-	3	32	8	40
16) ඡන්ද දායකයින් ලියාපදිංචි කිරීම සම්බන්ධ පැමිණිලි	-	-	-	1	-	1	-	-	-	-	-	2	4	3	7
17) රාජ්‍ය ආයතනවල අකාර්යක්ෂමතාවය පිළිබඳ පැමිණිලි	27	208	73	247	98	55	143	35	23	53	14	4	980	100	1080
a) පොලිසිය	5	60	39	165	72	44	68	25	14	32	10	-	534	58	592
b) වෙනත් රාජ්‍ය ආයතන	22	148	34	82	26	11	75	10	9	21	4	-	442	42	484
ළමා අයිතිවාසිකම්	-	3	-	2	-	3	2	-	-	-	-	-	10	-	10


වෙනස් හැකියාවන් ඇති පුද්ගලයින්ගේ අයිතිවාසිකම්	-	-	-	-	-	-	1	-	-	-	-	-	1	2	3
භාෂාමය අයිතිවාසිකම්	-	-	-	-	-	-	1	-	-	-	-	1	2	-	2
සංක්‍රමණික සේවකයින්ගේ අයිතිවාසිකම්	-	2	-	6	-	-	1	-	1	-	-	1	11	3	14
LGBT (සමලිංගික ස්ත්‍රී,සමලිංගික පුරුෂ, සංක්‍රාන්ති සමාජභාවී පුද්ගල අයිතිවාසිකම්	-	-	-	-	-	-	-	-	-	-	-	-	-	4	4
සෞඛ්‍යමය අයිතිවාසිකම්	-	2	1	6	2	-	1	-	-	-	-	-	12	4	16
ඉඩම් සහ දේපල අයිතිවාසිකම්	20	22	15	19	16	19	32	11	10	26	16	45	251	66	317
අභ්‍යන්තර අවතැන්වූ පුද්ගලයින්/නැවත පැමිණි සරණාගතයින්	-	-	-	-	-	-	1	-	-	-	-	-	1	-	1
පාරිසරික අයිතිවාසිකම්	-	1	-	2	3	1	-	3	-	1	-	4	15	9	24
පරිපාලන කටයුතු	3	-	10	-	7	8	34	16	7	1	-	17	103	71	174
කාන්තා අයිතිවාසිකම්	-	-	-	-	-	-	-	1	-	1	-	-	2	-	2
වෙනත් වර්ග (විෂය පථය වෙනත් ආයතනවලට යොමු කිරීම් හා විෂය පථයට අයත් නොවන පැමිණිලිද ඇතුළුව)	50	75	22	10	16	5	23	95	3	9	7	-	315	1496	1811
එකතුව	135	476	191	400	311	207	532	434	95	168	69	210	3228	3094	6322

වගුව 01 - ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල වලට ලැබුණු පැමිණිලිවල විස්තර

2021 වර්ෂයේදී කටයුතු නිම කරන ලද පැමිණිලි සංඛ්‍යා

	අම්පාර	අනුරාධපුර	බදුල්ල	මඩකලපුව	යාපනය සහ [illegible]	මහනුවර	කලුතර	මාතර	නිකුණාමලය	මන්නාරම	මඩකිරිය	මුත්තලම	එකතුව	ප්‍රතිශතය
සමථයකට පත්වීම	07	128	21	40	80	12	10	01	13	13	15	09	369	8.54
මූලික අයිතිවාසිකම් කඩ නොවූ	18	76	46	19	106	193	22	64	14	13	40	04	887	20.54
ඉල්ලා අස්කර ගැනීම්	--	10	15	01	01	08	01	02	02	03	03	05	118	2.73
උනන්දුවක් නොමැති	25	88	32	57	17	93	09	82	20	03	34	20	1588	36.77
විෂය පථයට අයත් නොවන	50	75	22	10	18	29	--	97	19	12	13	--	489	11.32
සහන ලබා දුන්	10	--	19	74	10	52	31	20	--	06	17	04	340	7.87
අවසන් නොවූ අධිකරණ ක්‍රියාමාර්ග	11	62	--	14	47	39	08	16	--	02	--	02	304	7.04
මගපෙන්වීම් ලබාදීම්	--	--	--	--	--	37	--	--	--	--	--	--	44	1.02
කාලාවරෝධී	--	--	--	--	01	06	--	35	--	--	--	--	44	1.02
ප්‍රධාන කාර්යාලයට නිර්දේශ කළ	--	07	06	02	--	13	--	--	01	--	--	--	29	0.67
වෙනත් ආයතන වෙත යොමු කිරීම්	--	02	51	01	03	22	--	10	--	02	06	--	107	2.48
එකතුව	**121**	**448**	**212**	**218**	**283**	**504**	**81**	**327**	**69**	**54**	**128**	**44**	**4319**	**100.00**

වගුව 2 – 2021 වසරේ දී අවසන් කළ පැමිණිලි පිළිබඳ සංඛ්‍යාලේඛන




2.2 නිර්දේශ

2021 දී කොමිෂන් සභාව **3** වගුවේ දක්වා ඇති පරිදි පහත සඳහන් කාණ්ඩ යටතේ නිර්දේශ **88**ක් නිකුත් කළේය.

පැමිණිලි කාණ්ඩය	පැමිණිලි සංඛ්‍යාව	ප්‍රතිශතය
පුද්ගල නිදහස	44	50%
රැකියා කටයුතු	23	27%
අධ්‍යාපනය (පාසල් ප්‍රවේශය)	12	14%
ඉඩම් සහ දේපල අයිතිය	02	2%
බලය අනිසි ලෙස භාවිතා කිරීම	02	2%
රාජ්‍ය සුබසාධන සේවා	03	3%
වෙනත්	02	2%
එකතුව	88	100%

වගුව **3** - පැමිණිලි මත නිකුත් කරන ලද නිර්දේශ - **2021**



2.3 විශේෂ පරීක්ෂණ සහ මැදිහත්වීම්

2.3.1 අනුරාධපුර බන්ධනාගාරයේ සිදුවීම් පිළිබඳ විමර්ශනය

2021.09.12 වන දින බන්ධනාගාර රාජ්‍ය අමාත්‍යවරයා ඇතුළු පිරිසක් අනුරාධපුර රිමාන්ඩ බන්ධනාගාර පරිශ්‍රයට නිශ්චිත අරමුණකින් තොරව නිල නොවන ලෙස ඇතුළුවීමේ සිද්ධියක් වාර්තා විය. ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ රක්ෂිත බන්ධනාගාරගත කර සිටින සිරකරුවන් කිහිප දෙනෙකු ඉහත කී අමාත්‍යවරයා හමුවට පමුණුවා ඔහු ඉදිරියේ දණගස්වන ලෙස නියෝග කර මරණීය තර්ජන සිදු කර ඇත. ඉන් අනතුරුව, මානව හිමිකම් කොමිෂන් සභාවේ විශේෂ කණ්ඩායමක් අනුරාධපුර බන්ධනාගාරයේ සංචාරයක නිරත වූ අතර, එහිදී රැඳවියන්ගෙන් ප්‍රකාශ සටහන් කර ගන්නා ලදී. තවද, මානව හිමිකම් කොමිෂන් සභාව විසින් රාජ්‍ය අමාත්‍යවරයා ඇතුළු අදාළ බලධාරීන් කරුණු විමසීම සඳහා කැඳවා ඇත.

2.3.2 අත්අඩංගුවේ සිටියදී සිදුවූ මරණය

2021 නොවැම්බර් 25 වැනි දින රාත්‍රී 10ට පමණ නීතීඥ සංජය ආරියදාස මහතා කොමිසමේ ක්ෂණික ඇමතුම් අංකයට දුරකථන ඇමතුමක් ලබාදී හේවා ලුණුවිලගේ ලසන්ත හෙවත් ටින්කරින් ලසන්ත කළුතර කොට්ඨාශ අපරාධ විමර්ශන කාර්යාංශය විසින් අත්අඩංගුවට ගෙන සඟවා තිබූ ආයුධ සොයා ගැනීමේ මුවාවෙන් එදින ඔහුව ඝාතනය කිරීමට සැලසුම් කර ඇති බව දන්වා සිටියේය. ඉහත සඳහන් කළ පැමිණිලිවලින් පසුව, එම පැමිණිල්ල සම්බන්ධයෙන් අදාළ නීතිමය රැකවරණය ලබා ගන්නා ලෙස මානව හිමිකම් කොමිෂන් සභාවේ පරීක්ෂණ සහ විමර්ශන අංශයේ අධ්‍යක්ෂ ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ මානව හිමිකම් අංශයේ අධ්‍යක්ෂ වෙත උපදෙස් ලබා දුන්නේය. තවද, 2021 නොවැම්බර් 25 වැනි දින ක්ෂණික ඇමතුම් අංකය භාර නිලධාරියා පොලිස් අපරාධ කොට්ඨාශය අමතා එවැනි අත්අඩංගුවට ගැනීමක් පිළිබඳව විමසා ඇත. කෙසේ වෙතත්, එවැනි අත්අඩංගුවට ගැනීමක් සිදු කර නොමැති බව කාර්යභාර නිලධාරී විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත දන්වා ඇත. පසුව ලුණුවිලගේ ලසන්ත හෙවත් ටින්කරින් ලසන්ත සඟවා තිබූ ආයුධ සොයා ගැනීමට රැගෙන යමින් සිටියදී ඇති වූ වෙඩි හුවමාරුවකින් මියගිය පුවත කොමිසමේ අවධානයට ලක්විය. ඉන් අනතුරුව විමර්ශන කණ්ඩායමක් අපරාධය සිදුවූ ස්ථානයට ගොස් මෙම සිද්ධියට සම්බන්ධ අදාළ පාර්ශ්වයන්ගෙන් ප්‍රකාශ සටහන් කර ගන්නා ලදී. ලුණුවිලගේ ලසන්ත හෙවත් ටින්කරින් ලසන්ත නැමැත්තාගේ අත්අඩංගුවෙන් පසුව සිදුවූ මරණය සම්බන්ධයෙන් පරීක්ෂණ කටයුතු මේ වනවිට සිදුවෙමින් පවතී.

2.3.3 ගෘහස්ථ එල් පී ගෑස් සිලින්ඩර පිපිරීම පිළිබඳ විමර්ශනය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ගෘහස්ථ එල් පී ගෑස් සිලින්ඩර පිපිරීම් සම්බන්ධයෙන් පාරිභෝගික ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යාංශයේ, පාරිභෝගික ආරක්ෂණ අධිකාරියේ සහ ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ නිලධාරීන් සහ අනෙකුත් අදාළ පාර්ශ්වයන් සමඟ එල් පී ගෑස් පාරිභෝගිකයින් හට සිදුවිය හැකි ඕනෑම හානියකින් ඔවුන් ආරක්ෂා කර ගැනීම පිණිස ඉක්මන් විසඳුමක් සෙවීම සඳහා පරීක්ෂණයක් ආරම්භ කරන ලදී. මානව හිමිකම් කොමිසමෙහි ප්‍රධාන කාර්යාලයේ පැවති මෙම පරීක්ෂණය සඳහා කොමිසම විසින් ගෑස් සමාගම් සහ අනෙකුත් අදාළ ආයතන කැඳවා ඇත.

2.4 එක්සත් ජාතීන්ගේ සාම සාධක භටයන් ලෙස යෙදවීමට නියමිත ශ්‍රී ලංකා ආරක්ෂක හමුදා සාමාජිකයින් සුපරික්ෂා කිරීම

ශ්‍රී ලංකා රජයේ ආරාධනයෙන් එක්සත් ජාතීන්ගේ සාමසාධක මෙහෙයුම් සඳහා යෙදවීමට 2017 වසරේ ආරම්භ කරන ලද හමුදා නිලධාරීන්ගේ මානව හිමිකම් විමර්ශනය 2021 වසරේදී ද අඛණ්ඩව සිදු කරන ලදී. මෙම ක්‍රියාවලිය මඟින් සාමසාධක මෙහෙයුම සඳහා යෙදවිය යුතු පුද්ගලයන්ගේ මානව හිමිකම්වලට ගරු කිරීම සහ කැපවීම ඇතුළුව අවංකභාවයේ ඉහළම ප්‍රමිතීන් සපුරාලීම සහතික කරයි. පරීක්ෂණ ක්‍රියාවලිය පාලනය කරන කාර්යපටිපාටික රීතිවල ඌනතාවයක් තිබූ බැවින්, පරීක්ෂණ ක්‍රියාවලිය විධිමත් කිරීම සඳහා සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටිය (SOP) සැකසීමට 2018 දී වට මේස සාකච්ඡාවකදී තීරණය කරන ලදී. සියලුම පාර්ශ්වකරුවන් විසින් සම්මත මෙහෙයුම් ක්‍රියා පටිපාටියට එකඟ වන තෙක් පරීක්ෂණ ක්‍රියාවලිය නතර කරන ලදී. එය අවසානයේ 2018 දෙසැම්බර් මාසයේදී ක්‍රියාත්මක විය. අයදුම්පත් ගොඩගැසීමට හේතු වූ ක්‍රියාවලිය නවතා දැමීම හේතුවෙන්, ද්විත්ව පරීක්ෂණයක් පැවැත්වීමට සියලු පාර්ශවකරුවන් විසින් තීරණය කරන ලදී. එනම්, විමර්ශන ක්‍රියාවලිය කඩිනම් කිරීම සඳහා කොමිෂන් සභාව මෙන්ම ජිනීවාහි පිහිටි එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් පිළිබඳ මහ කොමසාරිස් කාර්යාලය විසින් ද අයදුම්පත් පරීක්ෂා කරන ලදී. 2021 වර්ෂයේදී, කොමිසම වාර්තා කරන වර්ෂයේ යෙදවීම සඳහා හමුදා සාමාජිකයින් 296 දෙනෙකු පරීක්ෂා කර තහවුරු කරන ලදී. විස්තර පහත වගුවේ දක්වා ඇත.

2021 වර්ෂය තුළ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ආවරණය කරන ලද ගොනු සංඛ්‍යාව පිළිබඳ තොරතුරු

මෙහෙයුමේ නම	ආයතනය	නිදහස් කළ ගොනු සංඛ්‍යාව
UNIFIL Contingent	ශ්‍රී ලංකා යුධ හමුදාව	66
UNMISS L II Hospital Contingent	ශ්‍රී ලංකා යුධ හමුදාව	78
MINUSMA Contingent	ශ්‍රී ලංකා යුධ හමුදාව	34
MINUSCA Aviation Contingent	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	110
MINUSCA Individual Officers	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	05
MINUSCA Individual Officers	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	02
UNIFIL Individual Officers	ශ්‍රී ලංකා නාවුක හමුදාව	01
නිදහස් කළ මුළු ගොනු සංඛ්‍යාව	-	296

2.5 ස්වයං සිද්ධි විමර්ශන

පනතේ 14 වගන්තිය යටතේ කොමිෂන් සභාව ස්වයං සිද්ධි අධ්‍යයන (suo motu) ක්‍රියාත්මක කරමින් ගැටලු කිහිපයකට මැදිහත් විය. බොහෝ විට, මැදිහත් විය යුතු කරුණු හඳුනාගනු ලබන්නේ මාධ්‍ය අධීක්ෂණය සහ පුද්ගලයන් හෝ සංවිධාන එවැනි ගැටලු කොමිසමේ අවධානයට යොමු කිරීම මගිනි. මෙම ක්‍රියාකාරකම් මගින් පරීක්ෂණ සහ විමර්ශන අංශය, පර්යේෂණ සහ අධීක්ෂණ අංශය සහ මානව හිමිකම් කොමිසමේ ප්‍රාදේශීය කාර්යාල අතර සමීප සහයෝගිතාවයක් පෙන්නුම් කරයි.

2.5.1. සිද්ධි අංක. HRC/SUO/MOTU/01/21

මෙම පැමිණිල්ල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 11 වැනි වගන්තිය උල්ලංඝණය කිරීමක් සම්බන්ධයෙනි. ශ්‍රී ලංකා නීති විද්‍යාලයේ නීති ශිෂ්‍යයෙකු වන පැමිණිලිකාර සතේන්ද්‍ර මිගාර ගුණවර්ධන මහතා 2021 පෙබරවාරි 25 වන දින පැලියගොඩ පොලිස් ස්ථානයේ සිටියදී වධහිංසා, කෲරත්වය සහ අමානුෂික දඬුවම්වලට ලක්ව ඇත. පොලිස් අත්අඩංගුවේ සිටි මිතුරන් දෙදෙනා බැලීමට යමින් සිටියදී ඔහුට වධහිංසා පමුණුව තිබේ. මෙම කාරණය සම්බන්ධයෙන් වැඩිදුර විමර්ශන කටයුතු කොමිෂන් සභාව විසින් පවත්වයි.

2.5.2 සිද්ධි අංක. HRC/SUO/MOTU/04/21

නාරාහේන්පිට පොලිස් ස්ථානයේ පොලිස් නිලධාරීන් තමන්ව අත්අඩංගුවට ගෙන වධහිංසා පමුණුවා ඇති බවට මෙම පැමිණිල්ලේ දී සොරකමකට සැකපිට අත්අඩංගුවට ගත් සැකකරු චෝදනා කරයි. මානව හිමිකම් කොමිසමේ කණ්ඩායමක් එම පොලිස් ස්ථානයට පැමිණ ඔවුන්ගේ නිරීක්ෂණ කටයුතු සිදු කළහ. කොමිසම මගින් වැඩිදුර විමර්ශනයක් පවත්වයි.

2.5.3 සිද්ධි අංක HRC/SUO/MOTU/06/21

මෙම සිද්ධියේදී මියගිය එස්.එච්.එම්. අලි බාන් පානදුර - උතුර පොලිස් ස්ථානයේ නිලධාරීන් විසින් 2021 ජුනි 6 වන දින ආහාර මිලදී ගැනීම සඳහා තම නිවසින් පිටතට ගොස් සිටියදී අත්අඩංගුවට ගනු ලැබීය. ජනමාධ්‍යවල නිකුත් වූ සීසීටීවී දර්ශනවලට අනුව මියගිය පුද්ගලයා පොලිස් රථයෙන් ඉවතට තල්ලු කිරීම හේතුවෙන් රථයෙන් ඉවතට විසිවී යන අයුරු දැකගත හැකි විය. ඔහුගේ බිරිඳ ලබාදුන් ප්‍රකාශය අනුව ඇය ඔහු බැලීමට ගිය අවස්ථාවේදී ඔහු බරපතළ තුවාල ලබා සිටි බව පෙනී ගොස් ඇත. පසුව ඔහු පානදුර රෝහලට ඇතුළත් කිරීමෙන් පසු මියගොස් ඇත. පැමිණිල්ලට අනුව මානව හිමිකම් කොමිසම මගින් වැඩිදුර විමර්ශන පැවැත්වීමට නියමිතය.

2.5.4 සිද්ධි අංක HRC/SUO/MOTU/08/21

ජනාධිපති සමාව ඉල්ලා වැලිකඩ බන්ධනාගාරයේ සිරකරුවන් ආරම්භ කළ විරෝධතාව සම්බන්ධයෙන් කොමිසමට පැමිණිල්ලක් ලැබී තිබුණි. කොමිසමේ නිලධාරීන් බන්ධනාගාරයට ගිය අතර, එහිදී ඔවුන් ජනාධිපති සමාව සම්බන්ධයෙන් නීතිමය පසුබිම සහ කොමිසමේ වගකීම පැහැදිලි කළහ. මෙම පැහැදිලි කිරීමෙන් පසු විරෝධතාකරුවන් කිහිපදෙනෙකු විරෝධතාවයෙන් ඉවත් වීමට එකඟ වූ අතර, කොමිසමේ නිලධාරීන් විරෝධතාකරුවන්ට උපදෙස් දුන්නේ ගැටලුව සමථයකට පත් කරන ලෙසයි.

2.5.5 සිද්ධි අංක HRC/SUO/MOTU/09/21

මෙහිදී ශ්‍රී ලංකා පොලිස් බළකායේ පොලිස් නිලධාරීන් විසින් සාමාන්‍ය ජනතාවට හිරිහැර කරන සිද්ධීන් කිහිපයක් කොමිසමේ අවධානයට යොමු විය. රත්නපුර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරයාගේ හැසිරීම සම්බන්ධයෙන් ඇති වූ සිද්ධිය සහ එරාවුර් පොලිස් ස්ථානයට සහ කඩවත පොලිස් ස්ථානයට අනුයුක්තව සේවය කරන පොලිස් නිලධාරීන්ගේ හැසිරීම සම්බන්ධයෙන් ඇති වූ සිද්ධි සම්බන්ධයෙන් කොමිසමේ අවධානය යොමුව තිබුණි. මෙම කරුණු ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් විමර්ශනය කරමින් පවතින අතර, ශ්‍රේෂ්ඨාධිකරණයට ද අයදුම්පතක් ගොනු කරනු ලැබේ.

2.5.6 සිද්ධි අංක HRC/MTR/Suomotu/07/21/V

2021.11.16 වන දින පනාමුර පොලිසිය විසින් අත්අඩංගුවට ගත් ඉන්දික ජයරත්න පොලිස් අත්අඩංගුවේ සිටියදී මියගොස් ඇත. ප්‍රදේශවාසියෙකුට පහරදී ඝාතනය කිරීම සම්බන්ධයෙන් සැකපිට ඔහුට එරෙහිව පරීක්ෂණ පවත්වයි. මානව හිමිකම් කොමිසමේ කණ්ඩායමක් පනාමුරේ පොලිස් ස්ථානයට පැමිණ අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් අධිකරණයට වාර්තා කර සියලු තොරතුරු පොත් පරීක්ෂා කර අදාළ සටහන් තබා ඇත. අත්අඩංගුවට ගැනීමේ සිට අධිකරණයට වාර්තා කිරීම දක්වා සියලුම වාර්තා ලබා ගැනීම සඳහා අධිකරණ වෛද්‍ය නිලධාරී වාර්තාවක් ද කැඳවා ඇත. මේ වන විට අදාළ නිලධාරීන්ගෙන් ප්‍රකාශ ලබාගෙන ඇත.

2.5.7 සිද්ධි අංක HRC/MTR/Suomotu08/21/G

2021.12.18 වන දින හුංගම පොලිසිය විසින් අත්අඩංගුවට ගත් ප්‍රේමතිලක අමරවීර පොලිස් අත්අඩංගුවේ සිටියදී මියගොස් ඇත. මෙම මරණයට හේතුව හෘදයාබාධයක් ලෙස දක්වා ඇත. 2021.12.18 දින නීතිවිරෝධී ලෙස මත්පැන් අලෙවි කිරීමේ සිද්ධියක් සම්බන්ධයෙන් අත්අඩංගුවට ගෙන සිටි මෙම සැකකරුගේ මරණය සම්බන්ධයෙන් විමර්ශන ආරම්භ කෙරුණි. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කණ්ඩායමක් හුංගම පොලිස් ස්ථානයට පැමිණ අත්අඩංගුවට ගැනීම සම්බන්ධයෙන් අධිකරණයට වාර්තා කර සියලු තොරතුරු පොත් සහ සීසීටීවී දර්ශන පරීක්ෂා කර අදාළ සටහන් තබා ගත්හ. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ද අධිකරණ වෛද්‍ය නිලධාරියාගෙන් වාර්තාවක් කැඳවා ඇත.

2.5.8 සිද්ධි අංක. HRC/AP/suomotu/01/09/2021 (S)

අවන්තිදේවි ළමා නිවාසයේ බාලවයස්කාර දැරියන්ට අනිසි සැළකිලි සිදුවන බව අද දෙරණ නාලිකාවේ විකාශය වූ "උකුස්සා වැඩසටහන" මගින් අනාවරණය විය. ඉහත සඳහන් ළමා නිවාසය විසින් සංවිධානය කරන ලද වැඩසටහන් අතර මත්පැන් භාවිතය සම්බන්ධ සාද පැවත්වෙන බව වාර්තා වැඩසටහන මගින් අනාවරණය විය. තවද, ළමා නිවාසය තුළ අක්‍රමිකතා රැසක් සිදු වූ බව වාර්තා වූ නමුත් මේ සම්බන්ධයෙන් නිසි විමර්ශනයක් සිදු කිරීමට රාජ්‍ය බලධාරීන් අපොහොසත් වී ඇත. ඉහත සිද්ධියෙන් පසු කොමිසම පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයාගෙන් සහ අනුරාධපුර පොලිස්

ස්ථානය භාර නිලධාරිවරයාගෙන් වාර්තා කැඳවීය. අදාළ බලධාරීන් විසින් ඉදිරිපත් කර ඇති වාර්තාවට අනුව මේ සම්බන්ධයෙන් දැනටමත් පරීක්ෂණ සිදුකෙරෙමින් පවතී.

2.6 රැස්වීම්

2.6.1 බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා සමග රැස්වීම

කොවිඩ් - 19 වසංගතය යටතේ සිටින රැඳවියන් සම්බන්ධයෙන් කොමිසමේ නිරීක්ෂණ සහ ගැටලු සාකච්ඡා කිරීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුවේ කොමසාරිස් ජනරාල්වරයා සමඟ 2021.05.12 දින මානව හිමිකම් කොමිෂන් සභාවේදී හමුවක් පැවැත්විණි. කොවිඩ්-19 තත්ත්වය තුළ රැඳවුම් මධ්‍යස්ථානවල තත්ත්වය සහ වෛරසය වැළඳුණු රැඳවියන්ට ලබා දෙන ප්‍රතිකාර පිළිබඳව කොමිසම විමසා සිටියේය. පවතින තත්ත්වය යටතේ රැඳවියන් බැලීමට ඔවුන්ගේ ඥාතීන්ට නොහැකි බැවින් ඔවුන්ට ලබාදී ඇති සන්නිවේදන පහසුකම් පිළිබඳව ද කොමිසම තවදුරටත් විමසීය.

මෙම රැස්වීමේදී කොමිෂන් සභාව වසංගත කාලසීමාව තුළ රැඳවියන් සඳහා ලබාදී ඇති සනීපාරක්ෂක පහසුකම් පිළිබඳවද විමසා ඇත. මීට අමතරව අගුණුකොළපැලැස්ස බන්ධනාගාරයේ රැඳවියන් වධහිංසාවට ලක් කිරීමේ සිද්ධිය සම්බන්ධයෙන් සහ අසේල සම්පත් යන අය නිරෝධායනයට ලක්ව සිටියදී ඔහුට වධහිංසා පැමිණවීමේ සිද්ධිය සම්බන්ධයෙන් ද කොමිසම තොරතුරු විමසීය. තවද, බන්ධනාගාර සහ රැඳවුම් මධ්‍යස්ථාන තුළ සිදුවන කලහකාරී තත්ත්වයන් පාලනය කිරීම සඳහා බන්ධනාගාර දෙපාර්තමේන්තුව ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ද කොමිසම විසින් තොරතුරු විමසන ලදී.

මෙම රැස්වීමේදී කොමසාරිස් ජනරාල්වරයා විසින් කොවිඩ් - 19 තත්ත්වය තුළ රැඳවුම් මධ්‍යස්ථානවල තත්ත්වය සහ වෛරසය ආසාදනය වූ රැඳවියන්ට ලබා දෙන ප්‍රතිකාර පිළිබඳව ගැටලුව යොමු කරන ලදී. රැඳවියන් පීසීආර් පරීක්ෂණයට ලක් කිරීමට ගෙන ඇති පියවර සහ පරීක්ෂාවට ලක් වූ රැඳවියන් හුදකලා කිරීමට ගෙන ඇති වැඩපිළිවෙළ කොමසාරිස්වරයා විස්තර කළේය. සියලුම සිරකරුවන් නිදහස් කරන්නේ පීසීආර් පරීක්ෂණයකින් පසුව සහ මහජන සෞඛ්‍ය පරීක්ෂක දැනුවත් කිරීමෙන් පසුව බවද කොමසාරිස්වරයා සඳහන් කළේය. අගුණුකොලපැලැස්ස බන්ධනාගාරයේ ඇති වූ සිද්ධියට හේතු වූ කරුණු ඔහු වැඩිදුරටත් විස්තර කළ අතර, ඔවුන් තත්ත්වය කළමනාකරණය කළ ආකාරය පිළිබඳවද විස්තර ඉදිරිපත් කළේය.

රැඳවියන්ට සනීපාරක්ෂක ද්‍රව්‍ය ලබාදීමට ගෙන ඇති පියවර සහ ඔවුන්ගේ ඥාතීන් සමඟ වීඩියෝ ඇමතුම් ලබා ගැනීමට ලබාදී ඇති පහසුකම් ද කොමසාරිස්වරයා විස්තර කළේය. කලහකාරී තත්ත්වයන් පාලනය කිරීමට ගෙන ඇති පියවර සහ අනතුරුදායක නොවන අවි භාවිත කළ හැකි හදිසි බළකායක් පිහිටුවීමේ ක්‍රියාවලිය පිළිබඳව ද බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා කරුණු ඉදිරිපත් කළේය. බන්ධනාගාර සහ රැඳවුම් මධ්‍යස්ථාන තුළ වධහිංසා පැමිණවීම් වැඩිවීම පිළිබඳවද මානව හිමිකම් කොමිසම අවධාරණය කළ අතර, ඊට ප්‍රතිචාර

වශයෙන් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා වධහිංසා පැමිණිවීම් සම්බන්ධයෙන් විමර්ශනය කිරීම සඳහා නිලධාරියෙකු පත් කිරීමට පොරොන්දු විය.

බන්ධනාගාරවල පිසිආර් පරීක්ෂණ වැඩි කිරීමට සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලෙස බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා කොමිසමෙන් ඉල්ලා සිටි අතර, වසංගත කාලය තුළ අනවශ්‍ය ලෙස සැකකරුවන් අත්අඩංගුවට ගැනීම වළක්වා ගැනීම සඳහා පොලිස්පතිවරයාට සහ අධිකරණ සේවා කොමිෂන් සභාවට නිර්දේශ කරන ලෙසද ඔහු ඉල්ලා සිටියේය.

2.6.2 ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වූ රැඳවියන් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2021.12.29 දින පොලිසිය සමඟ පැවැත්වූ රැස්වීම

ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ වන රැඳවියන් පිළිබඳව සාකච්ඡා කිරීම මෙම රැස්වීමේ අරමුණ විය. රැඳවියන් පිළිබඳව කළ විමසීමකදී ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ අධ්‍යක්ෂවරයා කොමිසමට දන්වා සිටියේ ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ නිලධාරීන් 3 දෙනෙකුගෙන් යුත් උපදේශක මණ්ඩලයක් පවතින බවත් රැඳවියන්ට තම ඉල්ලීම් උපදේශක කමිටුවට ලිඛිතව යොමු කළ හැකි බවත්ය. තවද, රැඳවුම් මධ්‍යස්ථාන සංඛ්‍යාව සහ අත්අඩංගුවේ සිටින රැඳවියන් පිළිබඳ තොරතුරු අධ්‍යක්ෂවරයා විසින් ලබා දෙන ලදී. ත්‍රස්ත විමර්ශන කොට්ඨාශය මගින් වාර්තා කර ඇත්තේ අත්අඩංගුවට ගැනීම් පමණක් මිස මුදා හැරීම් සහ ස්ථාන මාරුවීම් නොවන බව මානව හිමිකම් කොමිෂන් සභාව දැනුම් දුන්නේය. එම විස්තර ඉදිරියේදී ලබා දෙන බවට ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ අධ්‍යක්ෂවරයා පොරොන්දු විය. තවද, සභාපතිනිය රැඳවුම් මධ්‍යස්ථානවල ඇති පහසුකම් පිළිබඳව ද විමසා සිටි අතර, 2019 වසරට පෙර අධිකරණ නිලධාරීන් රැඳවුම් මධ්‍යස්ථාන වෙත පැමිණ ඇති බව ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ අධ්‍යක්ෂවරයා දන්වා සිටියේය.

විභාග වෙමින් පවතින නඩුවල රැඳවියන් සංඛ්‍යාව, අත්අඩංගුවේ සිටින රැඳවියන් සංඛ්‍යාව සහ සෑම වසරකම නිදහස් වූ / ඇප හිමිවූ / වරදකරුවන් වූ රැඳවියන් සංඛ්‍යාව පිළිබඳ තොරතුරු කොමිසමට දන්වන ලෙස කොමිෂන් සභාව දන්වා සිටියේය.

ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයේ අධ්‍යක්ෂවරයාගෙන් විමසා සිටියේ රාජ්‍ය නොවන සංවිධානවලින් කොමිසමට ලැබී ඇති බොහෝ සිද්ධීන් පිළිබඳව ඔවුන්ගෙන් ප්‍රශ්න කිරීමේදී ත්‍රස්ත විමර්ශන කොට්ඨාශයහි හිරිහැරවලට මුහුණ දීමට සිදුවී ඇති බවයි. ඊට ප්‍රතිචාර දක්වමින් අධ්‍යක්ෂවරයා ප්‍රකාශ කළේ විදේශ මාර්ග හරහා විශාල වශයෙන් විදේශ මුදල් ලැබෙන බැවින් ඒ පිළිබඳව සොයා බලන ලෙස මහ බැංකුවට උපදෙස් දුන් බවයි. තවද, ත්‍රස්තවාදය වැළැක්වීමේ පනත යටතේ අත්අඩංගුවට ගන්නා සැකකරුවන් විමර්ශනවලින් අනතුරුව පවතින සාක්ෂි මත නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කරන බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා ප්‍රකාශ කර ඇත. ඔහුට අනුව සාක්ෂි නොමැති විට සැකකරුවන් නිදහස් කර පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත යැවීමේ ගැසට් පත්‍රයක්

තිබෙන අතර, මෙම ගැසට් පත්‍රය සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩු දෙකක් විභාග වෙමින් පවතින අතර එය ක්‍රියාත්මක කිරීම නවතා දැමීමේ නියෝගයක් ද පවතින බව අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වැඩිදුරටත් දන්වා සිටියේය.

3 වන පරිච්ඡේදය

පර්යේෂණ හා අධීක්ෂණ

3.1 හැඳින්වීම

මෙම අංශයේ ප්‍රධාන වගකීම වන්නේ අවශ්‍ය ප්‍රතිපත්තිමය මැදිහත්වීම් සිදුකිරීමේදී කොමිසමට සහාය වීම සඳහා ශ්‍රී ලංකාවේ මානව හිමිකම් තත්ත්වය නිරීක්ෂණය කිරීමයි. 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 10 (c), 10 (d), 10 (e), 10 (f) සහ 10 (g) වගන්තිවලට අනුව මෙම තේමාව යටතේ ක්‍රියාකාරකම් සිදු කෙරේ.

3.2. ජාතික බන්ධනාගාර අධ්‍යයනය පිළිබඳ පසු විපරම

ජාතික බන්ධනාගාර අධ්‍යයනයේ සොයාගැනීම් සහ නිර්දේශ ශ්‍රී ලංකාවේ බන්ධනාගාර, දණ්ඩ නීති සහ විශෝධන ක්‍රම මෙන්ම පුළුල් අපරාධ යුක්ති විනිශ්චය පද්ධතිය පිළිබඳ අවබෝධයේ පවතින හිඩැස ආමන්ත්‍රණය කරන අතර, බන්ධනාගාර පද්ධතිය පිළිබඳ සාමාන්‍ය අවබෝධය වැඩි කරන අතරම එම රාමුවේ ඇති අඩුපාඩු ඉස්මතු කරයි. සිරකරුවන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ නිවැරදි කිරීමේ ක්‍රමය ශක්තිමත් කිරීම සඳහා වඩා හොඳ භාවිතයන් සහ ප්‍රතිපත්ති සැකසීමට සහ ක්‍රියාත්මක කිරීමට මේවා හේතු වනු ඇතැයි අපේක්ෂා කෙරේ. නිර්දේශ සමාලෝචනය කර ක්‍රියාත්මක කිරීම සඳහා අදාළ බලධාරීන් සමඟ සම්බන්ධීකරණය කිරීම සඳහා කොමිෂන් සභාව විසින් කේන්ද්‍රස්ථානය ස්ථාපිත කරන ලදී. අධිකරණ අමාත්‍යාංශයේ ලේකම්වරයා, බන්ධනාගාර පුනරුත්ථාපන අමාත්‍යාංශයේ ලේකම්වරයා සහ බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා සමඟ සමාලෝචන රැස්වීම් කිහිපයක් පැවැත්විණි. බන්ධනාගාර කාර්ය මණ්ඩලයේ ධාරිතා වර්ධනය පිළිබඳව මෙහිදී මානව හිමිකම් කොමිසම අවධාරණය කළේය. බන්ධනාගාර අධිකාරිය සිය පුහුණු විෂයමාලා සහ මොඩියුලය සමාලෝචනය සඳහා ඉදිරිපත් කළේය.

3.3 විශේෂ අධීක්ෂණය සහ මැදිහත්වීම්

3.3.1 "බුරවි" සුළි කුණාටුව හේතුවෙන් අවතැන් වූ ජනතාව

යාපනය දිස්ත්‍රික්කයට බලපෑ බුරවි සුළි කුණාටුව හේතුවෙන් විපතට පත් වූ ජනතාව පිළිබඳ නිරීක්ෂණ කටයුතු සඳහා මානව හිමිකම් කොමිසම පියවර ගෙන තිබේ. අධික ගිගුරුම් සහිත වැසි සහ ගංවතුර හේතුවෙන් ජනතාව අවතැන් වූ අතර, ඔවුන්ගේ නිවාසවලට හානි සිදුවී ඔවුන්ගේ ජීවනෝපායට බලපෑම් එල්ල විය. සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කිරීමේදී පැන නගින ස්වභාවික විපත් මගින් වැසියන්ට සිදුවන බලපෑම් අවම කිරීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් සහ ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයෙන් තොරතුරු ලබා ගැනීම සඳහා මානව හිමිකම් කොමිසමේ යාපනය ප්‍රාදේශීය කාර්යාලය පරීක්ෂණයක් පවත්වන ලදී. යාපනය දිස්ත්‍රික්කයේ “බුරවි” සුළි කුණාටුවෙන් ඇති වූ ගංවතුර තත්ත්වයෙන්

විපතට පත් වූ ජනතාව පිළිබඳව විමර්ශනවල දී අවධානය යොමු කර ඇත. විපතට පත් ජනතාව සමඟ එක්ව කටයුතු කිරීම සඳහා මෙම කර්තව්‍යයට සහයෝගය දක්වන ලෙස මානව හිමිකම් කොමිෂන් සභාවේ යාපනයේ ප්‍රාදේශීය කාර්යාලයෙන් ද ඉල්ලා සිටියේය.

3.3.2 වැවිලි ප්‍රජාවගේ අයිතිවාසිකම්

රත්නපුර දිස්ත්‍රික්කයේ හවුපේ වතුයායේ වතු පවුලක් ස්වකීය තාවකාලික නවාතැනෙන් බලහත්කාරයෙන් ඉවත් කර ඇති අතර, පසුව එය වැවිලි අධිකාරියේ උපදෙස් මත පොලිසිය විසින් කඩා ඉවත් කරන ලදී. ඉන් පසුව මෙම පවුල පොලිසිය භාරයේ තබා ගත් අතර, එවැනි ක්‍රියාමාර්ග තවදුරටත් වැළැක්වීම සඳහා කටයුතු කරන ලෙසත් ඒ පිළිබඳ ප්‍රගතිය වාර්තා කරන ලෙසත් රත්නපුර පොලිස් අධිකාරීවරයා වෙත දන්වන ලදි.

මධ්‍යම පළාත් සෞඛ්‍ය සේවා දෙපාර්තමේන්තුව මගින් දොළොස්බාගේ පැරණි රෝහල වසා දැමීම සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාව විමසීමක් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස මෙම ගැටලුවට මැදිහත් වී දොළොස්බාගේ පැරණි රෝහලේ ප්‍රතිලාභීන්ගේ සෞඛ්‍ය අයිතීන් තහවුරු කරන ලෙස මානව හිමිකම් කොමිෂන් සභාව සෞඛ්‍ය සේවා අධිකාරියට දන්වා සිටියේය.

නාය යෑමේ අවදානමක් සහිත ඩිජ්වින් දෙමළ පාසල පිහිටි ඉඩම නිරීක්ෂණය කිරීමට මානව හිමිකම් කොමිෂන් සභාව කටයුතු කර ඇත. ගුණාත්මක අධ්‍යාපනයේ ප්‍රවේශය සහ අධ්‍යාපනය ලබා ගැනීමේ හැකියාව උල්ලංඝණය වන සිද්ධියක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් සබරගමුව පළාතේ පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරයාට මැදිහත්වන ලෙස දන්වන ලදී.

3.3.3 සරණාගතයින්ගේ අයිතිවාසිකම්

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව විසින් රඳවාගෙන සිටින ඇෆ්ගනිස්තාන ජාතිකයින් දෙදෙනෙකු විදේශ ජාතික රැඳවුම් මධ්‍යස්ථානයේ රඳවා ගෙන සිටින තත්ත්වය පිළිබඳව සිවිල් සමාජය හරහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත පැමිණිලි කළහ. ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් වාර්තාවක් කැඳවා රඳවා තබා ගැනීමට හේතුව සහ රැඳවුම් තත්ත්වය පිළිබඳව පැහැදිලි කිරීමට මෙම පියවර ගෙන ඇත.

3.3.4 ළමා ගෘහ සේවය තුරන් කිරීම

කොළඹ ගෘහ සේවිකාවකගේ මරණයක් වාර්තා වූ අතර, පසුව ඇය වයස අවුරුදු 18 ට අඩු බව අනාවරණය විය. මෙම මරණය සම්බන්ධයෙන් මානව හිමිකම් කොමිෂන් සභාවේ දැඩි අවධානයට ලක් වූ අතර ළමා ගෘහ සේවිකාවන් සම්බන්ධයෙන් විශේෂ සාකච්ඡාවක් පැවැත්වීමට තීරණය කළේය. ශ්‍රී ලංකා ළමාරක්ෂක අධිකාරියේ හිටපු සභාපති මහාචාර්ය හරේන්ද්‍ර සිල්වා, ළමා මනෝ වෛද්‍ය වෛද්‍ය දුලංගි දහනායක, මානව හිමිකම් පිළිබඳ නිවහනේ විධායක අධ්‍යක්ෂ ජීවන් ත්‍යාගරාජා යන මහත්ම මහත්මීන් සමඟ කොමිසම විශේෂ සාකච්ඡාවක් පැවැත්වීය. සාකච්ඡාවේ අරමුණ වූයේ මානව හිමිකම් කොමිසමේ මැදිහත්වීම වඩා අවශ්‍ය වන අංශ සොයා ගැනීමයි.

3.4 රැඳවුම් ස්ථාන සහ රැකවරණ නිවාස නිරීක්ෂණය කිරීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, එහි ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල ජාලය හරහා 2021 වර්ෂයේදී පොලිස් ස්ථාන 473ක් පරීක්ෂාවට ලක් කෙරිණ. මෙම පරීක්ෂාවන්හි අරමුණ වූයේ කාර්යක්ෂම ක්‍රියාශීලී සහ ප්‍රතික්‍රියාශීලී පියවර හරහා ශ්‍රී ලංකාව තුළ වධහිංසා පැමිණවීම් සහ වෙනත් ආකාරයේ භාරකාරත්වය උල්ලංඝණය කිරීම් වැළැක්වීමත්, එවැනි උල්ලංඝණයන් සිදු කරන නිලධාරීන් හඳුනා ගැනීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග නිර්දේශ කිරීමත් ය. වධහිංසා පැමිණවීම් සහ අනෙකුත් මානව හිමිකම් උල්ලංඝණය කිරීම් වැළැක්වීම සඳහා මානව හිමිකම් කොමිෂන් සභාව අනෙකුත් අදාළ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන සමඟ ද සම්බන්ධීකරණය කරයි. මේ අනුව, වධහිංසා පැමිණවීම්, නීතිවිරෝධී අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් ආදිය පිළිබඳ පැමිණිලි භාරගැනීම සඳහා පැය විසිහතර පුරා ක්ෂණික ඇමතුම් පහසුකම සපයා ඇත. කොමිෂන් සභාව අනපේක්ෂිත හදිසි චාරිකා සහ විමර්ශන සිදු කරන විට, එම ස්ථානයේ දැනට පවතින නඩු පිළිබඳ ද පසු විපරම් කිරීමට අදාළ නිලධාරියා සහභාගී වේ.

මෙම සංචාරයන්හිදී පොදු ගැටලු කිහිපයක් හඳුනා ගන්නා ලදී

- රැඳවුම් ස්ථානවල අත්අඩංගුවට ගැනීම් පිළිබඳ නඩු නිසි ලෙස සටහන් කර නොගැනීම
- අධික තදබදය සහ සිර මැදිරි තුළ මූලික පහසුකම් නොමැතිකම
- අත්අඩංගුවට ගැනීමේදී නියමිත ක්‍රියාපටිපාටිය අනුගමනය නොකිරීම
- සැකකරුවන් විශාල සංඛ්‍යාවක් සැකපිට අත්අඩංගුවේ පසුවන නමුත් රැඳවියන් සැක සහිත වරදක්/අපරාධයක් කළ බව පැහැදිලි කිරීමට පොලිස් නිලධාරීන්ට හැකියාවක් නොමැතිවීම.

වධහිංසා පැමිණවීම, අයහපත් ලෙස සැලකීම සහ රඳවා තබා ගැනීමේ කොන්දේසි ආමන්ත්‍රණය කිරීමේ ප්‍රතිපත්තිමය මැදිහත්වීම්වලදී මානව හිමිකම් කොමිෂන් සභාව මෙම නිරීක්ෂණ යළි යළිත් ඉස්මතු කරයි.

තවද, කොමිෂන් සභාව අනෙකුත් රැඳවුම් ස්ථාන සහ රැකවරණ නිවාස වෙත නිරීක්ෂණ චාරිකා **56**ක් සිදු කළේය. සාමාන්‍යයෙන්, මෙම චාරිකා බොහෝ දුරට ප්‍රාදේශීය කාර්යාල හරහා සිදු කෙරේ. රැඳවියන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීම සඳහා රැඳවුම් ස්ථාන නිරීක්ෂණය කිරීමට කොමිෂන් සභාවට පැවරී ඇති වරම අනුව ප්‍රාදේශීය සහ උප කාර්යාලවල අධීක්ෂණ කටයුතු ඉතා වැදගත් වේ. කෙසේ වෙතත්, නැවතත්, කෝවිඩ්-**19** වසංගතය හේතුවෙන් සේවක හිඟයේ ප්‍රතිඵලයක් ලෙස, **2021** වර්ෂයේදී පරීක්ෂාවන්ගෙන් බහුතරයක් **(153)** සිදු කරන ලද්දේ ප්‍රධාන කාර්යාලයෙනි.

කෝවිඩ්-**19** වසංගතයේ ප්‍රතිඵලයක් ලෙස සේවක හිඟය හේතුවෙන් පසුගිය වසරවලට වඩා අඩුවෙන් නිරීක්ෂණ චාරිකා සිදු ඇති බව පෙනේ. වධහිංසා පැමිණවීම් වැළැක්වීමට සහ රැඳවුම් ස්ථානවල තත්ත්වය වැඩිදියුණු කිරීමට කොමිෂන් සභාව සාර්ථක මැදිහත්වීම් සිදු කළේය. ඒ අනුව, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව රැඳවුම් ස්ථානවල කොන්දේසි සම්බන්ධයෙන් රැස්වීම් ගණනාවක් පවත්වන ලදී:

සිරකරුවන් රඳවා තබා ගැනීමේ කොන්දේසි, වධහිංසා පැමිණවීම් සහ සිරකරුවන් අතර කෝවිඩ්-19 වසංගතය කළමනාකරණය කිරීම, ඔවුන්ගේ යහපැවැත්ම සහ කෝවිඩ්-19 වසංගතය තුළ ඔවුන්ගේ පවුලේ අය සමඟ සන්නිවේදනය කිරීම සම්බන්ධයෙන් බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා සමඟ රැස්වීමක් පැවැත්විණි. මානව හිමිකම් කොමිෂන් සභාව සහ බන්ධනාගාර දෙපාර්තමේන්තුව අතර සන්නිවේදනය කඩිනම් කිරීම සඳහා කේන්ද්‍රස්ථානයක් ස්ථාපිත කිරීම පිළිබඳව ද සාකච්ඡා කෙරිණි.

	භාර්යා කාර්යාලය	අම්පාර	අනුරාධපුර	බදුල්ල	මඩකලපුව	යාපනය සහ	මහනුවර	කුරුණෑගල	මාතර	නීතිඥ මණ්ඩලය	ඩඹුල්ලාව සහ	එකතුව
පොලිස් ස්ථාන	141	31	71	81	20	17	28	26	15	19	24	473
බන්ධනාගාර	05	02	-	06	03	-	04	02	06	02	02	32
ළමා සුරැකුම්/ළමා නිවාස	-	-	01	-	-	-	01	02	1	-	-	05
විදේශ සංක්‍රමණික රැඳවුම් මධ්‍යස්ථාන	-	02	-	-	-	-	-	-	-	-	-	02
ගැසට් කරන ලද රැඳවුම් මධ්‍යස්ථාන	-	-	-	-	-	-	-	-	-	-	-	-
පුනරුත්ථාපන මධ්‍යස්ථාන	01	-	-	-	-	-	-	-	-	-	-	01
කාන්තා නිවාස	-	-	-	-	-	-	-	-	-	-	-	-
ආබාධිත පුද්ගලයින්ගේ නිවාස	-	-	-	-	-	-	-	-	-	-	-	-
වැඩිහිටි නිවාස	-	02	-	-	-	-	01	-	-	-	-	03
අවිකොා/ත්‍රිවිකොා	04	-	-	-	-	-	-	-	-	-	1	05
අනෙකුත් ස්ථාන	02	-		-	-	06	-	-	-	-	-	08
එකතුව	153	37	72	87	23	23	34	30	22	21	27	529

3.4.1 රැඳවුම් නියෝග ලියාපදිංචි කිරීම

1979 අංක 48 දරන ත්‍රස්තවාදය වැලැක්වීමේ (තාවකාලික විධිවිධාන) පනත යටතේ හෝ මහජන ආරක්ෂක ආඥාපනත (පරිච්ඡේදය 10) යටතේ ස්ථාපිත රෙගුලාසියක් යටතේ පුද්ගලයෙකු අත්අඩංගුවට ගෙන හෝ රඳවා තබාගෙන සිටින විටක ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 28 වැනි වගන්තිය අනුව එවැනි අත්අඩංගුවට ගැනීමක් හෝ රඳවා තබා ගැනීමක් සිදු කරන පුද්ගලයාගේ රාජකාරිය වන්නේ, එවැනි අත්අඩංගුවට ගැනීමක් හෝ රඳවා තබා ගැනීමක් සහ එසේ අත්අඩංගුවේ පසුවන හෝ රඳවා තබාගෙන සිටින තැනැත්තෙකු නිදහස් කරන විට හෝ වෙනත් රැඳවුම් ස්ථානයකට මාරු කරන විට ඒ පිළිබඳව කොමිෂන් සභාව වෙත දැනුම් දීමයි. කොමිෂන් සභාව 2021 වසරේදී රැඳවුම් නියෝග සඳහා ලේඛනයක් පවත්වාගෙන යයි. ත්‍රස්තවාදය වැළක්වීමේ පනත යටතේ වූ අත් අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් 92ක් පිළිබඳ සිදුවීම කොමිෂන් සභාව වෙත දැනුම් දී තිබේ.

3.5 කෝවිඩ්-19 එන්නත් සඳහා ප්‍රමුඛතාවය ලබා දීම

එන්නත් සඳහා ඇති ඉහළ ඉල්ලුම සහ එන්නත් මධ්‍යස්ථාන අවට රැස්ව සිටින ජනකාය සැලකිල්ලට ගනිමින් කෝවිඩ්-19 එන්නත් සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් 2021.05.28 දින සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල් වෙත උපදෙස් නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් නිකුත් කරන ලද උපදෙස් වලට අනුව කොවිඩ් පාලන ක්‍රියාවලියේ පෙරමුණේ සිටින සෞඛ්‍ය සේවකයින් සහ ඔවුන්ගේ රාජකාරී ඉටු කිරීමේදී ආසාදිත පුද්ගලයින් සමඟ සෘජුව සම්බන්ධ වන අනෙකුත් පුද්ගලයින් සහ අවදානමට ලක්විය හැකි පුද්ගලයින් සඳහා (වයස හෝ සෞඛ්‍ය තත්වයන් හේතුවෙන්) ප්‍රමුඛතාවය ලැබිය යුතුය.

3.6 නිරෝධායන නීති උල්ලංඝණය කරන පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම පිළිබඳ මාර්ගෝපදේශ

නිරෝධායන නීති, රෙගුලාසි සහ නීතිරීති යටතේ පුද්ගලයින් අත්අඩංගුවට ගැනීම සැළකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ජනතාවගේ මූලික සිවිල් අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා මාර්ගෝපදේශ සකස් කර ඇති අතර, එම මාර්ගෝපදේශ පොලිස්පතිවරයා වෙත නිකුත් කරන ලදී. මේ අනුව, ශ්‍රී ලංකාවේ සියලුම පොලිස් ස්ථාන වෙත මාර්ගෝපදේශ බෙදා හැරීමට කොළඹ පොලිස් මූලස්ථානය කටයුතු කර තිබූ අතර, ඒ අනුව පොලිස් ස්ථාන අවශ්‍ය පියවර ගෙන ඇත.

3.7 කෝවිඩ්-19 වසංගතයෙන් සිරකරුවන් ආරක්ෂා කිරීම පිළිබඳ නිර්දේශ

බන්ධනාගාරවල පීසීආර් පරීක්ෂණ වැඩි කිරීම සඳහා සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්වරයාට නිර්දේශ කරන ලෙස බන්ධනාගාර කොමසාරිස් ජනරාල්වරයා විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත ඉල්ලීමක් කර ඇති අතර, වසංගත කාලසීමාව තුළ අනවශ්‍ය ලෙස සැකකරුවන් අත්අඩංගුවට ගැනීම වළක්වන මෙන් උපදෙස් දෙන ලෙස පොලිස්පතිවරයාට සහ අධිකරණ සේවා කොමිෂන් සභාවට නිර්දේශ කරන ලෙස ඉල්ලීමක් කර තිබීම විශේෂත්වයකි.

4 වන පරිච්ඡේදය

අධ්‍යාපනය සහ බාහිර කටයුතු

4.1 හැඳින්වීම

මානව හිමිකම් කොමිෂන් සභාවේ පැවැත්මේ පරමාර්ථය පුරවැසියාගේ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම බැවින්, කොමිෂන් සභාව, මහජනතාව සිය කාර්යයේ අනිවාර්ය අංගයක් ලෙස සලකයි. කෝවිඩ්-19 වසංගත තත්ත්වය මධ්‍යයේ වුවද, 2021 වර්ෂය තුළ එහි අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා වැදගත් කාර්යයන් රාශියක් සංවිධානය කර පවත්වා ඇත.

4.2. ජාත්‍යන්තර දින සැමරුම්

4.2.1 වධහිංසාවට ලක්වූවන්ට සහාය පළකිරීමේ ජාත්‍යන්තර දිනය

වධහිංසාවට ලක්වූවන්ට සහාය පළකිරීමේ ජාත්‍යන්තර දිනය නිමිත්තෙන් කොමිෂන් සභාවේ සභාපතිවරයා විශේෂ ප්‍රකාශයක් කළේය. මානව හිමිකම් කොමිෂන් සභාව විසින් රට පුරා වධහිංසා පැමිණවීම් සහ අයහපත් සැලකීම් සැලකිය යුතු සංඛ්‍යාවක් නිරීක්ෂණය කළ බව ඔහු පෙන්වා දුන්නේය. එබැවින්, ශ්‍රී ලංකාවෙන් වධහිංසාව තුරන් කිරීම සඳහා වූ ද්විපාර්ශ්වික ප්‍රවේශය සහිත කොමිෂන් සභාව, වධහිංසාවට ලක්වූවන් ආරක්ෂා කිරීමට සහ වධහිංසා හෝ කුරිරු, අමානුෂික හෝ අවමන් කිරීම වැළැක්වීමේ යාන්ත්‍රණය ශක්තිමත් කිරීම සඳහා විමර්ශනය කිරීම සහ ස්ථිර ක්‍රියාමාර්ග ගැනීම සඳහා ශූන්‍ය ඉවසීමේ ප්‍රතිපත්තියක් පවත්වාගෙන යයි. “වධහිංසාවට තිත” යන තේමාව යටතේ කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාල දහයක් හරහා දීපව්‍යාප්ත වධහිංසා විරෝධී ව්‍යාපාරයක් කොමිෂන් සභාව දැනටමත් දියත් කර ඇත. වධහිංසා පැමිණවීම සහ අමානුෂික ලෙස සැළකීම පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම මෙම ව්‍යාපාරය මගින් සිදු කෙරෙන අතර එමගින් වධහිංසා වැළැක්වීමේ කටයුතු සඳහා ජනතා සහභාගීත්වය ලබා ගැනීමටත්, ජනතාවගේ අනිවාර්ය හැසිරීම් රටාව සඳහා නිසි මග පෙන්වීමක් ලබාදීමටත් කොමිෂන් සභාව අපේක්ෂා කරයි. තවද, කිසිදු ව්‍යතිරේකයකින් තොරව සෑම තරාතිරමකම වධහිංසා පැමිණවීම් සහ අයහපත් සැලකීම් වැළැක්වීමට සහ වධහිංසාවට සහ වෙනත් ප්‍රචණ්ඩත්වයන්ට ගොදුරු වූ සියලු දෙනා ආරක්ෂා කිරීමට ඵලදායී පියවර ගන්නා ලෙස ඔහු අදාළ සියලු බලධාරීන්ගෙන් ඉල්ලා සිටියේය.

වධහිංසාව නැවැත්වීම පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන්

“වධහිංසාවට තිත; මානව හිමිකම් දැක්ම” යන තේමාව යටතේ පොලිස් විද්‍යායතනය හා ඒකාබද්ධව දිවයිනේ විවිධ ප්‍රදේශවල පොලිස් නිලධාරීන් සඳහා මෙම වැඩසටහන මාර්ගගත ලෙස පවත්වන ලදී. තවද, මෙම අවස්ථාව සනිටුහන් කිරීමට අදාළ රූපවාහිනී සාකච්ඡාවක් ද යාපනයේ ඩෑන් රූපවාහිනිය නාලිකාව (*DAN TV*) ඔස්සේ පවත්වන ලදී

4.2.2 ජාත්‍යන්තර කාන්තා දිනය

කාන්තා හා ස්ත්‍රී පුරුෂ සමාජ සමානාත්මතාවයට කෝවිඩ්-19 වසංගතයේ බලපෑම කෙරෙහි අවධානය යොමු කරමින් කොමිෂන් සභාව විසින් ජාත්‍යන්තර කාන්තා දිනය සමරන ලදී. මහජන සෞඛ්‍යයට, අධ්‍යාපනයට, සමාජ ජීවිතයට සහ රැකියා වෙළඳපොළට විශාල තර්ජනයක් එල්ල කිරීම වැනි කෝවිඩ්-19 වසංගතයේ අහිතකර ප්‍රතිවිපාක සැලකිල්ලට ගනිමින් සමාජය තුළ කාන්තා දුක්ගැනවිලි උග්‍ර කරන වසංගතය හේතුවෙන් ගැඹුරු වන සමාජ අසමානතාවය කෙරෙහි අවධානය යොමු කිරීම, මෙම වසරේ කාන්තා දිනය සැමරීම වෙනුවෙන් මෙම තේමාව තෝරා ගැනීමේ ප්‍රධාන අරමුණ විය. මෙම අවස්ථාවට ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වූ ශ්‍රී ලංකාවේ නෝර්වේ රාජ්‍යයේ තානාපතිනි අතිගරු ට්‍රයින් ජොරාන්ලි එස්කෙඩල් මහත්මිය, ප්‍රධාන දේශනය පැවැත්වූයේ ලෝකයේ කාන්තා අයිතිවාසිකම්වල ප්‍රගතිය ආපසු හැරවීමට වසංගතය බලපා ඇති ආකාරයයි. ඇය මෙලින්ඩා ගේට්ස්ගේ *"හඬක් ඇති කාන්තාවක් යනු නිර්වචනයට අනුව ශක්තිමත් ගැහැනියකි"* යන උධෘතය උපුටා දැක්වීය. ''නමුත් එම හඬ සෙවීම ඉතා අසීරු විය හැකියි." 2021 වර්ෂයේදී ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීමට සහ කාන්තා අයිතිවාසිකම් වෙනුවෙන් හඬක් නැගීමට රාජකීය නෝර්වීජියානු තානාපති කාර්යාලයට කොමිෂන් සභාව සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට හැකි වීම පිළිබඳ ආඩම්බර වන බව තනාපතිනිය පැවසුවාය. මෙම උත්සවය විද්වත් ඉදිරිපත් කිරීම් සහ සංවාද වලින් සමන්විත වූ අතර සංවාද මණ්ඩපය යුරෝපා සංගමයේ දේශපාලන, වෙළඳ සහ සන්නිවේදන අංශයේ ශ්‍රී ලංකා දූත මණ්ඩල ප්‍රධානී තෝර්ස්ටන් බාග්ප්රෙඩී මහතාගේ ප්‍රධානත්වයෙන් පැවැත්විණි.

4.2.3 ජාත්‍යන්තර මානව හිමිකම් දිනය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2021 ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සැමරීම සඳහා "සියල්ලෝම මිනිසුන්ය" යන තේමාව යටතේ විද්‍යුත් මාධ්‍ය සහාය ඇතිව මාධ්‍ය සාකච්ඡා ගණනාවක් සංවිධානය කළේය. මානව හිමිකම් පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීමේදී විද්‍යුත් මාධ්‍ය ප්‍රබල මාධ්‍යයක් බව කොමිෂන් සභාව පිළිගනී. ඒ අනුව ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සනිටුහන් කරමින් රූපවාහිනී නාලිකා හයක සහ ගුවන්විදුලි විකාශන සේවාවන් ගණනාවක මානව හිමිකම් පිළිබඳ වැඩසටහන් ගණනාවක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන්ගේ සහ නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් පැවැත්විණ. ජාත්‍යන්තර මානව හිමිකම් දිනය සැමරීම සඳහා ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රාදේශීය මධ්‍යස්ථාන ද උත්සව සංවිධානය කළේය. (පවත්වන ලද මාධ්‍ය වැඩසටහන් පිළිබඳ විස්තර පහත වගුවේ දැක්වේ.)

දිනය	වැඩසටහන	සම්පත්දායකයින්
2021.12.06	සියත රූපවාහිනී - පියුම්විල	වෛද්‍ය නිමල් කරුණාසිරි- කොමසාරිස්, නිහාල් චන්ද්‍රසිරි මහතා, අධ්‍යක්ෂ - පර්යේෂණ සහ අධීක්ෂණ
2021.12.06	ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව - ස්වදේශීය සේවය	වෛද්‍ය නිමල් කරුණාසිරි - කොමසාරිස්

2021.12.09	ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව - දෙමළ	කපිලන් විල්ලවරාජන් - නීති නිලධාරී
2021.12.10	ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාව- ස්වදේශීය සේවය- සඳලිය සෙවන	මේනකා හේරත් මිය, අධ්‍යක්ෂ - අධ්‍යාපන හා විශේෂ වැඩසටහන්, සුලාරි ලියනගම මිය, අධ්‍යක්ෂ - විමර්ශන හා පරීක්ෂණ
2021.12.10	සවෙල් නේත්‍රා ටීවී	කපිලන් විල්ලවරාජන් මහතා, නීති නිලධාරී
2021.12.10	දෙරණ ටීවී - බිග් ෆෝකස්	වෛද්‍ය නිමල් කරුණාසිරි, කොමසාරිස් සුමනලාල් වීරසිංහ මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ -පරීක්ෂණ හා විමර්ශන
2021.12.10	ජාතික රූපවාහිනිය	වෛද්‍ය නිමල් කරුණාසිරි, කොමසාරිස් සුමනලාල් වීරසිංහ මහතා, නියෝජ්‍ය අධ්‍යක්ෂ -පරීක්ෂණ හා විමර්ශන

මානව හිමිකම් දිනය සැමරීම වෙනුවෙන් මානව හිමිකම් කොමිසමේ ප්‍රාදේශීය කාර්යාල විසින් සංවිධානය කරන ලද මාධ්‍ය වැඩසටහන් පහත පරිදි වේ.

දිනය	ප්‍රාදේශීය කාර්යාලය	වැඩසටහන
2021.12.10	මඩකලපුව	ජාත්‍යන්තර මානව හිමිකම් දිනය - 2021 ඩෑන් රූපවාහිනියේ රූපවාහිනී වැඩසටහන
2021.12.09	ත්‍රිකුණාමලය	සාමාන්‍ය ජනතාව සඳහා ජාත්‍යන්තර මානව හිමිකම් දිනය වෙනුවෙන් වෙබ් සම්මන්ත්‍රණ දෙකක්
2021.12.10	මාතර	ශ්‍රී ලංකා ගුවන්විදුලි සංස්ථාවේ රුහුණු එෆ් එම් නාලිකාවේ ජාත්‍යන්තර මානව හිමිකම් දිනය
2021.12.06 සිට 2021.12.10 දක්වා	යාපනය	"මානව හිමිකම් කොමිෂන් සභාවේ උතුරු කාර්යාලයේ සේවාවන් ලබා ගන්නේ කෙසේද" යන්න පිළිබඳ තත්පර තිස් දෙකක දැන්වීමක් ඩෑන් රූපවාහිනී ජාලය ඔස්සේ විකාශය විය.
2021.12.10	අනුරාධපුරය	අනුරාධපුර දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය සභා කාන්තා නියෝජිතයින් සඳහා පවත්වන ලද වෙබ් සම්මන්ත්‍රණය
2021.12.10	මහනුවර	ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවේ කඳුරට සේවයේ ජාත්‍යන්තර මානව හිමිකම් දිනය

2021.12.09 2021.12.10	කල්මුනේ	කල්මුණේ දාරුසබා රූපවාහිනියේ ජාත්‍යන්තර මානව හිමිකම් දින වැඩසටහන සහ ජාත්‍යන්තර මානව හිමිකම් දින සූම් තාක්ෂණය ඔස්සේ පැවැත්වූ රැස්වීම

4.3 මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන්

කොමිෂන් සභාව විසින් ජාතික හා ප්‍රාදේශීය මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් කිහිපයක් ද පවත්වන ලදී.

4.3.1 දැනුවත් කිරීමේ වැඩසටහන්

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය සහ වවුනියාව ප්‍රාදේශීය කාර්යාලය එක්ව **2021** දෙසැම්බර් මස **14** සහ **15** යන දිනයන්හිදී මන්නාරම සහ යාපනය දිස්ත්‍රික්කවල නාවික නිලධාරීන් දැනුවත් කිරීමේ වැඩසටහනක් සංවිධානය කරන ලදී**.** මෙම වැඩසටහනට අරමුදල් සපයන ලද්දේ එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ ආයතනය විසිනි**.** මෙම වැඩසටහන් සඳහා නාවික නිලධාරීන් හා සෙසු නිලයන් **100** ක් පමණ සහභාගී වූහ**.** මෙම වැඩසටහන්වල ප්‍රධාන අරමුණ වූයේ මානව හිමිකම් දෘෂ්ටිකෝණයෙන් තම රාජකාරිය ඉටු කිරීම පිළිබඳව නාවික හමුදා නිලධාරීන් දැනුවත් කිරීමයි**.**

4.4 අනෙකුත් රාජ්‍ය ආයතන/වැඩසටහන් සමඟ දැනුම බෙදා ගැනීම

කොමිෂන් සභාව, එහි ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල හරහා, රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන විසින් පවත්වනු ලබන වැඩසටහන් සඳහා සම්පත් දායකයින් සැපයීමෙන් ද සිය සහාය ලබා දෙයි. කොමිෂන් සභාවට අදාළව අනෙකුත් රාජ්‍ය ආයතන විසින් කැඳවන ලද සාකච්ඡා සඳහා කොමිෂන් සභාව සක්‍රීයව දායක විය. 2021 වර්ෂය තුළ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල මගින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව, සේවා ස්ථානයේ ලිංගික හිංසනය, සුළුතර අයිතිවාසිකම්, කාන්තා හා ළමා අයිතිවාසිකම්, ළමා ආරක්ෂාව වැනි උනන්දුවක් දක්වන මාතෘකා පිළිබඳ දේශන පැවැත්වූ අතර, සාකච්ඡා සඳහා සහභාගී විය. එසේම, ස්ත්‍රී පුරුෂ සමාජභාවය පදනම් කරගත් ප්‍රචණ්ඩත්වය, ශ්‍රී ලංකා යුධ, නාවික සහ ගුවන් හමුදා නිලධාරීන්, පොලිස් නිලධාරීන් සහ තවත් ප්‍රජා කණ්ඩායම් කිහිපයක් මුහුණ දෙන මානව හිමිකම්, මූලික අයිතිවාසිකම් සහ මානව හිමිකම් ගැටලු පිළිබඳව මාධ්‍යවේදීන්ට අවබෝධයක් තිබීමේ වැදගත්කම යන විෂයයන් පිළිබඳව පවත්වන ලද සාකච්ඡාවන්ට ද කොමිෂන් සභාවේ දායකත්වය ලබා දුනි. අදාළ ක්‍රියාකාරකම් පිළිබඳ විස්තර පහත වගු වල දක්වා ඇත.

2021 දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි ප්‍රධාන කාර්යාලය මගින් පවත්වන ලද මුළු මානව හිමිකම් පිළිබඳ දැනුවත් කිරීම් සහ පුහුණු වැඩසටහන්

	ප්‍රධාන කාර්යාලය
පුහුණු කිරීම්	06
දේශන සභාය	05
රැස්වීම්/වැඩමුළු	07
මාර්ගගත සම්මන්ත්‍රණ	01

2021 දී ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි ප්‍රාදේශීය කාර්යාල මගින් සපයනු ලබන දේශන සඳහා මානව හිමිකම් සම්පත් සභාය

	ඉලක්ක කණ්ඩායම්			
ප්‍රධාන කාර්යාලය/ ප්‍රාදේශීය කාර්යාල	සන්නද්ධ හමුදා / පොලීසිය	රාජ්‍ය නිලධාරීන්	ශිෂ්‍යයින් / තරුණ කණ්ඩායම්	පොදු මහජනතාව/සිවිල් සමාජය/ආගමික නායකයින්/ ජනමාධ්‍යවේදීන්/වෙනත්
අම්පාර	01	--	--	--
අනුරාධපුරය	07	--	01	07
බදුල්ල	04	--	03	--
මඩකලපුව	--	01	03	01
යාපනය/කිලිනොච්චිය	01	02	02	02
කල්මුනේ	--	02	--	05
මාතර	01	--	--	04
ත්‍රිකුණාමලය	--	--	01	01

4.5 මාධ්‍ය සමඟ සම්බන්ධ වීම

කොමිෂන් සභාවේ ක්‍රියාකාරකම් පිළිබඳව මෙන්ම තීරණාත්මක කරුණු පිළිබඳව මහජනතාව දැනුවත් කිරීම සඳහා මාධ්‍ය සමඟ සම්බන්ධ වීමට කොමිෂන් සභාව ප්‍රමුඛත්වය ලබා දෙයි. කොමිෂන් සභාව ප්‍රවර්ධන කටයුතු සඳහා සම්ප්‍රදායික මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය මෙන්ම මාර්ගගත ක්‍රමවේදයන් භාවිතා කරයි.

4.5.1. වෙබ් අඩවිය සහ ක්ෂණික ඇමතුම් සේවාව භාවිතා කිරීම

කොමිෂන් සභාවේ ප්‍රතිපත්ති නිර්දේශ, මැදිහත්වීම් සහ උපදේශන ප්‍රකාශයන් මෙන්ම කොමිෂන් සභාවේ නියෝග ද කොමිෂන් සභාවේ වෙබ් අඩවියට ඇතුළත් කර මහජනතාවගේ ප්‍රවේශය සඳහා ලබා දී ඇත. කොමිෂන් සභාවේ වෙබ් අඩවිය නිතිපතා යාවත්කාලීන වන බැවින් මානව හිමිකම් කොමිෂන් සභාව පිළිබඳ යාවත්කාලීන තොරතුරු සඳහා මෙය විශ්වාසදායක මූලාශ්‍රයකි. කොවිඩ්-19 වසංගත පරිසරය යටතේ එය තවදුරටත් පුළුල් වූ අතර, කිසිදු අපහසුවකින් තොරව කොමිෂන් සභාව සමඟ අන්තර් ක්‍රියා කිරීමට අවස්ථාවක් ලබා දුන්නේය. පැය 24 පුරා ක්‍රියාත්මක වන ක්ෂණික ඇමතුම් සේවාවක් මගින් මහජනතාවට මානව හිමිකම් උල්ලංඝණය සම්බන්ධයෙන් වන හදිසි අවස්ථාවන් සඳහා කොමිෂන් සභාව සම්බන්ධ කර ගැනීමට පහසුකමක් සපයනු ලබන අතර, එහිදී අදාළ බලධාරීන් අමතා අත්අඩංගුවට ගැනීම් සහ රඳවා තබා ගැනීම් සම්බන්ධයෙන් ක්ෂණික ක්‍රියාමාර්ග ගැනීමට විමර්ශන නිලධාරීන් මහජනතාවට සහාය වේ.

4.6 සිවිල් සමාජය සමඟ සම්බන්ධ වීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව එහි ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල ජාලය හරහා සිවිල් සමාජ සංවිධාන සමඟ නිතිපතා සම්බන්ධ වේ. පුරවැසියන්ගේ නියෝජිතයන් ලෙස සිවිල් සමාජ, මහජනතාව සහ මානව හිමිකම් කොමිෂන් සභාව අතර දෘශ්‍යමාන පාලමක් ගොඩ නගා මහජනතාවගේ මානව හිමිකම් කෙරෙහි කොමිෂන් සභාව අවධානය යොමු කරන අතර, කොමිෂන් සභාව මානව හිමිකම් පිළිබඳ සිවිල් සමාජයේ කටයුතු සඳහා දායක වේ. අලුතින් පත් වූ කොමසාරිස්වරු 2021 මාර්තු සහ අප්‍රේල් මාසවල ප්‍රාදේශීය කාර්යාල සහ උප කාර්යාල මගින් සංවිධානය කරන ලද රැස්වීම් මාලාවකදී උතුරු හා නැඟෙනහිර පළාත්වලට ගොස් ප්‍රාදේශීය මට්ටමේ සිවිල් සංවිධාන හමුවූහ. සිවිල් සමාජ නියෝජිතයින් විසින් මතු කරන ලද ගැටලු උතුරු සහ නැගෙනහිර පළාත්වල රාජ්‍ය ආයතන ප්‍රධානීන්ගේ අවධානයට යොමු කරනු ලැබුවේ ඔවුන් සමඟ කළ සාකච්ඡා තුළින් ගැටලුවලට විසඳුම් සෙවීමේ අරමුණිනි.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ජාතික මට්ටමේ සිවිල් සමාජ සංවිධාන සමඟ කුඩා කණ්ඩායම් රැස්වීමක් කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේදී පැවැත්වීය. මෙම රැස්වීමේ අරමුණ වූයේ වත්මන් මානව හිමිකම් ගැටලු සහ සිවිල් සමාජ සංවිධාන විසින් ඒවාට හඳුනාගෙන ඇති විසඳුම් පිළිබඳව සාකච්ඡා කිරීමයි. කෝවිඩ්-19 සීමා කිරීම් හේතුවෙන් තෝරාගත් සිවිල් සමාජ සංවිධානවලට ආරාධනා කිරීමට කොමිෂන් සභාවට සිදු විය. මෙම රැස්වීමට සහභාගී වූවන් අතර ආචාර්ය ජෙහාන් පෙරේරා, ජාතික සාම මණ්ඩලය, නීතිඥ

ලක්ෂාන් ඩයස් මහතා, පිලිජ් දිසානායක මහතා, Rights to Life, චමිලා තුෂාරි, දාබිදු සාමූහිකය, ප්‍රබෝධ රත්නායක මහතා, Rights Now, රනිතා ඥානරාජා මෙනවිය, මානව හිමිකම් සංවර්ධන මධ්‍යස්ථානය සහ ගරු. මහේන්ද්‍ර ගුණතිලක පියතුමා, කරිටාස් ශ්‍රී ලංකා – සෙඩෙක් ආයතනය විය.

4.6.1 ප්‍රාදේශීය සිවිල් සමාජ සම්බන්ධීකරණ කමිටු

මානව හිමිකම් කොමිෂන් සභාව විසින් ප්‍රාදේශීය කාර්යාල ජාලය හරහා පිහිටුවන ලද ප්‍රාදේශීය මට්ටමේ සම්බන්ධීකරණ කමිටු ඒ ඒ ප්‍රදේශවල සිදුවන මානව හිමිකම් කඩවීම් හඳුනා ගැනීමට සහ කොමිෂන් සභාවේ මැදිහත්වීමේ අවශ්‍යතාව හඳුනා ගැනීමට කොමිෂන් සභාවට සහාය වේ. අනෙක් අතට විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවල ප්‍රධානීන්ගේ සැලකිල්ල මෙම සම්බන්ධීකරණ කමිටු හරහා ආකර්ෂණය කර ගැනීමට හැකි විය. මෙම සම්බන්ධීකරණ කමිටු, ප්‍රාදේශීය වශයෙන් මානව හිමිකම් ආරක්ෂා කිරීම අධීක්ෂණය කිරීමේදී කොමිෂන් සභාවට සහාය වේ.

4.6.2 සිවිල් සමාජ සංවිධාන විසින් සංවිධානය කරන ලද රැස්වීම් වලට සහභාගී වීම

සිවිල් සමාජ සංවිධාන විසින් සංවිධානය කරන ලද රැස්වීම් කිහිපයකට මානව හිමිකම් කොමිසමේ කොමසාරිස්වරුන් සහ කාර්ය මණ්ඩලය සහභාගී විය. ඒ අතර; 2021.03.16 දින පැවති එක්සත් ජාතීන්ගේ ව්‍යාපාර සහ මානව හිමිකම් පිළිබඳ දකුණු ආසියානු සංසදය විසින් පවත්වන ලද දකුණු ආසියාවේ පශ්චාත් කෝවිඩ් - 19 පිළිබඳ රැස්වීමට සහභාගී වීම සහ මානව හිමිකම් පිළිබඳ සම්පත් මධ්‍යස්ථානයේ නියෝජිතයින් සමඟ වගකීම් සහිත ව්‍යාපාර සහ මානව හිමිකම් මැයෙන් පැවති රැස්වීමට සහභාගී වීම.

4.6.3 සිවිල් සමාජය සඳහා පුහුණුව

කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇති වූ සීමාවන් නොතකා සිවිල් සමාජයේ සාමාජිකයින් සඳහා පුහුණු සහ සංවේදීකරණ වැඩසටහන් පැවැත්වීමට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව මූලිකත්වය ගෙන කටයුතු කර ඇත. සමාලෝචිත වර්ෂය තුළ එසේ සංවිධානය කරන ලද ක්‍රියාකාරකම් අතර මඩකලපුවේ ආගමික සංගමයක් විසින් සංවිධානය කරන ලද මූලික අයිතිවාසිකම් පිළිබඳ වැඩමුළුව සහ කල්මුණේ මානව සංවර්ධන සංවිධානය විසින් සංවිධානය කරන ලද සූම් තාක්ෂණය හරහා පවත්වන ලද භාෂා අයිතිවාසිකම් පිළිබඳ සාකච්ඡාව ද වේ.

5 වන පරිච්ඡේදය

ජාත්‍යන්තර සහයෝගීතාවය

5.1 හැඳින්වීම

1996 අංක 21 දරන කොමිෂන් සභා පනත මගින් බල ගන්වා ඇති පරිදි ශ්‍රී ලංකාවේ ජාත්‍යන්තර මානව හිමිකම් බැඳීම්වලට අනුකූල වීම ප්‍රවර්ධනය කිරීමේදී 2021 වර්ෂයේදී ද කොමිෂන් සභාව ජාත්‍යන්තර සහ කලාපීය මානව හිමිකම් සංවිධාන සහ ආරක්ෂණ යාන්ත්‍රණය සමඟ සක්‍රීයව සන්නිවේදනය සහ සහයෝගීතාව අඛණ්ඩව සිදු කරන ලදී.

5.2 කලාපීය මානව හිමිකම් සන්ධාන සමඟ සබඳතා ශක්තිමත් කිරීම

2021 සැප්තැම්බර් 15 සහ 16 යන දිනවල අතථ්‍ය මාර්ගගත ක්‍රමය ඔස්සේ පැවැත්වුණු ආසියා පැසිෆික් සංසදයේ හි වාර්ෂික මහා සභා රැස්වීමට ආසියා පැසිෆික් සංසදයේ සාමාජිකයෙකු ලෙස කොමිෂන් සභාව සාමාජික රටවල් 25 සමඟ අනෙකුත් ජාතික මානව හිමිකම් ආයතනවල නිරීක්ෂක නියෝජිතයන්ද එක් කරගනිමින් ක්‍රියාකාරී ලෙස සහභාගී විය. ආසියා පැසිෆික් සංසදය යනු ජාතික මානව හිමිකම් ආයතන සඳහා තාක්ෂණික සහාය සපයන කලාපීය සම්බන්ධීකරණ සංවිධානයයි.

5.3 බ්‍රිතාන්‍ය මහ කොමසාරිස්වරිය සමඟ රැස්වීම

කොමිෂන් සභාව විසින් 2021 ජූනි 1 වන දින බ්‍රිතාන්‍ය මහ කොමසාරිස්, අතිගරු සාරා හල්ටන් මහත්මිය සමඟ කොමිසමේ ප්‍රධාන කාර්යාලයේදී සූම් තාක්ෂණය ඔස්සේ රැස්වීමක් පවත්වන ලදී. රටේ පවතින මානව හිමිකම් ගැටලු සහ කොමිසමේ වත්මන් මානව හිමිකම් මැදිහත්වීම් පිළිබඳව මෙහිදී සාකච්ඡාවට ගැනුණි.

5.4 යුරෝපීය කොමිසමේ නියෝජිතයින් සමඟ රැස්වීම

ශ්‍රී ලාංකික ශ්‍රමිකයින්ගේ නීතිමය ආරක්ෂාව ඉලක්ක කර ගනිමින් සහ ඔවුන්ගේ මානව හිමිකම් සම්බන්ධ තත්ත්වයන් ආරක්ෂා කිරීමට ගෙන ඇති ක්‍රියාමාර්ග පිළිබඳව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමඟ සාකච්ඡා කිරීමේ අරමුණින් යුරෝපා කොමිසමේ නියෝජිත පිරිස ශ්‍රී ලංකාවට පැමිණියහ. කම්කරු ක්ෂේත්‍රයේ ප්‍රධාන ප්‍රවාහයේ ක්‍රියාකාරී නමුත් යුරෝපා සංගමයට තම අදහස් ප්‍රකාශ කිරීමට අවස්ථාවක් නොමැති කම්කරු සංගම්වල සහභාගීත්වයෙන් මෙම සාකච්ඡාව පැවැත්විණි. බියගම සහ කටුනායක නිදහස් වෙළඳ අපනයන කලාපයේ ප්‍රධාන ධාරාවේ ක්‍රියාත්මක නොවන ක්‍රියාකාරී කම්කරු නොවන සංවිධානවලට ද මෙම සාකච්ඡාව සඳහා ආරාධනා කර තිබුණි. 2021.09.24 දින පැවති මෙම සාකච්ඡාවට එවැනි සංවිධාන 05ක් නියෝජනය කරමින් නියෝජිතයින් රැසක් සහභාගී විය.

මෙම සාකච්ඡාවේ ප්‍රධාන අවධානය යොමු වූයේ රට තුළ පවතින ප්‍රජාතන්ත්‍ර හිතකාමී සමාජයකට අවශ්‍ය වන සුවිශේෂී ලක්ෂණ සහ දැනට පවතින කම්කරු අයිතිවාසිකම් කෙරෙහි අහිතකර ලෙස බලපා ඇති කරුණු පිළිබඳවය. මානව හිමිකම් කොමිෂන් සභාව මගින් පහසුකම් සලසන ලද යුරෝපා සංගමය සමඟ තමන් සැලකිලිමත් වන කරුණු සාකච්ඡා කිරීමට කම්කරු සංවිධානවලට එය සුවිශේෂී අවස්ථාවක් විය.

තවද, යුරෝපා කොමිසම විසින් ශ්‍රී ලංකාවට ලබා දී ඇති ජීඑස්පී+ (GSP+) බදු විරාමය පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා 2021.09.28 දින කොමිසම සහ යුරෝපා සංගමයේ නියෝජිතයින් අතර තවත් හමුවක් පැවැත්විණි.

5.5 කොමිෂන් සභාවේ ශ්‍රේණිගත කිරීම

ජාතික මානව හිමිකම් ආයතනවල ගෝලීය සන්ධානය (GANHRI) විසින් තුන්වන පාර්ශවයන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිළිබඳ යොමු කරනු ලැබූ වාර්තාවක් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව වෙත කරුණු විමසීම සඳහා යොමු කරනු ලැබීය. මේ සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමඟ මාර්ගගත ක්‍රමය ඔස්සේ සමාලෝචන රැස්වීමක් ජාතික මානව හිමිකම් ආයතන වල ගෝලීය සන්ධානය විසින් පවත්වනු ලැබීය. ජාතික මානව හිමිකම් ආයතන වල ගෝලීය සංධානය පනතේ 18.1 වගන්තිය අනුව සමාලෝචන රැස්වීම පදනම් කොටගෙන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කරනු ලැබීය. ඒ අනුව වසරක් අවසානයේ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව "B" ශ්‍රේණියට පහත හෙළා ඇත. GANHRI වැඩිදුරටත් දන්වා ඇත්තේ මෙම නිර්දේශය අභියෝගයට ලක් කරමින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවට ලිඛිත සැළකිරීම් කළහැකි බවයි. ඒ අනුව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ලිඛිත වාර්තාවක් යොමු කර ඇත.

5.6 ශ්‍රී ලංකාවේ නවසීලන්ත මහ කොමසාරිස්වරයා සමඟ රැස්වීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2021 ඔක්තෝම්බර් 21 වන දින ශ්‍රී ලංකාවේ නවසීලන්ත මහ කොමසාරිස්වරයා සමඟ රැස්වීමක් පැවැත්වීය. රටේ වත්මන් මානව හිමිකම් තත්ත්වය පිළිබඳව මෙම රැස්වීමේදී සාකච්ඡා කෙරිණි.

5.7 ජාත්‍යන්තර රතු කුරුස කමිටුවේ (ICRC) නියෝජිතයන් සමඟ සාකච්ඡාව

ශ්‍රී ලංකාවට පැමිණි රතු කුරුස සංවිධානයේ නියෝජිතයන් විසින් ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව සමග 2021.11.05 දින ශ්‍රී ලංකාවේ බන්ධනාගාර රැඳවියන්ගේ අයිතිවාසිකම් සම්බන්ධයෙන් සාකච්ඡාවක් පවත්වන ලදී.

6 වන පරිච්ඡේදය

මානව සම්පත්, පරිපාලනය සහ මූල්‍ය

6.1 හැඳින්වීම

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව ස්වකීය ප්‍රධාන කාර්යාලයේ මෙන්ම ප්‍රාදේශීය කාර්යාලයන්හි ප්‍රවීණ කාර්ය මණ්ඩලයක් සිටීමේ වැදගත්කම අවබෝධ කරගෙන සිටින අතර, කාර්ය මණ්ඩලය ඔවුන්ගේ කාර්යක්ෂමතාවය, අභියෝග වලට මුහුණදීම සහ ඔවුන්ගේ සේවය අපේක්ෂිත ප්‍රජාවන්ට අවශ්‍ය සහාය ලබාදීම සඳහා ඔවුන්ගේ කුසලතා උපයෝගී කර ගැනීමේ හැකියාව වැඩිදියුණු කිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තර වශයෙන් පුහුණුව ලබා ගැනීමට උනන්දු කරවයි. කෝවිඩ්-19 වසංගතය ආරම්භයේ දී පනවන ලද ජාත්‍යන්තර සංචාරක සීමාවන් හේතුවෙන්, කාර්ය මණ්ඩලයට 2021 දී ජාත්‍යන්තර පුහුණු අවස්ථා ලබා ගැනීමට නොහැකි විය.

6.2 මානව සම්පත් කළමනාකරණය

2021 වර්ෂය සඳහා මානව සම්පත් සංවර්ධන සැලැස්ම සකස් කර ඇත්තේ මානව සම්පත්වල ගුණාත්මක සංවර්ධනය සඳහා ධාරිතා වර්ධනය කිරීම පෙරදැරිවය. මෙසේ සමාලෝචිත වර්ෂය තුළ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවෙහි කාර්ය මණ්ඩලය සඳහා පුහුණු වැඩසටහන් කිහිපයක් වැඩමුළු, සංවාද සහ ධාරිතා වර්ධන වැඩසටහන් වශයෙන් පවත්වන ලදී. එවැනි වැඩසටහන් අතර ජාතික මානව හිමිකම් ආයතන සහ මානුෂීය ක්‍රියාවන්හිදී මානව හිමිකම් ප්‍රවර්ධනය, ජාතික මානව හිමිකම් ආයතනවල කාර්යභාරය ඔවුන්ගේ ජාතික අන්තර්ගතයේ ජයග්‍රහණ තුළ තිරසාර සංවර්ධන ඉලක්ක නිරීක්ෂණය කිරීම, ලිංගික දිශානතිය හා ස්ත්‍රී පුරුෂ සමාජභාවය පිළිබඳ මානව හිමිකම් ප්‍රවර්ධනය කිරීම සහ ආරක්ෂා කිරීම සහ ප්‍රවර්ධනය කිරීම, සහ මානව හිමිකම් ආරක්ෂකයින් ආරක්ෂා කිරීම. කාර්ය මණ්ඩලය සඳහා මෙම වැඩසටහන් සංවිධානය කර තිබුණේ ආසියා ශාන්තිකර සංසදය සහ එක්සත් ජාතින්ගේ කාන්තාවන් (UN Women) විසිනි. කෙසේ වෙතත්, රට තුළ පැවති කෝවිඩ්-19 වසංගත තත්ත්වය හමුවේ සෞඛ්‍ය බලධාරීන්ගේ නිර්දේශ හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නියමිතව තිබූ ඇතැම් පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකි විය.

2021 වසර වන විට කොමිෂන් සභාවේ පුරප්පාඩු 87ක් ඉතිරිව තිබුණි. පුරප්පාඩු 87 න් 33 ක් 2021 දී පුරවා ඇති අතර බඳවා ගැනීම් ස්ථීර, කොන්ත්‍රාත් සහ ද්විතීයන ගණයට අයත් විය. සීමිත සහ විවෘත දැන්වීම් මත ඉතිරි පුරප්පාඩු 54 පිරවීම සඳහා අයදුම්පත් කැඳවන ලදී. නීති නිලධාරීන් සහ වැඩසටහන් සහකාර තනතුරු සඳහා බඳවා ගැනීම සඳහා සම්මුඛ පරීක්ෂණ

පැවැත්වුවද, 2021 වර්ෂය තුළ කෝවිඩ්-19 වසංගතය හේතුවෙන් නව බඳවා ගැනීම් සීමා කිරීමට රජයේ මූල්‍ය ප්‍රතිපත්ති තීරණ හේතුවෙන් බඳවා ගැනීම සිදු කළ නොහැකි විය. කෙසේ වුවද, තාවකාලික වැඩපිළිවෙළක් ලෙස, කොමිෂන් සභාවේ කටයුතු කාර්යක්ෂම ලෙස සිදුකිරීමට කාර්ය මණ්ඩලය නොමැති වීම හේතුවෙන් කොමිෂන් සභාවට ඇති දුෂ්කරතාවන්ට පහසුකම් සැලසීම සඳහා උපාධිධාරීන් 27 දෙනෙකු කොමිෂන් සභාවට අනුයුක්ත කර ඇත.

පුරප්පාඩු සඳහා බඳවා ගැනීම් සිදු කරන අතරතුර එම තනතුරුවල රාජකාරි ආවරණය කිරීමට අභ්‍යන්තර කටයුතු සම්පාදනය කරන ලදී. ඒ අනුව පුරප්පාඩු වූ ලේකම් තනතුර සඳහා වැඩ බලන පදනම මත අතිරේක ලේකම් පත් කිරීම, පරිපාලන හා මුදල් අධ්‍යක්ෂ තනතුරට රාජ්‍ය සේවා නිලධාරියකු ද්විතීයික පදනමින් පත් කිරීම, කොන්ත්‍රාත් පදනම මත පරිපාලන නිලධාරියකු පත් කිරීම, සහ මානව හිමිකම් නිලධාරි තනතුර සඳහා බඳවා ගැනීමේ පටිපාටිය යටතේ අන්තර්ග්‍රහණය කිරීමේ ක්‍රියාවලිය හරහා අන්තර්ග්‍රහණය කර ඇති නිලධාරීන් 14 දෙනෙකු පත් කිරීම, ප්‍රාදේශීය සම්බන්ධීකාරකවරුන් 3 දෙනෙකු පත් කිරීම සිදු කරන ලදී. වව්නියාව, මන්නාරම සහ කිලිනොච්චි කාර්යාලවල රාජකාරී ආවරණය කිරීමට යාපනය ප්‍රාදේශීය සම්බන්ධීකාරක විසින් පියවර ගෙන ඇත.

6.3 මූල්‍ය සම්පත් කළමනාකරණය

කොමිෂන් සභාවට මූලික කටයුතු සිදු කිරීම සඳහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලැබුණි. පහත වගුවේ දැක්වෙන්නේ 2021 වර්ෂය සඳහා වන මූල්‍ය තත්ත්වයයි.

2021.01.01 සිට 2021.12.31 දක්වා මූල්‍ය තත්ත්වය

ආරම්භක ශේෂය	රු.
භාණ්ඩාගාරයෙන් ලැබුණු අක්මුදල	
පුනරාවර්තන	208,659,000.00
ප්‍රාග්ධන	4,150,720.00
වෙනත් ලැබීම්	687,258.38
තැන්පතු ගිණුමේ ශුද්ධ වෙනස	(1,932,767.11)
භාණ්ඩාගාරයට මුදල් එවීම්	(206,995.73)
මුළු ලැබීම්	**211,357,215.54**
<u>වියදම්</u>	
පුද්ගල වැටුප්	128,183,128.34
ගමන් වියදම්	496,047.50
සැපයුම්	5,739,625.21
නඩත්තු වියදම්	3,855,318.09
සේවා	62,703,083.06
මාරු කිරීම්	5,470,459.63
මානව හිමිකම් වැඩසටහන්	1,646,726.47
ප්‍රාග්ධන වත්කම් පුනරුත්ථාපනය සහ වැඩිදියුණු කිරීම්	292,270.00
ප්‍රාග්ධන වත්කම් අත්පත් කර ගැනීම	1,498,720.00
ධාරිතාව ගොඩනැගීම	130,936.00
ශ්‍රී ලංකාවේ සාමය ගොඩනැගීම සඳහා උත්ප්‍රේරක සහාය (UNDP)	-
ආපසු පැමිණෙන්නන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් වෙත ප්‍රවේශ වීමට හැකියාව ලබා දීම (UNHCR)	1,340,901.24
මානව හිමිකම් කොමිසමේ (SWISS) හි ධාරිතාව ශක්තිමත් කිරීම	-
එකතුව	**211,357,215.54**

6.4 සීමාවාසික හෝ ආධුනික පුහුණු වැඩසටහන


කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල සමඟ සම්මුඛ පරීක්ෂණ පැවැත්වීමෙන් විවිධ අධ්‍යාපන ආයතනවල අභ්‍යාසලාභීන් හෝ සීමාවාසිකයින් ස්වේච්ඡා පදනමින් බඳවා ගනු ලැබේ. ඒ අනුව, මෙම යෝජනා ක්‍රමය යටතේ, සමාලෝචිත වර්ෂය තුළ කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලය සහ ප්‍රාදේශීය කාර්යාල සඳහා පිළිවෙලින් ආධුනික අභ්‍යාසලාභීන් 14ක් සහ 26ක් බඳවාගෙන ඇත. කෙසේ වෙතත්, කෝවිඩ් - 19 සීමා කිරීම් හේතුවෙන් සීමාවාසික වැඩසටහන් ද සීමා කර ඇත.

උපග්‍රන්ථ

ඇමුණුම 1 : ශ්‍රී ලංකාව තුළ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය

ඇමුණුම 2 : නිර්දේශ මාලාව

ඇමුණුම 1 - ශ්‍රී ලංකාව තුළ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ක්‍රියාකාරිත්වය



2021 වසරේ යවා ඇති නිර්දේශ සංඛ්‍යාව			**88**			
ක්‍රියාත්මක කළ සංඛ්‍යාව			**09**			
	නඩු අංකය	**පෙත්සම්කරු**	**නිකුත් කළ දිනය**	**ව්‍යවස්ථාවේ උල්ලංඝණය වූ වගන්තිය**	**වගඋත්තරකරු**	**පැමිණිලි වර්ගය**
1	HRC/1631/15	කේ. යූ. පුෂ්පකුමාර	2021/1/6	12(1) වගන්තිය	විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම	සේවා කොන්දේසි
2	HRC/1144/15	කේ. සිවනන්දසෙල්වම්	2021/2/1	12(1) වගන්තිය	අධ්‍යාපන අමාත්‍යාංශය	උසස්වීම
3	HRC/Ap/147/18	එස්. කුමාර	2021/1/13	12(1) වගන්තිය	ශ්‍රී ලංකා යුධ හමුදාව	විශ්‍රාම වැටුප්
4	HRC/AP/376/15	වයි. එස්. සෙනරත්	2021/2/1	12(1) වගන්තිය	දි/ලේ අනුරාධපුර	විශ්‍රාම වැටුප්
5	HRC/2213/16	පී.වී.පී. දර්ශනී	2021/1/13	12(1) වගන්තිය	පොල් සංවර්ධන අධිකාරිය	උසස්වීම
6	HRC/K/657/18	පී.ආර්. ලොකුගලප්පත්ති	2021/1/2	12(1) වගන්තිය	කිංග්ස්වුඩ් විද්‍යාලය, මහනුවර	පාසලට ඇතුළත් කිරීම
7	HRC/3620/17	බී. ශ්‍රියාවනී	2021/2/1	12(1) වගන්තිය	සංඝමිත්තා බාලිකා විද්‍යාලය	පාසලට ඇතුළත් කිරීම
8	HRC/AP/476/15	ටී.ඩී. අමුගොඩ	2021/2/1	12(1) වගන්තිය	ප්‍රා/ලේ, රඹෑව	ඉඩම් හා සම්බන්ධ කරුණකි
9	HRC/845/17	වයි.ජී.ඒ.කරුණාරත්න	2021/1/2	12(1) වගන්තිය	ජාතික තරුණ සේවා සභාව	උසස්වීම
10	HRC/MT/355/17	ඒ. ගුණවර්ධන	2021/2/18	13(2) වගන්තිය	වැලිගම පොලිසිය	අත් අඩංගුවට ගැනීම / රඳවා තබා ගැනීම
11	HRC/284/15	ඩබ්ලිව්.එස්. බණ්ඩාර	2021/2/18	11, 13(2) වගන්තිය	ඇඹිලිපිටිය පොලිසිය	වධහිංසා පැමිණවීම
12	HRC/AP/561/14	ඩී.එම්.එන්. දසනායක	2021/2/18	13(1) වගන්තිය	රාජාංගනය පොලිසිය	අත්අඩංගුවට ගැනීම /රඳවා තබා ගැනීම
13	HRC/1751/18	ඩී.එම්. ත්‍රිමාවිතාන	2021/2/18	11 වගන්තිය	පිළියන්දල පොලිසිය	වධහිංසා පැමිණවීම
14	HRC/Ap/120/18	ජී.ඒ.ටී.එම්. ද සිල්වා	2021/2/18	12(1), 13(1) වගන්තිය	මාතලේ පොලිසිය	අත්අඩංගුවට ගැනීම /රඳවා තබා ගැනීම
15	HRC/3757/13	කේ.ඒ. නිමල්	2021/2/18	11 වගන්තිය	කිරුලපන පොලිසිය	වධහිංසා පැමිණවීම
16	HRC/2901/19	ශ්‍රී හෘදය කන්‍යාරාමයේ (Sacred Heart Convent)මුස්ලිම් දරුවන්ගේ දෙමාපිය සංගමය	2021/2/18	10,12(1) 12(2),14(1) වගන්තිය	දකුණු පළාත් සභාවේ අධ්‍යාපන අමාත්‍යාංශය	හිරිහැර කිරීම (අබාය) මුස්ලිම් මව්වරුන්ගේ ඇඳුම

17	HRC/2785/17	ඩී.එච්.පී. කෞෂල්‍ය	2021/2/18	12(1) වගන්තිය	මීටියාගොඩ පොලීසිය	අත්අඩංගුවට ගැනීම /රඳවා තබා ගැනීම
18	HRC/KL/136	එම්.බී.එම්. සිරාජ්	2021/2/18	12(1),12(2) වගන්තිය	තාක්ෂණික සහ පුහුණු දෙපාර්තමේන්තුව	අත්අඩංගුවට ගැනීම /රඳවා තබා ගැනීම
19	HRC/4625/12	ඩබ්.එස්.එන්.එල්. කුමාර	2021/02/23	12(1) වගන්තිය	ශ්‍රී ලංකා නාවුක හමුදාව	සේවා කොන්දේසි
20	HRC/2499/19	වී. සුබ්‍රමානියම්		12(1) වගන්තිය		
21	HRC/AM/03/18/ S/EM	එච්.එම්.පී.එන්. හේරත්	2021/3/3	12(1) වගන්තිය	තැපැල් දෙපාර්තමේන්තුව	බඳවා ගැනීම
22	HRC/1531/15	කේ.ඩී. සුනීතා	2021/3/9	12(1) වගන්තිය	නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය	වන්දි ගෙවීම
23	HRC/AP/446/17	ඒ.එම්. බණ්ඩම්මා	2021/3/9	12(1) වගන්තිය	දුම්රිය දෙපාරතමේන්තුව	විශ්‍රාම වැටුප
24	HRC/KL/84/17	එස්.එම්. ඉෂාක් සහ අනෙකුත් අය.	15/3/2021	11,13(1) 13(2)වගන්තිය	වාවකල්ලඩි පොලීසිය	අත්අඩංගුවට ගැනීම /රඳවා තබා ගැනීම
25	HRC/2011/12	ඩබ්.පී. නිලන්ත	2021/3/9	12(1) වගන්තිය	ශ්‍රී ලංකා යුධ හමුදාව	සේවය නතර කිරීම
26	HRC/3852/14	එම්. ජයරත්න	2021/3/9	12(1) වගන්තිය	බස්නාහිර පළාත් සමූපකාර සංවර්ධන දෙපාර්තමේන්තුව	සේවා කොන්දේසි
27	HRC/1004/14	කේ.ජී.පී. ප්‍රනාන්දු	2021/03/09	12(1) වගන්තිය	ශ්‍රී ලංකා රක්ෂණ සංස්ථාව	රක්ෂණය
28	HRC/K/171/13	ඩබ්.ඩී.එම්.ජී,ඒ. විජේසුන්දර	2021/03/18	12(1) වගන්තිය	තිහගොඩ පොලීසිය	වධහිංසා පැමිණවීම
29	HRC/AP/68/18	සී.යූ. කප්පාගොඩ		12(1) වගන්තිය		
	HRC/AP/237/18	සී.ජේ විජේසුන්දර	2021/03/29	12(1) වගන්තිය	අනුරාධපුර මහ නගර සභාව	පාසලට ඇතුළත් කිරීම- 6 වසර
30	HRC/110/20	බී.එච්.එස්. කුමාර	29/3/2021	12(1) වගන්තිය	රිච්මන්ඩ් විද්‍යාලය	පාසලට ඇතුළත් කිරීම
31	HRC/3220/16	යූ.ඩී චතුරංග	2021/03/29	12(1) වගන්තිය	ඩී.එස්. සේනානායක විද්‍යාලය	පාසලට ඇතුළත් කිරීම
32	HRC/K/166/15	බී.ඩබ්.ඩී.එම්.ආර්. ධර්මකීර්ති	29/3/2021	12(1) වගන්තිය	මධ්‍යම පළාත් සභාවේ අධ්‍යාපන දෙපාර්තමේන්තුව	බඳවා ගැනීම
33	HRC/K/87/20	ජේ.ආර්.ටී සමරතුංග	2021/03/29	12(1) වගන්තිය	කෑගල්ල විද්‍යාලය	පාසලට ඇතුළත් කිරීම


34	HRC/1321/15	කේ.කේ.ඩබ්.එල්. විමලසිරි	29/3/2021	12(1) වගන්තිය	අම්බලන්ගොඩ පොලීසිය	වධහිංසා පැමිණිවීම
35	HRC/AP/515/17(S)	ටී.එම්.එන්.සී. පියරත්න	2021/4/9	12(1) වගන්තිය	ගිරිබාව පොලීසිය	අත්අඩංගුවට ගැනීම /රඳවා තබා ගැනීම
36	HRC/417/19	එච්.ටී තරංග	2021/4/9	12(1) වගන්තිය	විශාඛා විද්‍යාලය	පාසලට ඇතුළත් කිරීම
37	HRC/5069/16	එම්.එස්. අබේදීර	2021/4/9	12(1) වගන්තිය	ප්‍රා/ලේ රුවන්වැල්ල	ඉඩම්, දේපල අයිතිවාසිකම්
38	HRC/JA/3398/07	ආර්. කරුණානිති	2021/4/19	12(1) වගන්තිය	රෙජිස්ත්‍රාර් ජනරාල් බත්තරමුල්ල	උසස්වීම්
39	HRC/76/18	ඩී.එන්.එස්. ද සිල්වා	2021/4/9	12(1) වගන්තිය	ජේෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති දකුණු පළාත, මාතර	ලිංගික අතවර කිරීම
40	HRC/415/18	එම්.එම්.සී. පෙරේරා	2021/5/18	12(1) වගන්තිය	කිරුලපන පොලීසිය	වධහිංසා පැමිණිවීම
41	HRC/1565/18	එල්.එම්.ඒ.එම්. ලංකාදීර	2021/5/19	11,12(1) වගන්තිය	පො.අ. බදුල්ල	ලිංගික අතවර කිරීම
42	HRC/KL/55/15	පීඩාවට පත් සේවක කණ්ඩායමක්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය, අක්කරෙයිපත්තුව	2021/5/10	12(1),12(2)වගන්තිය	ජල සම්පාදන මණ්ඩලය	බඳවා ගැනීම
43	HRC/94/19	ඉසඩ්.සී.එම්. ෆස්ලි	2021/5/10	12(1) වගන්තිය	රාජකිය විද්‍යාලය	පාසලට ඇතුළත් කිරීම
44	HRC/2953/17	ඒ. ප්‍රේමලතා	2021/5/10	11 වගන්තිය	ඇහැලියගොඩ පොලීසිය	වධහිංසා පැමිණිවීම
45	HRC/AM/60/11	කේ.එම්.එස්. රංජිත්	2021/05/18	12(1) වගන්තිය	දිස්ත්‍රික් වින අඩවි නිලධාරි, අනුරාධපුරය	බලපත්‍රය
46	HRC/53/17	පී. විජේසූරිය	2021/05/18	11,1(1) වගන්තිය	හෝමාගම පොලීසිය	වධහිංසා පැමිණිවීම
47	HRC/359/14	එස්.ඒ.ඩී. කාංචනා	2021/5/18	11 වගන්තිය	ශ්‍රී ලංකා යුධ හමුදාව	වධහිංසා පැමිණිවීම
48	HRC/3267/17	ඩබ්.එම්.පී.සී. වර්ණසූරිය සහ අනෙකුත් අය	2021/5/18	12(1) වගන්තිය	කම්කරු දෙපාර්තමේන්තුව	බඳවා ගැනීම්
49	HRC/K/462/19	එල්.පී.ඩී.එන්.ටී. ඩයස්	2021/5/18	12(1) වගන්තිය	මූලික රෝහල කරවනැල්ල	සේවා කොන්දේසි
50	HRC/AM/22/20	ආර්.ඒ.ජයවීර	2021/5/18	11 වගන්තිය	මහ ඔය පොලීසිය	වධහිංසා පැමිණිවීම

51	HRC/97/19	එම්.ආර්.එල්. ජිනදාස	2021/5/18	12(1) වගන්තිය	සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය	පාසලට ඇතුළත් කිරීම
52	HRC/821/17	ඒ.එන්. විජේසේකර	2021/7/19	11,13(4) වගන්තිය	පැලියගොඩ පොලීසිය	අත්අඩංගුවේ සිටියදී මරණය
53	HRC/4437/15	ඒ.එල්. වික්‍රම	2021/7/19	11 වගන්තිය	කිරුලපන පොලීසිය	වධහිංසා පැමිණවීම
54	HRC/922/18	එච්.එම්. ප්‍රේමරත්න	2021/7/19	13(1) වගන්තිය	ඇහැලියගොඩ පොලීසිය	අත්අඩංගුවට ගැනීම /රඳවා තබා ගැනීම
55	HRC/1120/19	ඒ.එච්.එෆ්. හනීෆා	2021/7/19	12(1),12(2), 13(2) වගන්තිය	බණ්ඩාරගම පොලීසිය	හිරිහැර කිරීම
56	HRC/1040/15	අයි.පී.ඩබ්.ආර්. ජයවීර	2021/7/19	11,13(1) වගන්තිය	කිරිඳිවැල පොලීසිය	වධහිංසා පැමිණවීම
57	HRC/1697/18	ඩබ්.එම්.පී. විජයසුන්දර	2021/7/19	11,13(1) වගන්තිය	රක්වාන පොලීසිය	වධහිංසා පැමිණවීම
58	HRC/3346/16	බී.එච්.ඒ.එච්.ජී.මතුරට	2021/7/19	12(1), 14(1)(g)	මුදල් අමාත්‍යාංශය, පොලිස්පති, ආරක්ෂක අමාත්‍යාංශය	බලපත්‍ර
59	HRC/4408/15	එස්.ඩී.එම්. ප්‍රියන්ත	2021/7/19	12(1) වගන්තිය	පයාගල පොලීසිය	වධහිංසා පැමිණවීම
60	HRC/618/21	පී.ඒ.එම්. විජේසේකර	2021/7/22	12(1) වගන්තිය	ශ්‍රී ලංකා ගුවන් හමුදාව	සේවා කොන්දේසි
61	HRC/JA/26/21	එන්.පී. මනෝහරතාස්	2021/9/13	12 වගන්තිය	යාපනය මහ නගර සභාව	ක්‍රියා නොකිරීම
62	HRC/537/15	ඩබ්.ඒ.පී. වන්නිආරච්චි	2021/9/16	12(1),12(2), 14(1), a,g. වගන්තිය	තනමල්විල පොලීසිය	වධහිංසා පැමිණවීම
63	HRC/AP/278/14	ආර්.එම්.එස්. චාන්දනී	2021/9/16	13(1) වගන්තිය	ගලෙන්බිඳුනුවැව පොලීසිය	අත්අඩංගුවට ගැනීම /රඳවා තබා ගැනීම
64	HRC/1459/17	ඩී.පී. තිස්ස	2021/9/27	11 වගන්තිය	සමනලවැව පොලීසිය	වධහිංසා පැමිණවීම
65	HRC/AP/339/15	ඒ.එම්.එල්. අංගම්මන	2021/10/25	13(1) වගන්තිය	අනුරාධපුර පොලීසිය	අත්අඩංගුවට ගැනීම /රඳවා තබා ගැනීම
66	HRC/1642/18	එස්.ජී. සෝමාවතී.	2021/10/25	12(1) වගන්තිය	කෘෂිකර්ම හා ගොවිජන රක්ෂණ මණ්ඩලය	විශ්‍රාම වැටුප
67	HRC/2557/16	ඩබ්.එච්. මාලනී	2021/10/26	22 වගන්තිය	වාද්දුව පොලීසිය	අත්අඩංගුවට ගැනීම /රඳවා තබා ගැනීම

68	HRC/1930/15	ඩබ්.එම්. අබේකෝන්	2021/10/26	11,13(1), 13(2)වගන්තිය	කුරුවිට පොලීසිය	වධහිංසා පැමිණිවීම
69	HRC/4538/16	ඒ. කෘෂ්ස්	2021/10/26	13(1) වගන්තිය	අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව	අත්අඩංගුවට ගැනීම /රඳවා තබා ගැනීම
70	HRC/1958/16	ජේ.පී හින්ඩ්ලේ	2021/10/26	12(1),13(2) වගන්ති	මාවතගම පොලීසිය	අත්අඩංගුවට ගැනීම /රඳවා තබා ගැනීම
71	HRC/3447/16	ඩබ්.අයි. මිහිරාණි	2021/10/26	11,13(1) 13(2) වගන්ති	අම්බලන්ගොඩ පොලීසිය	වධහිංසා පැමිණිවීම
72	HRC/2112/17	ජේ.එල්. පද්මසිරි	2021/11/8	11,13(1) 13(2) වගන්ති	වැලිවේරිය පොලීසිය	වධහිංසා පැමිණිවීම
73	HRC/715/15	එන්.ජී.එස්.එම්.රත්නායක	2021/12/11	12(1) වගන්තිය	මොරටුමුල්ල පොලීසිය	අත්අඩංගුවට ගැනීම /රඳවා තබා ගැනීම
74	HRC/3084/18	අයි.කේ.එස්. කරුණානායක සහ අනෙකුත් අය	2021/12/11	12(1) වගන්තිය	රාජකීය විද්‍යාලය	පාසලට ඇතුළත් කිරීම
75	HRC/AP/665/13	ආර්.එන්.ටී.ඒ. රත්නායක	2021/12/11	12(1) වගන්තිය	රජරට විශ්ව විද්‍යාලය	බඳවා ගැනීම්
76	HRC/578/15	වයි.ඒ.සී.ඩී.ආර්. වීරසූරිය	2021/12/11	13(1) වගන්තිය	බලංගොඩ පොලීසිය	අත්අඩංගුවට ගැනීම /රඳවා තබා ගැනීම
77	HRC/195/18	ආර්.ඒ. ප්‍රියන්ත	2021/12/11	12(1) වගන්තිය	ෆර්ගසන් ජාතික පාසැල	පාසලට ඇතුළත් කිරීම
78	HRC/K/379/15	ඩබ්.ජී.එන්. මාරසිංහ	2021/12/11	13(1) වගන්තිය	නව කුරුඳුවත්ත පොලීසිය	අත්අඩංගුවට ගැනීම /රඳවා තබා ගැනීම
79	HRC/2600/16	එම්.ඩී.එස්. අමරසිරි	2021/11/08	11 වන වගන්තිය	පොලොන්නරුව පොලීසිය	වධහිංසා පැමිණිවීම
80	HRC/AM/70/16	එච්.ඩී. ප්‍රේමරත්න	2021/12/11	12(1) වගන්තිය	කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ, අම්පාර	මාරු කිරීම්
81	HRC/112/20	එස්.ඒ.සී.එස්. ගුණරත්න	2021/11/29	12(1) වගන්තිය	ආනන්ද විද්‍යාලය	පාසලට ඇතුළත් කිරීම
82	HRC/2953/16	ඩී.ඒ.ඒ. රාජකරුණා	2021/11/29	13/(5), 12(1) වගන්තිය	ශ්‍රී ලංකා නාවුක හමුදාව	බලය අනිසි ලෙස භාවිතා කිරීම
83	HRC/2927/17	එච්.එම්.ජී.එන්.කේ. කලුහෙන්දිවල	2021/11/29	අයන්ති මහත්මිය2021/11/30	ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව	බලය අනිසි ලෙස භාවිතා කිරීම
84	HRC/3794/19	පී.ජී.ආර්.සී.ඒ. ගමලත්	2021/11/29	12(1)	පොලිස්පති	ක්‍රියා නොකිරීම

				වගන්තිය		
86	HRC/2793/15	ආර්.බී. දීපානි	2021/11/29	11 වන වගන්තිය	ප්‍රාදේශීය ලේකම්, හොරණ	වධහිංසා පැමිණිවීම
86	HRC/AP/412/14	එල්.බී. රාජකරුණා	2021/11/29	12(1) වගන්තිය	විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුව	විශ්‍රාම වැටුප
87	HRC/K/655/16	එච්.එම්.එම්.ජී.එච්. විමලවීර	2021/11/17	11 වන වගන්තිය	බුලත්කොහුපිටිය පොලීසිය	වධහිංසා පැමිණිවීම
88	HRC/K/492/20	එච්.පී. ගුණවර්ධන	2021/12/20	12(1) වගන්තිය	කළමනාකරණ සේවා දෙපාර්ත්මේන්තුව	උසස්වීම්

ඇමුණුම 2 - නිර්දේශ මාලාව



ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය
எனது இல.
My No. PIC/B/HRC/2/21/28

ඔබේ අංකය
உமது இல.
Your No.

දිනය
திகதி
Date 2022 මැයි 06 වන දින.

RECEIVED
06 JUN 2022
H.R.C.S.L.

ලේකම්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

යටේක්ත වාර්තාව හා මූල්‍ය ප්‍රකාශනයේ භාෂාත්‍රයෙන් වූ මුල් පිටපත් මේ සමඟ එවා ඇත.

එම්.සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති

එම්. සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

විගණකාධිපති වෙනුවට

පිටපත : අධ්‍යක්ෂ ජනරාල් - රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PIC/B/HRC/2/21/28 මෙහේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2022 මැයි 30 දින.

ලේකම්,
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව.

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මතය සඳහා පදනම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 **මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තිරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 **මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම**

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශය ක්‍රියාත්මක කර නොතිබුණි.

ඡේද යොමුව	විගණන නිරීක්ෂණය	නිර්දේශය
1.6.2.1 (අ)	කොමිෂන් සභාව සතු සියළු වත්කම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වුවත්, කොමිෂන් සභාව විසින් 2004 ජනවාරි 01 දිනෙන් පසු අත්පත් කර ගත් වත්කම් පමණක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් කර තිබුණු අතර 2004 වර්ෂයට පෙර පැවති වත්කම් ඇතුළත් කර නොතිබුණි.	වෙනස්කම් හඳුනාගෙන නිවැරදිව ගිණුම්ගත කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
(අ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය (i) 3.2 ඡේදය	සෑම මුදල් වර්ෂයකම ජූනි 15 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ප්‍රධාන ගණන්දීමේ නිලධාරිටද පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් කොමිෂන් සභාව විසින් 2020 වර්ෂය සඳහා වූ වාර්තාවෙන් කොටසක් මාස 06 ක

	පමණ ප්‍රමාදයක් සහිතව 2021 දෙසැම්බර් මසදී විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාවේ අම්පාර, බදුල්ල, කල්මුනේ, මහනුවර යන ප්‍රාදේශීය කාර්යාලවල හා නුවරඑළිය, කිලිනොච්චිය, මන්නාරම, පොළොන්නරුව යන උපකාර්යාලවල භාණ්ඩ සමීක්ෂණ වාර්තා ඇතුළත් වී නොතිබුණි.
(ii) 3.2.5 ඡේදය	උක්ත වක්‍රලේඛයේ ප්‍රකාරව සෑම මුදල් වර්ෂයකම අප්‍රේල් 30 දිනට පෙර පොදු 47 වාර්තාව අනුව විනාශ කළ යුතු, අලුත්වැඩියා කළ යුතු, විකිණිය යුතු හා වෙනත් ආයතන වලට පැවරිය හැකි භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වුවත් එලෙස කටයුතු කිරීමකින් තොරව වාර්තාව ඉදිරිපත් කර තිබුණි.
(ආ) 1993.09.21 දිනැති 22/93 දරන රාජ්‍ය පරිපාලන වක්‍රලේඛය	රාජකාරියේ යෙදී සිටියදී 2014 වර්ෂයේදී අනතුරකට ලක්වූ කොමිෂන් සභාවේ නිලධාරිනියකට වක්‍රලේඛය ප්‍රකාරව ගෙවූ රු.308,700 ක වන්දි මුදලට අමතරව කොමිෂන් සභාවේ අනුමැතිය මත පමණක් 2016 අප්‍රේල් මාසයේ සිට 2019 මාර්තු මාසය දක්වා මාසික ප්‍රවාහන දීමනා ලෙස එකතුව රු.650,016 ක් ගෙවා තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාල සීමාව තුල අධ්‍යාපන අමාත්‍යාංශයට අදාලව ලබා දී තිබුණු නිර්දේශ 90 න් විගණිත දිනය වන 2022 පෙබරවාරි 14 දින දක්වා ක්‍රියාත්මක වී තිබුණේ නිර්දේශ 57 ක් පමණි. එනම් සියයට 63 කි.

(ආ) කොමිෂන් සභාව විසින් 2016 සිට 2018 වර්ෂය දක්වා කාල සීමාව තුල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අදාලව ලබා දී තිබුණු නිර්දේශ 07 න් විගණිත දිනය වන 2022 පෙබරවාරි 14 දින දක්වා ක්‍රියාත්මක වී තිබුණේ ලබාදුන් නිර්දේශ වලින් සියයට 29 ක එනම් නිර්දේශ 02 ක් පමණි.

(ඇ) කොමිෂන් සභාව විසින් 2016 සිට 2018 වර්ෂය දක්වා කාල සීමාව තුල ශ්‍රී ලංකා පොලිසියට අදාලව ලබා දී තිබුණු නිර්දේශ 50 න් විගණිත දිනය වන 2022 පෙබරවාරි 14 දින දක්වා ක්‍රියාත්මක වී තිබුණේ ලබාදුන් නිර්දේශ වලින් සියයට 10 ක එනම් නිර්දේශ 05 ක් පමණි.

(ඈ) මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් 2020 හා 2021 වර්ෂවල පොලිස් ස්ථාන, රැඳවුම් මධ්‍යස්ථාන හා බන්ධනාගාර නිරීක්ෂණය කර විමර්ශණ නිලධාරියා ඒ පිළිබඳ සකස් කරන වාර්තාවල සඳහන් කළ යුතු වැදගත්ම කරුණු ලෙස දක්වා ඇති ස්ථාන නිරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු, ඒ සම්බන්ධයෙන් තමාගේ නිගමනයන් හා ගනු ලැබූ පියවරයන් කවරේද යන්න ඇතුළත් කර නොතිබුණි. තවද එම වාර්තාව කවරෙකු වෙත යොමු කරන්නේද යන්න සඳහන්ව නොතිබුණු අතර එම වාර්තාව වෙනත් නිලධාරියකු විසින් පසු විපරම් කරන බවට සාක්ෂි නොවීය.

(ඉ) අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කර තිබුණද ඒ තුලින් මහජනයාගේ දැනුවත් භාවය වැඩිවීමක් සිදුවී නොතිබීම නිසා මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත පසු ගිය වර්ෂ 05 තුල ලැබුණු පැමිණිලි වලින් නිර්දේශ ලබා දීමෙන් හා සහන ලබා දීමෙන් තොරව සියයට 67 ත් සියයට 95 ත් අතර පැමිණිලි ප්‍රමාණයක් විවිධ හේතූන් දක්වා ඉවත් කර තිබුණු අතර සියයට 40 කට අධික පැමිණිලි ප්‍රමාණයක් මානව හිමිකම් උල්ලංඝනය වීමක් සිදුවී නොතිබීම හෝ විෂය පථයට අනුකූල නොවීම මත ඉවත් කර තිබුණි.

(ඊ) මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් පැමිණිලි විමර්ශනය කිරීමේදී වර්ෂ 02 ත් වර්ෂ 08 ත් අතර විශාල කාල පමාවක් පැවති අතර වර්ෂය තුල ලැබුණු පැමිණිලි සඳහා එම වර්ෂය තුලදීම නිර්දේශ ලබාදී නිබුණේ සියයට 01 කටත් අඩු ප්‍රමාණයක් සඳහා පමණි.

3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ පැවති කාන්තා දින සැමරුම් වැඩ සටහනේ ඡායාරූප හා වීඩියෝ ගත කිරීම සඳහා රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුගත වීමකින් තොරොව කිසිදු මිල කැඳවීමක් සිදු නොකර පෞද්ගලික ආයතනයක් මගින් සිදු කර ඒ සඳහා රු.30,000 ක් ගෙවා තිබුණි.

(ආ) කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ පැවති කාන්තා දින සැමරුම් උළෙල පැවැත්වීම සඳහා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව තෝරාගෙන තිබුණි. මෙහිදී ආහාර පාන මිලදී ගැනීමට අදාල ලංසු කැඳවා නොතිබූ අතර ශාලා පහසුකම් සඳහා පමණක් ලංසු කැඳවීම සිදු කර තිබුණි. එම සැමරුම් උළෙලට සහභාගී වූ පුද්ගලයින් 75 දෙනෙකු වෙනුවෙන් කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියක් අනුගමනය නොකර රු.225,000 කට පෞද්ගලික ආයතනයකින් ආහාර මිලදීගෙන තිබුණු අතර එම ආහාර වියදමට අමතරව තවත් රු.82,950 ක් කිසිදු පූර්ව අනුමැතියක් ලබා නොගෙන එම ආයතනයට ගෙවා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී රු.600,000 ක්වූ ලැප්ටොප් පරිගණක මිලදිගැනීමේ ප්‍රසම්පාදනයේදී ඒ සඳහා වූ තාක්ෂණික පිරිවිතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (අ) (ii) ඡේදය අනුගමනය නොකර තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිගේ අත්සනින් පමණක් අනුමැතිය ලබාදී තිබුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ඡේදය ප්‍රකාරව ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා ගතකළ යුතු අතර, එම වාර්තා සටහන් ලංසු විවෘත කිරීමේ කමිටුවේ සියලුම සාමාජිකයන් විසින් අත්සන් කළ යුතුය. එසේ වුවත් ලැප්ටොප් පරිගණක මිලදිගැනීමේ ප්‍රසම්පාදනයේදී එලෙස ලංසු විවෘත කිරීමේ වාර්තා පවත්වා නොතිබුණි.

3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) පසුගිය වර්ෂයේ සිට ධාවනයෙන් තොරව පරිශ්‍රයේ ගාල් කර පැවති යතුරු පැදි 03 ක් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ වෙනත් ආයතනයකට පවරා දීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ නිලධාරියකු අතින් හානියට පත්වූ ලැප්ටොප් පරිගණකය නැවත යථා තත්ත්වයට පත්කිරීමට වැයවූ රු.80,000 ක මුදල එම නිලධාරියාගෙන් අය කර ගැනීමට විගණන දින වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාල විසින් මාසික වැඩ සැලසුම් සකස් කර ඒවා ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු අතර මාසය අවසානයේ එම සැලසුම්ගත කාර්යන් ඉටු කිරීම පිළිබඳව ප්‍රගති වාර්තාවක් ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද, මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් 2020 හා 2021 වර්ෂවල එලෙස කටයුතු කර නොතිබුණි.

(ඈ) කොමිෂන් සභාව විසින් 2021 වර්ෂය සඳහා වාහන පිරිවැය වාර්තා සකස් කර විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණු හෙයින් කොමිෂන් සභාව විසින් වාහන ඵලදායි ලෙස උපයෝජනය කර ඇත් ද යන්න විගණනයේදී තහවුරු කර ගැනීමට නොහැකි විය.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා සුදුසු විගණකවරයකු පත් කරනු ලැබිය යුතු වුවත්, 2017 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණකවරයකු පත් කර අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි.

4.2 විගණන හා කළමනාකරණ කමිටුව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව සෑම අස්ථිත්වයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටුවක් තිබිය යුතු වුවත්, 2017 වර්ෂයේ සිට කොමිෂන් සභාවේ විගණන හා කළමනාකරණ කමිටුව පවත්වා නොතිබුණි.

5. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මානව හිමිකම් කොමිෂන් සභාවේ හිටපු ලේකම්වරිය 2018 ජනවාරි 30 වන දින අනිවාර්ය නිවාඩු යවා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් සිදු කළ මූලික විමර්ශනයේ වාර්තාව පදනම් කර ගනිමින් 2019 නොවැම්බර් 21 දින ලේකම්වරියගේ වැඩ තහනම් කර තිබුණි. කොමිෂන් සභාව විසින් 2020 වර්ෂයේ ඒ සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර තිබුණු නමුත් විගණන දිනය වන විට වර්ෂ 2 ක් පමණ කාලයක් ගත වී තිබුණද විනය පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.

(ආ) 2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 235 ක් වූ අතර නත්‍ය කාර්ය මණ්ඩලය 144 ක් විය. නිලධාරීන් 93 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 21 ක්ද, තෘතීයික මට්ටමේ පුරප්පාඩු 37 ක්ද හා ද්විතියික මට්ටමේ පුරප්පාඩු 35 ක්ද විය. ප්‍රාථමික මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නිලධාරීන් දෙදෙනෙකු අතිරික්තව පැවතුනි. ඒ අනුව කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 40 ක් පුරප්පාඩුව පැවතුනි.

(ඇ) කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලය 46 ක් වූ අතර නත්‍ය කාර්ය මණ්ඩලය 25 ක් විය. ඉන් එක් නිලධාරියකු ද්විතියික පදනම මතද, තවත් නිලධාරියකු කොන්ත්‍රාත් පදනම මතද, තවත් නිලධාරීන් දෙදෙනෙකු රාජකාරී ඉටු කිරීමේ පදනම මතද පුරවා තිබුණි. ඒ අනුව කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 25 ක් පුරවා නොතිබුණි.

එම්.සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති
විගණකාධිපති වෙනුවට

එම්. සෝමතිලක
නියෝජ්‍ය විගණකාධිපති
ජාතික විගණන කාර්යාලය

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. PIC/B/HRC/2/21/28 ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date 2022 ජූනි ⑰ දින

RECEIVED 11 JUL 2022 H.R.C.S.L.

ලේකම්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

යථෝක්ත විගණන වාර්තාව මේ සමඟ එවා ඇත.

02. ජාතික විගණන පනතේ 39(1) උප වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලැකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙතද, භාණ්ඩාගාරයේ ලේකම්වරයා වෙත හා අදාළ අමාත්‍යවරයාට දැනුම් දිය යුතුය.

03. පනතේ 39(2) උප වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාවේ ඇතුළත් මා විසින් පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු තිබේනම් ඒ බවද මා වෙත දන්වා එවන මෙන් කාරුණිකව දන්වමි.

එම්.සෝමතිලක

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

පිටපත:- 1. මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා.

2. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායිකරණ හා ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය எனது இல. My No. PIC/B/HRC/2/21/28 ඔබේ අංකය உமது இல. Your No. දිනය திகதி Date 2022 ජූනි 17 දින

ලේකම්,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11 (2) වගන්තිය ප්‍රකාරව වූ මෙම වාර්තාව නිකුත් කරනු ලබන අතර ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් ජාතික විගණන පනතේ 39 වන වගන්තියේ සඳහන් විධිවිධාන අනුව කටයුතු කර මෙම වාර්තාවේ දින සිට මාස 03 ක් ඇතුළත යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම ක්‍රියාමාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග පිළිබඳව මා වෙත වාර්තා කළ යුතුය. මෙම වාර්තාවේ පෙන්වා දී ඇති යම් ක්‍රියාමාර්ගයක් හෝ කරුණක් පිළිබඳව ක්‍රියාත්මක කිරීමේ හෝ නොහැකිවීමේ හේතු නිබේ නම් ඒ බව ද මා වෙත දන්වා එවිය යුතුය.

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1 ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
කොමිෂන් සභාව සතු සියළු වත්කම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් කළ යුතු වුවත්, කොමිෂන් සභාව විසින් 2004 ජනවාරි 01 දිනෙන් පසු අත්පත් කර ගත් වත්කම් පමණක් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් කර තිබුණු අතර 2004 වර්ෂයට පෙර පැවති වත්කම් ඇතුළත් කර නොතිබුණි.	නිවැරදිව ගිණුම්ගත කළ යුතුවේ.	කොමිෂන් සභාවේ වත්කම් අත්පත් කර ගැනීම මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයේ ඇතුළත් කර ඇතත්එම වත්කම් සියල්ල නැවත තක්සේරු කර අදාල පරිදි පොත්වලට ගැනීමට පියවර ගනිමින් පවති. භාණ්ඩ තක්සේරු කිරීමට අදාල මාණ්ඩලික පත්‍රිකාවක් ඉදිරිපත් කර ඇත.

2. මූල්‍ය සමාලෝචනය

2.1 නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	නිරීක්ෂණය වටිනාකම රු.	නිරීක්ෂණය අනුකූල නොවීම	නිර්දේශය	ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 3.2 ඡේදය		සෑම මුදල් වර්ෂයකම ජුනි 15 දිනට පෙර පසුගිය වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව ප්‍රධාන ගණන්දීමේ නිලධාරිටද පිටපතක් සහිතව විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතු වුවත් කොමිෂන් සභාව විසින් 2020 වර්ෂය සඳහා වූ වාර්තාවෙන් කොටසක් මාස 06 ක පමණ ප්‍රමාදයක් සහිතව 2021 දෙසැම්බර් මසදී විගණනය වෙත ඉදිරිපත් කර තිබුණි. එම වාර්තාවේ අම්පාර ,බදුල්ල, කල්මුනේ, මහනුවර යන ප්‍රාදේශීය කාර්යාලවල හා නුවරඑළිය, කිලිනොච්චිය, මන්නාරම, පොළොන්නරුව යන	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.	2021 වර්ෂයේ ප්‍රාදේශීය කාර්යාල සියල්ල භාණ්ඩ සමීක්ෂණය අවසන් කර වාර්තා මේ සමඟ ඉදිරිපත් කරන අතර ප්‍රධාන කාර්යාලයේ භාණ්ඩ සමීක්ෂණය අවසන් කරමින් පවතී.

			උපකාර්යාලවල භාණ්ඩ සම්ක්ෂණ වාර්තා ඇතුළත් වී නොතිබුණි.		
	3.2.5ඡේදය		උක්ත චක්‍රලේඛයේ ප්‍රකාරව සෑම මුදල් වර්ෂයකම අප්‍රේල් 30 දිනට පෙර පොදු 47 වාර්තාව අනුව විනාශ කළ යුතු , අලුත්වැඩියා කළ යුතු , විකිණිය යුතු හා වෙනත් ආයතන වලට පැවරිය හැකි භාණ්ඩ සම්බන්ධයෙන් කටයුතු කළ යුතු වුවත් එලෙස කටයුතු කිරීමකින් තොරව පසුගිය වර්ෂයේ භාණ්ඩ සම්ක්ෂණ වාර්තාව ඉදිරිපත් කර නිබුණි.	චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කළ යුතු වේ.	2020 වර්ෂයේ ප්‍රධාන කාර්යාලයේ පොදු 47 න් ඉවත් කිරීම සඳහා යෝජිත භාණ්ඩ පුන්තලම ගොවිජන සේවා කාර්යාලය වෙත මාරු කරන ලදී.
(ආ)	1993 සැප්තැම්බර් 21 දිනැති 93/22 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය	650,016	රාජකාරියේ යෙදී සිටියදී 2014 වර්ෂයේදී අනතුරකට ලක්වූ කොමිෂන් සභාවේ නිලධාරිනියකට චක්‍රලේඛය ප්‍රකාරව ගෙවූ රු.308,700 ක වන්දි මුදලට අමතරව කොමිෂන් සභාවේ අනුමැතිය මත පමණක් 2016 අප්‍රේල් මාසයේ සිට 2019 මාර්තු මාසය දක්වා මාසික ප්‍රවාහන දීමනා ලෙස		2016 සිට රාජකාරී සඳහා වාර්තා කළ යුතු බැවින්ද ඇය කාර්යාලයට ගෙන්වා ගැනීම අත්‍යවශ්‍ය වූ බැවින්ද ඇයගේ ආබාධිත තත්ත්වය වරින් වර සැන්කම් වලට භාජනය වූ බැවින් ද

	එකතුව රු.650,016 ක් ගෙවා තිබුණි.	කොමිෂන් සභා තීරණයක් මත ප්‍රවාහන දීමනාවක් ඇය වෙත ගෙවා ඇත. එම මුදල රු.650,016 ක් වුවද මාසිකව වැය කර ඇති මුදල රු.2,313 කි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යභාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා වූ කාල සීමාව තුල අධ්‍යාපන අමාත්‍යාංශයට අදාලව ලබා දී තිබුණු නිර්දේශ 90 න් විගණිත දිනය වන 2022 පෙබරවාරි 14 දින දක්වා ක්‍රියාත්මක වී තිබුණේ නිර්දේශ 57 ක් පමණි. එනම් සියයට 63 කි.	ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කළ යුතු වේ	කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක නොවීම පිළිබඳව නැවත සලකා බැලීම සඳහා කොමිෂන් සභාව විසින් ඒ සඳහා පරීක්ෂණ හා විමර්ශන අංශය විසින් වෙනම ඒකකයක් පිහිටුවා නිර්දේශ ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් පසු විපරම් කරමින් පවතී.

(ආ)	කොමිෂන් සභාව විසින් 2016 සිට 2018 වර්ෂය දක්වා කාල සීමාව තුල විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අදාලව ලබා දී තිබුණු නිර්දේශ 07 න් විගණිත දිනය වන 2022 පෙබරවාරි 14 දින දක්වා ක්‍රියාත්මක වී තිබුණේ ලබාදුන් නිර්දේශ වලින් සියයට 29 ක් එනම් නිර්දේශ 02 ක් පමණි.	ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කළ යුතු වේ	කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක නොවීම පිළිබඳව නැවත සලකා බැලීම සඳහා කොමිෂන් සභාව විසින් ඒ සඳහා පරීක්ෂණ හා විමර්ශන අංශය විසින් වෙනම ඒකකයක් පිහිටුවා නිර්දේශ ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් පසු විපරම් කරමින් පවතී.
(ඇ)	කොමිෂන් සභාව විසින් 2016 සිට 2018 වර්ෂය දක්වා කාල සීමාව තුල ශ්‍රී ලංකා පොලිසියට අදාලව ලබා දී තිබුණු නිර්දේශ 50 න් විගණිත දිනය වන 2022 පෙබරවාරි 14 දින දක්වා ක්‍රියාත්මක වී තිබුණේ ලබාදුන් නිර්දේශ වලින් සියයට 10 ක් එනම් නිර්දේශ 05 ක් පමණි.	ලබා දුන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ පසු විපරම් කටයුතු සිදු කළ යුතු වේ	කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක නොවීම පිළිබඳව නැවත සලකා බැලීම සඳහා කොමිෂන් සභාව විසින් ඒ සඳහා පරීක්ෂණ හා විමර්ශන අංශය විසින් වෙනම ඒකකයක් පිහිටුවා නිර්දේශ ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් පසු විපරම් කරමින් පවතී.
(ඈ)	මානව ප්‍රාදේශීය කාර්යාලය විසින් 2020 හා 2021 වර්ෂවල පොලිස් ස්ථාන, රැඳවුම් මධ්‍යස්ථාන හා	පොලිස් ස්ථාන, රැඳවුම් මධ්‍යස්ථාන හා බන්ධනාගාර	ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිර්දේශ ක්‍රියාත්මක

	බන්ධනාගාර නිරීක්ෂණය කර විමර්ශණ නිලධාරියා ඒ පිළිබඳ සකස් කරන වාර්තාවල සඳහන් කළ යුතු වැදගත්ම කරුණු ලෙස දක්වා ඇති ස්ථාන නිරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු, ඒ සම්බන්ධයෙන් තමාගේ නිගමනයන් හා ගනු ලැබූ පියවරයන් කවරේද යන්න ඇතුළත් කර නොතිබුණි. තවද එම වාර්තාව කවරෙකු වෙත යොමු කරන්නේද යන්න සඳහන්ව නොතිබුණු අතර එම වාර්තාව වෙනත් නිලධාරියකු විසින් පසු විපරම් කරන බවට සාක්ෂි නොවීය.	නිරීක්ෂණය කර විමර්ශණ නිලධාරියා විසින් සකස් කරන වාර්තාවේ ස්ථාන නිරීක්ෂණයේදී අනාවරණය වූ කරුණු, ඒ සම්බන්ධයෙන් තමාගේ නිගමනයන් හා ගනු ලැබූ පියවරයන් කවරේද යන්න ඇතුළත් කළ යුතු වේ.	නොවීම පිළිබඳව නැවත සලකා බැලීම සඳහා කොමිෂන් සභාව විසින් ඒ සඳහා පරීක්ෂණ හා විමර්ශන අංශය විසින් වෙනම ඒකකයක් පිහිටුවා නිර්දේශ ක්‍රියාත්මක නොවීම සම්බන්ධයෙන් පසු විපරම් කරමින් පවතී.
(ඉ)	අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් මගින් ක්‍රියාත්මක කර තිබුණද ඒ තුලින් මහජනයාගේ දැනුවත් භාවය වැඩිවීමක් සිදුවී නොතිබීම නිසා මාතර ප්‍රාදේශීය කාර්යාලය වෙත පසු ගිය වර්ෂ 05 තුල ලැබුණු පැමිණිලි වලින් නිර්දේශ ලබා දීමෙන් හා සහන ලබා දීමෙන් තොරව සියයට 67 ත් සියයට 95 ත් අතර පැමිණිලි ප්‍රමාණයක් විවිධ හේතූන් දක්වා ඉවත් කර තිබුණු අතර සියයට 40 කට අධික පැමිණිලි ප්‍රමාණයක් මානව හිමිකම් උල්ලංඝනය වීමක් සිදුවී නොතිබීම හෝ විෂය පථයට	මහජනයාගේ දැනුවත් භාවය වැඩි වන ලෙස අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මකකළ යුතු වේ.	මාතර ප්‍රාදේශීය කාර්යාලය මගින් දකුණු පළාතේ ගාල්ල, මාතර හා හම්බන්තොට යන දිස්ත්‍රික්ක තුන ආවරණය කරයි. මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් පසුගිය වසර 5 තුල අධ්‍යාපන වැඩසටහන් 108 ක් පමණ සිදු කර ඇත. එමඟින් ප්‍රදේශයේ ජනතාවට මානව හිමිකම් පිළිබඳව දැනුවත් කිරීම සිදු කර ඇත. මාතර ප්‍රාදේශීය කාර්යාලය

	අනුකූල නොවීම මත ඉවත් කර තිබුණි.		මගින් විශාල ප්‍රදේශයක් ආවරණය වන අතර එම ප්‍රදේශය තුල විශාල ජනතාවක් ජීවත් වේ.
(ඊ)	මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් පැමිණිලි විමර්ශනය කිරීමේදී වර්ෂ 02 ත් වර්ෂ 08 ත් අතර විශාල කාල පමාවක් පැවති අතර වර්ෂය තුල ලැබුණු පැමිණිලි සඳහා එම වර්ෂය තුලදීම නිර්දේශ ලබාදී තිබුණේ සියයට 01 කටත් අඩු ප්‍රමාණයක් සඳහා පමණි.	පැමිණිලි විමර්ශන කටයුතු කඩිනම් කළ යුතු වේ.	ප්‍රාදේශීය කාර්යාල වල පැමිණිලි විමර්ශනයට හා නිර්දේශ ලබා දීම සඳහා කඩිනම් පියවර ගැනීම සඳහා උපදෙස් දී ඇත.

3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	සමාලෝචිත වර්ෂයේ පැවති කාන්තා දින සැමරුම් වැඩ සටහනේ ඡායාරූප හා වීඩියෝ ගත කිරීම රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුගත වීමකින් තොරව කිසිදු මිල කැඳවීමක් සිදු නොකර පෞද්ගලික ආයතනයක් මගින් සිදු කර ඒ සඳහා රු 30,000.ක් ගෙවා තිබුණි	ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුගත විය යුතු වේ.	2021 වර්ෂයේ ජාත්‍යන්තර කාන්තා දිනය සැමරීම වෙනුවෙන් ශ්‍රී ලංකා මනව හිමිකම් කොමිෂන් සභාව විසින් පවත්වන ලද සම්මන්ත්‍රණය සඳහා වැඩ සටහන් ඡායාරූප හා වීඩියෝ ගත කිරීම මීට පෙර කරන ලද වැඩසටහන් වලට නිතරම සම්බන්ධවන ආයතනයකින් වාවික මිල ගණන් වීමසා එම

මිළ ගණන් සඳහා විධිමත් අනුමැතිය මහින් රජයට පාඩුවක් සිදු නොවන ආකාරයෙන් හා උපරිම සේවය ලබා ගැනීම සඳහා සිදුකර ඇත. ඉදිරියට මෙවැනි අඩු පාඩු මග හරවා ගෙන ප්‍රසම්පාදන මාර්ගෝපදේශ වලට අනුගත වෙමින් රාජකාරි සිදු කරන ලෙස සියලුම නිලධාරීන් දැනුවත් කරන ලදි.

(ආ) කොමිෂන් සභාවේ ප්‍රධාන කාර්යාලයේ පැවති කාන්තා දින සැමරුම් උළෙල පැවැත්වීම සඳහා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව තෝරාගෙන තිබුණි . මෙහිදී ආහාර පාන මිලදී ගැනීමට අදාල ලංසු කැඳවා නොතිබූ අතර ශාලා පහසුකම් සඳහා පමණක් ලංසු කැඳවීම සිදු කර තිබුණි. එම සැමරුම් උළෙලට සහභාගී වූ පුද්ගලයින් 75දෙනෙකු වෙනුවෙන් කිසිදු ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටියක් අනුගමනය නොකර රු.225,000 කට පෞද්ගලික ආයතනයකින් ආහාර මිලදීගෙන තිබුණු අතර එම ආහාර වියදමට අමතරව තවත් රු.82,950 ක් කිසිදු පූර්ව අනුමැතියක් ලබා ලංසු කැඳවීමේදී අතර ශාලා පහසුකම් සඳහා පමණක් නොව ආහාර සැපයීමද ඇතුළත්ව ලංසු කැඳවීම සිදු කළ යුතු වේ.

2021 කාන්තා දින සැමරුම් සඳහා ආයතන 4 කින් මිල ගණන් කැඳවා බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව තෝරාගත් අතර, එම ආයතනය විසින් ආහාර සැපයීම් ද සිදු කරන ලදි. බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාව වෙනත් කිසිම ආයතනයකින් හෝ බාහිර පුද්ගලයෙකුගෙන් ආහාර ලබා ගැනීමට අවස්ථාව ලබා නොදෙයි. එබැවින් ආහාර ලබා ගැනීමට මිල ගණන් කැඳවීමක් සිදු කිරීමේ අවස්ථාවක් නොමැති බැවින් අදාල ආයතනයෙන්ම ආහාර ලබා ගැනීම සිදු කරන ලදි.

නොගෙන එම ආයතනයට ගෙවා නිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී රු.600,000 ක්වූ ලැප්ටොප් පරිගණක මිලදිගැනීමේ ප්‍රසම්පාදනයේදී ඒ සඳහා වූ තාක්ෂණික පිරිවිතර රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6.1 (අ) (ii) ඡේදය අනුගමනය නොකර තාක්ෂණික ඇගයීම් කමිටුවේ සභාපතිගේ අත්සනින් පමණක් අනුමැතිය ලබාදී නිබුණි.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව කටයුතු කළ යුතු වේ.

තාක්ෂණ ඇගයීම් කමිටුව වෙත පිරිවිතරයන් හා මිලගණන් ලබා දෙමින් තාක්ෂණ ඇගයීම් කමිටුවේ අනුමැතියට ඉදිරිපත් කරන ලදි. මෙම කාලය තුල කොවිඩ් 19 වසංගතය බරපතල ලෙස පැවති කාලයක් වූ බැවින්, සභාපති විසින් කමිටු සාමාජිකයන් සමග දුරකථනයෙන් සාකච්ඡා කරමින් වාචික එකඟතාවයන් මත සභාපති විසින් සකස් කරන ලද වාර්තාවට අදාල සාමාජිකයන් විසින් ලබාදෙන ලද එකඟතාවය මත තීරණය ලබාගෙන එම තීරණය සභාපති විසින් පමණක් අත්සන් කර ඉදිරිපත් කිරීම පිළිගෙන ඇත. කෙසේ වෙතත් මෙවැනි අඩු පාඩු අවම කරගෙන රාජකාරි ඉටුකිරීමේදී අවශ්‍ය නිවරදි පියවර ගන්නා ලෙසත් සියළුම නිලධාරීන් දනුවත් කරන ලදි.

(ඇ)	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ඡේදය ප්‍රකාරව ලංසු විවෘත කිරීම පිළිබඳ කටයුතු නියමිත ආකෘති පත්‍රයක වාර්තා ගතකළ යුතු අතර ,එම වාර්තා සටහන් ලංසු විවෘත කිරීමේ කමිටුවේ සියලුම සාමාජිකයන් විසින් අත්සන් කළ යුතුය .එසේ වුවත් ලැප්ටොප් පරිගණක මිලදීගැනීමේ ප්‍රසම්පාදනයේදී එලෙස ලංසු විවෘත කිරීමේ වාර්තා පවත්වා නොතිබුණි.	ප්‍රසම්පාදන මාර්ගෝපදේශවලට අනුව කටයුතු කළ යුතු වේ.	රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ඡේදය ප්‍රකාරව ලංසු විවෘත කිරීම සඳහා සියළුම සාමාජිකයින් අත්සන් කල යුතු වුවද කොවිඩ් 19 අවස්ථාවේ මෙසේ සිදු කිරීමට නොහැකි වූ අතර, දැනට ලංසු විවෘත කිරීමේ අඩුපාඩු යාවත් කාලීන කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

3.3 කළමනාකරණ දුර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	පසුගිය වර්ෂයේ සිට ධාවනයෙන් තොරව පරිශ්‍රයේ ගාල් කර පැවති යතුරු පැදි 03 ක් අළුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට හෝ වෙනත් ආයතනයකට පවරා දීමට හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගැනීමට කොමිෂන් සභාව කටයුතු කර නොතිබුණි.	යතුරුපැදි සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගත යුතු වේ.	බයිසිකල් 03 රාජකාරී අවශ්‍යතාවයන් මත වෙන් කිරීම සඳහා පියවර ගනිමින් පවතී.

(ආ)	සමාලෝචිත වර්ෂයේ නිලධාරියකු අතින් හානියට පත්වූ ලැප්ටොප් පරිගණකය නැවත යථා තත්ත්වයට පත්කිරීමට වැයවූ රු. 80,000 ක මුදල එම නිලධාරියාගෙන් අය කර ගැනීමට විගණිත දින වන විටත් කටයුතු කර නොතිබුණි.	රු.80,000 අය කර ගැනීමට කටයුතු කළ යුතු වේ.	හානියට පත්වූ ලැප්ටොප් පරිගණක යන්ත්‍රය අලුත්වැඩියා සඳහා දැරීමට සිදු වූ රු 80,000 ක මුදල පරිගණකය පාවිච්චි කරන ලද නිලධාරියාට ගෙවන ලෙස දන්වා ඇත. ඇය විසින් මේ සඳහා අභියාචනයක් ඉදිරිපත් කර ඇති අතර, එම අභියාචනය සඳහා ඉදිරිපත් කළ මාණ්ඩලික සඳහා තීරණය ලැබූ වහාම අය කර ගැනීමට අවශ්‍ය පියවර ගැනීමටසටහන් කරගෙන ඇත.
(ඇ)	කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාල විසින් මාසික වැඩ සැලසුම් සකස් කර ඒවා ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු අතර මාසය අවසානයේ එම සැලසුම්ගත කාර්යන් ඉටු කිරීම පිළිබඳව ප්‍රගති වාර්තාවක් ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතුය. එසේ වුවද, මාතර ප්‍රාදේශීය කාර්යාලය විසින් 2020 හා 2021 වර්ෂවල එලෙස කටයුතු කර නොතිබුණි.	ප්‍රාදේශීය කාර්යාල විසින් මාසික වැඩ සැලසුම් සහ මාසය අවසානයේ ඒ පිළිබඳව ප්‍රගති වාර්තාවක් ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු වීම.	කොමිෂන් සභාවේ ප්‍රාදේශීය කාර්යාල විසින් මාසික වැඩ සැලසුම් සකස් කර ඒවා ප්‍රධාන කාර්යාලය වෙත ඉදිරිපත් කළ යුතු අතර, මාසය අවසානයේ එම සැලසුම්ගත කාර්යන් ඉටු කිරීම පිළිබඳව ප්‍රගති වාර්තා ඉදිරිපත් කිරීම කළයුතු වුවද එම වාර්තා නිසි පරිදි ඉදිරිපත් වන්නේද යන්න පිළිබඳ පසු විපරම් කිරීමේ කටයුතු ප්‍රධාන කාර්යාලය විසින් කළ යුතු වුවද එම පසු විපරම එසේ සිදු නොවීමේ අඩුපාඩුව පිළිගන්නා අතර, ඉදිරියේදී එම අඩුපාඩු

මග හරවා ගෙන කටයුතු කිරීමට අවශ්‍ය පියවර ගැනීමට උපදෙස් දී ඇති අතර, ඉදිරියේදී එම අඩුපාඩුව මහහරවා කටයුතු කිරීමට එකඟ වෙමි.

4. යහපාලනය

4.1 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරි විසින් අභ්‍යන්තර විගණන කටයුතු සිදු කිරීම සඳහා සුදුසු විගණකවරයකු පත් කරනු ලැබිය යුතු වුවත්, 2017 වර්ෂයේ සිට අභ්‍යන්තර විගණකවරයකු පත් කර අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කර නොතිබුණි.	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 40 වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කළ යුතු වීම.	කොමිෂන් සභාව සඳහා අභ්‍යන්තර විගණකවරයකු පත් කර ගැනීමට ඉල්ලුම්පත් කැඳවා සම්මුඛ පරීක්ෂණ පවත්වන ලදී. කොමිෂමේ රාජකාරි සඳහා සුදුසු නිලධාරියක් නොසිටිය බැවින් බඳවා ගැනීම ප්‍රමාද විය. දැනට බඳවා ගැනීම් අත්හිටුවා ඇති බැවින් මේ සඳහා නිලධාරියකු පත් කර ගැනීම ගැටළු සහගත බවට පත්වී ඇත.

4.2 විගණන හා කළමනාකරණ කමිටුව

විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව සෑම අස්ථිත්වයක් සඳහාම විගණන හා කළමනාකරණ කමිටුවක් තිබිය යුතු වුවත්, 2017 වර්ෂයේ සිට කොමිෂන්	2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාරව කටයුතු කළ යුතු වීම.	අභ්‍යන්තර විගණකවරයකු නොමැති බැවින් විගණන හා කළමනාකරණ කමිටුව පවත්වා නොතිබුණි.

සභාවේ විගණන හා කළමනාකරණ කමිටුව පවත්වා නොතිබුණි.

5. **මානව සම්පත් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	නිර්දේශය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම
(අ)	මානව හිමිකම් කොමිෂන් සභාවේ හිටපු ලේකම්වරිය 2018 ජනවාරි 30 වන දින අනිවාර්ය නිවාඩු යවා තිබුණු අතර ඒ සම්බන්ධයෙන් සිදු කළ මූලික විමර්ශනයේ වාර්තාව පදනම් කර ගනිමින් 2019 නොවැම්බර් 21 දින ලේකම්වරියගේ වැඩ තහනම් කර තිබුණි .කොමිෂන් සභාව විසින් 2020වර්ෂයේ ඒ සම්බන්ධයෙන් විධිමත් විනය පරීක්ෂණයක් ආරම්භ කර තිබුණු නමුත් විගණන දිනය වන විට වර්ෂ 2ක් පමණ කාලයක් ගත වී තිබුණද විනය පරීක්ෂණ කටයුතු අවසන් කර නොතිබුණි.	විධිමත් විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කළ යුතු වේ.	රට තුල කොවිඩ් 19 වසංගතය හමුවේ සාක්ෂිකරුවන් සාක්ෂි සඳහා කැඳවීමේ අපහසුතාවයක්ද පරීක්ෂණ දිගින් දිගටම කල් දැමීම මත කාලය දිග් ගැස්සී ඉක්මනින්ම සිදු වී ඇත.මෙම පරීක්ෂණය අවසන් කර වාර්තාව ලබා දෙන ලෙස දක්වා ඇති අතර, මාස 03 ක් ඇතුළත අවසන් කරන බවට දැනට තහවුරුවක් ලබාදී ඇත.
(ආ)	2021 දෙසැම්බර් 31 දිනට අනුමත කාර්ය මණ්ඩලය 235 ක් වූ අතර නත්‍ය කාර්ය මණ්ඩලය 144 ක් විය. නිලධාරීන් 93 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර ඉන් ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 21	අනවශ්‍ය නතනතුරු සඳහා වන පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ.	මෙම පුරප්පාඩු වූ නතනතුරු වලින් නතනතුරු 63 ක් සඳහා අයදුම්පත් කැඳවා ඇත. රජයේ ප්‍රතිපත්තිමය හේතූන් මත බඳවා ගැනීම් අත්හිටුවා ඇත.

	ක්ද, තෘතීයික මට්ටමේ පුරප්පාඩු 37 ක්ද හා ද්විතියික මට්ටමේ පුරප්පාඩු 35 ක්ද විය. ප්‍රාථමික මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා නිලධාරීන් දෙදෙනෙකු අතිරික්තව පැවතුනි. ඒ අනුව කොමිෂන් සභාවේ අනුමත කාර්ය මණ්ඩලයෙන් සියයට 40 ක් පුරප්පාඩුව පැවතුනි.		
(ඇ)	කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත කාර්ය මණ්ඩලය 46 ක් වූ අතර තත්‍ය කාර්ය මණ්ඩලය 25 ක් විය. ඉන් එක් නිලධාරියකු ද්විතියික පදනම මතද තවත් නිලධාරීන් දෙදෙනෙකු කොන්ත්‍රාත් පදනම මතද පුරවා තිබුණි. ඒ අනුව කොමිෂන් සභාවේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 24 ක් පුරවා නොතිබුණි.	අතවශ්‍ය තනතුරු සඳහා වන පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතු වේ.	මෙම පුරප්පාඩු වූ තනතුරු වලින් තනතුරු 63 ක් සඳහා අයදුම්පත් කැඳවා ඇත. රජයේ ප්‍රතිපත්තිමය හේතූන් මත බඳවා ගැනීම් අත්හිටුවා ඇත.

එම්. සෝමතිලක

නියෝජ්‍ය විගණකාධිපති

විගණකාධිපති වෙනුවට

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

මගේ අංකය / எனது இல. / My No. | ඔබේ අංකය / உமது இல. / Your No. | දිනය / திகதி / Date: 2022.09.12

වගණකාධිපති,

පාතික විගණන කාර්යාලය.

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 2018 අංක 19 දරන පාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව වාර්ෂික විස්තරාත්මක කලමණාකරණ විගණන වාර්තාව

02. පාතික විගණන පනතේ 39(1) උප වගන්තියේ සඳහන් විධි විධාන අනුව කටයුතු කරමින් යෝජනා කරනු ලබන ප්‍රතිකර්ම, ක්‍රියා මාර්ග හෝ සැලකිල්ලට ගත් ක්‍රියාමාර්ග ද

03. පාතික විගණන පනතේ 39(2) උප වගන්තිය ප්‍රකාරව පෙන්වා දී ඇති කරුණු සම්බන්ධව ක්‍රියා මාර්ග හෝ කරුණු සම්බන්ධයෙන් ක්‍රියාත්මක කිරීම, ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමේ හේතු පිළිබඳ වාර්තාව ද මේ සමග ඉදිරිපත් කරම්.

විසිසුරු රෝහිණී මාරසිංහ
ශ්‍රේෂ්ඨාධිකරණ විසිසුරු (විශ්‍රාමික)
සභාපති
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

සභාපති

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

පිටපත් :

1. මුදල් ආර්ථික ස්ථායිකරණ හා පාතික ප්‍රතිපත්ති අමාත්‍යතුමා
2. ලේකම්, මුදල්, ආර්ථික ස්ථායිකරණ හා පාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය

ප්‍රධාන කාර්යාලය / பிரதான அலுவலகம் / Head Office: 14, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ - 04. / 14, ஆர்.ஏ.த. மெல் மாவத்தை, கொழும்பு - 04. / 14, R.A. De Mel Mawatha, Colombo - 04.
සභාපති / தலைவர் / Chairperson: 011-2505451
ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2505541/ 74
ඊමේල් / மின்னஞ்சல் / e-mail: sechrcsl@gmail.com
දුරකථන / 94 -11-2505580 / 81 / 82
ලේකම් / 011-2505521
ස්ෂණික / 1996
වෙබ් / www.hrcsl.lk

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශනය පිළිබඳ 2018 අංක 19 දරණ පාතික විගණන පනතේ 11(2) වගන්තිය පිළිබඳ වාර්ෂික විස්තරාත්මක කළමණාකරණ විගණන වාර්තාව

1.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.2.1. ගිණුම්කරණ අඩුපාඩු

විගණන නිරීක්ෂණ	නිර්දේශය	ගෙන ඇති ක්‍රියාමාර්ග
කොමිෂන් සභාව සතු සියලුම වත්කම් මූල්‍ය නොවන වත්කම් ප්‍රකාශයන් ඇතුලත් කර නොමැති බව	නිවැරදිව ගිණුම් ගත කිරීම.	තක්සේරු කිරීම සඳහා අවශ්‍ය පියවර ගනිමින් පවති

2. මූල්‍ය සමාලෝචනය

2.1 නිතිරීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම.

විගණන නිරීක්ෂණ	නිර්දේශ	ගෙන ඇති ක්‍රියාමාර්ග
(අ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 3.2. ඡේදය	සෑම මුදල් වර්ෂයකම පුනි 15 දිනට පෙර භාණ්ඩ සම්ක්ෂණ අවසන් කර වාර්තාව සකස් පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම.	2021 වර්ෂය සඳහා 2022 පුනි 15 දිනට පෙර ප්‍රාදේශිය කාර්යාල සියල්ලගේම වාර්තා ඉදිරිපත් කල අතර, ප්‍රධාන කාර්යාලයේ වාර්තාව (2022 පුලි 31 දිනට පෙර ඉදිරිපත් කර ඇත.)
(අ) 2016 මාර්තු 31 දිනැති අංක 05/2016 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය 3:2:5 ඡේදය	සෑම මුදල් වර්ෂයකම අප්‍රේල් 30 දිනට පෙර පොදු 47 අවසන් වාර්තාව ඉදිරිපත් කිරීම.	යාවත් කාලීන කර ඇත.
(ආ) 1993 සැප්තැම්බර් 21 දිනැති 93/22 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය.	අනතුරට ලක්වූ නිලධාරීන්ට වන්දි ගෙවීම.	අනතුරට ලක්වූ නිලධාරීනිය සඳහා වන්දි වශයෙන් රු 308700ක් ගෙවා ඇති අතර, ඇය රාජකාරී අවශ්‍යතාවයට කාර්යාලයට ගෙන්වා ගැනීමට ගත් තීරණය මත මාසිකව ප්‍රවාහන දීමනාවක් ගෙවා ඇත. රාජකාරී අවශ්‍යතාවය හා ඇයගේ ආබාධිත තත්වය පදනම් කරගෙන ඇයට ප්‍රවාහන දීමනාව අනුමත කර ඇත.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1. කාර්යභාරයන් ඉටු නොකිරීම

විගණන නිරීක්ෂණ	නිර්දේශ	ගෙන ඇති පියවර
අ. කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය සඳහා අධ්‍යාපන අමාත්‍යාංශය වෙත සඳහන් කර ඇති නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම.	පසු විපරම් සිදුකල යුතුය.	• පසු විපරම් සිදු කරනු ලබයි. • අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලබාදුන් නිර්දේශ ක්‍රියාත්මක නොකිරීම පිළිබඳ 2021.04.20 දිනැතිව අධ්‍යාපන අමාත්‍යාංශ නිලධාරීන් කැඳවා කරුණු විමසිම් කර ඇති අතර, නිර්දේශ ක්‍රියාත්මක කිරීමට උපදෙස් 2021.05.07 දිනැතිව ලේකම්, අධ්‍යාපන අමාත්‍යාංශය වෙත ලිඛිතව යොමු කර ඇත. • 2022 සැප්තැම්බර් මස කොමිෂන් සභාව හමුවේ අධ්‍යාපන අමාත්‍යාංශ ලේකම් කැඳවීමට නියමිතව ඇත.
ආ. කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය සඳහා විශ්‍රාම වැටුප් දෙපාර්තමේන්තුවට අදාලව ලබාදී තිබුණා. නිර්දේශ ක්‍රියාත්මක නොවීම.	පසු විපරම් සිදුකල යුතුය.	• අදාල නිර්දේශයන්හි වගඋත්තරකාර පාර්ශවයන් ගෙන්වා විමසිම් කරනු ලබයි.
ඇ. කොමිෂන් සභාව විසින් 2016 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා කාල සීමාවට අදාලව ශ්‍රී ලංකා පොලිසියට අනුකූලව ලබදී තිබුනු නිර්දේශ ක්‍රියාත්මක නොවීම.	පසු විපරම් සිදුකල යුතය.	• 2021.01.27 දින පොලිස් දෙපාර්තමේන්තුවේ ඉහල නිලධාරීන් සමග පැවති සාකච්ඡාවේ දී කොමිෂන් සභාව ලබාදෙන නිර්දේශ ක්‍රියාත්මක වීමේ ප්‍රමාදයක් ඇති බවත්, ඉදිරියේ දී ඒ සඳහා ප්‍රමුඛත්වයක් ලබාදී අදාල නිර්දේශ කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස ද මේ වන විට ක්‍රියාත්මක කර ඇති නිර්දේශ සම්බන්ධයෙන් අපව දැනුවත් කරන ලෙෂ ද පොලිස්පති වෙත දැනුම් දෙන ලදී. • 2022.02.03 දින පොලිස්පතිවරයාගේ අත්සනින් යුතුව ශ්‍රී ලංකා පොලිසියේ සියලුම කොට්ඨාශ භාර නිලධාරීන් මෙම කරුණු සම්බන්ධයෙන් දැනුවත් කිරීමට දුරකථන පණිවිඩයක් නිකුත් කර මෙතෙක් දී ඇති නිර්දේශ සම්බන්ධයෙන් වාර්තාවක් කැඳවීමට කටයුතු කර ඇත.
ඈ. මාතර ප්‍රාදේශිය කාර්යාලය විසින් 2020 හා 2021 වර්ෂවල නිරීක්ෂණ විමර්ශන නිලධාරී යොමු කරන ලද නියමයන් හා ගනු ලැබූ පියවර අපැහැදිලි විය.	සියලුම විස්තර වාර්තාවල සඳහන් කළ යුතුය.	• අදාල නිලධාරීන්ට වාචිකව අවශ්‍ය උපදෙස් ලබාදී ඇත.

ඉ. අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කලද ඒ තුලින් මහජනතාව ගේ දැනුම අඩු මට්ටමක පැවතීම.	මහජනයාගේ දැනුවත් භාවය වැඩි වන ලෙස අධ්‍යාපන හා දැනුවත් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.	රටේ පවත්නා ආර්ථික උද්ධමනය නිසා 2022 වර්ෂයේ දැනුවත් කිරීමේ වැඩ සටහන් සඳහා ප්‍රතිපාදන නිදහස් නොකිරීම මත වැඩ සටහන් සම්පාදනය කිරීමට නොහැකි වුවද ඉදිරියේ දී කඩිනම් පියවර ගැනීමට අපේක්ෂිතය.
ඊ. මාතර ප්‍රාදේශිය කාර්යාල විමර්ශන සඳහා වර්ෂ 2-8 ත් කාල සීමාව සඳහා ලැබුණු පැමිණිලි සඳහා නිර්දේශ ලබාදීම ප්‍රමාදයන්	පැමිණිලි විමර්ශන කිරීම කඩිනම් කල යුතුය.	සියලුම ප්‍රාදේශිය කාර්යාල දැනුවත් කර ඇත.

3.2 ප්‍රසම්පාදනයන්

වගණන නිරීක්ෂණ	නිර්දේශ	ගෙන ඇති පියවර
අ. කාන්තා දින සැමරුම සඳහා ජායාරූප හා වීඩියෝ ගත කිරීම ප්‍රසම්පාදනයෙන් තොරව සිදු කිරීම	ප්‍රසම්පාදන මාර්ගපදේශ වලට අනුගත නොවීම.	යාවත් කාලීන කර ඇත.
ආ. කාන්තා දින සැමරුම සඳහා බන්ඩාරණායක සම්මන්ත්‍රණ ශාලාව යොදා ගැනීම හා පෞද්ගලික ආයතනයකින් ආහාර පාන මිලදී ගැනීම.	ආපන ශාලා පහසුකම් පමණක් නොවන ආහාර සඳහා ද මිලගණන් කැඳවිය යුතුය.	ඉදිරියේ දී ප්‍රසම්පාදන ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිලධාරී දැනුවත් කර ඇත.
ඇ. රජයේ ප්‍රසම්පාදන මාර්ගපදේශ සංහුහයේ 2.61 අ(ii) ජේදය අනුගමනය නොකිරීම	ප්‍රසම්පාදන මාර්ගපදේශ වලට අනුව කටයුතු කල යුතුය.	සියලුම නිලධාරීන් දැනුවත් කර යාවත් කාලීනව සිදු කිරීම පිළිබඳ උපදෙස් ලබාදී ඇත.

2.6.1

3.3 කළමණාකරණ දුර්වලතා

වගණන නිරීක්ෂණ	නිර්දේශ	ගන්නා ලද ක්‍රියා මාර්ග
අ. පරිශ්‍රයේ ගාල් කර තිබූ යතුරු පැදි 3 සඳහා ක්‍රියා මාර්ග ගෙන නොතිබීම.	සුදුසු ක්‍රියා මාර්ග ගැනීම.	අලුත් වැඩියාවෙන් පසු රාජකාරී සඳහා යොදවා ඇත.
ආ. හානියට පත් වූ ලැප්ටොප් පරිගණකය නැවත යථාතත්වයට පත් කිරීම සඳහා වැය වූ රු 80,000/- ක මුදල	අයකර ගැනීමට කටයුතු කල යුතුය.	ඔුදල් රෙගුලාසි අනුව වාරික 60කින් අයකර ගැනීමට ලබාදුන් තින්දුව අනුව දැනට මාසික වැටුපෙන් අයකර ගෙන යනු ලබයි.
ඇ. ප්‍රාදේශිය කාර්යාල විසින් මාසික වැඩසැලසුම් කිරීම. එය ප්‍රධාන කාර්යාලයට යොමු කිරීම, මාසය අවසානයේ එම සැලසුම් ගත කාර්යන් ඉටු කිරීම පිළිබඳව ප්‍රගතිය පරීක්ෂා කිරීම.	සෑම ප්‍රාදේශිය කාර්යාලයක් විසින් මාසික වැඩ සැලසුම් සහ මාස අවසානයේ ප්‍රගතිය ප්‍රධාන කාර්යාලයට වාර්තා කිරීම.	යාවත් කාලීන කිරීමට අවශ්‍ය පියවර ගෙන ඇත.

4. යහ පාලනය

4.1 අභ්‍යන්තර විගණනය

නිරීක්ෂණ	නිර්දේශ	ගන්නා ලද ක්‍රියා මාර්ග
2018 අංක 19 දරන පාතික විගණන පනතේ 40 වන වගන්තිය ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු සිදුකිරීම සඳහා සුදුසු විගණකවරයෙකු පත්කරනු ලැබිය යුතුම වුවත් එසේ කර නොමැති බවයි.	2018 අංක 19 දරන පාතික විගණන පනතේ 40 වගන්ති ප්‍රකාරව අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රියාත්මක කලයුතු වීම.	නිලධාරීන් බදවා ගැනීමේ ගැටලු සහගත තත්වය මත ගණකාධිකාරී මේ සඳහා තාවකාලික පදනම මත රාජකාරී ඉටුකිරීමට යොදවා ඇත.

4.2 විගණන හා කළමණාකරණ කමිටුව

නිරීක්ෂණ	නිර්දේශය	ගන්නා ලද ක්‍රියාමාර්ග
2018 අංක 19 දරන පාතික විගණන පනතේ 41 වගන්තිය ප්‍රකාර විගණන හා කළමණාකරණ කමිටුවක් පත් කිරීම	වගන්ති ප්‍රකාරව කටයුතු කිරීම	විගණන කළමණාකරණ කමිටුව පිහිටුවීමට අවශ්‍ය පියවර ගනිමි.

5. මානව සම්පත් කළමණාකරණය

විගණන නිරීක්ෂණ	නිර්දේශය	ගන්නා ලද ක්‍රියාමාර්ග
අ. වැඩ තහනම් කල කොමිෂන් සභාව හිටපු ලේකම් පරීක්ෂණ අවසන් නොවීම.	පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කල යුතුය.	දැනට දිගින් දිගට පරීක්ෂණ පවත්වමින් කඩනමින් අවසන් කිරීමට සියලු උත්සාහයන් දරමින් පවති.
ආ. කාර්ය මණ්ඩල පුරප්පඩු	අවශ්‍ය තනතුරු සම්පූර්ණ කිරීමට කටයුතු කල යුතුය	රජයේ ප්‍රතිපත්ති නිතිමය හේතූන් මත පුරප්පාඩු සපුරා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට නොහැකි වී ඇත. රාජකාරී ඉටුකර ගැනීමට උපාධිධාරී නිලධාරීන් අනුයුක්ත කරගෙන ඇත.
ඇ. කොමිෂනස් සභාවේ පෞෂ්ඨ මට්ටමේ තනතුරු පුරවා නොතිබීම	පුරප්පඩු සම්පූර්ණ කිරීමට කටයුතු කළ යුතුය.	රජයේ ප්‍රතිපත්තිමය හේතූන් මත පුරප්පාඩු පුරවා ගැනීමට නොහැකි වීම මත මෙසේ ද්විතිය හා කොන්ත්‍රාත් පදනමට අත්‍යවශ්‍ය නිලධාරීන් පමණක් බඳවාගෙන ඇත.

සභාපති

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව

2022 දී කොමිෂන් සභාවේ කාර්ය සාධනය වැඩිදියුණු කිරීම සඳහා කෙටි කාලීන සහ මධ්‍යකාලීන ක්‍රියාමාර්ග

- වැවිලි ප්‍රජාවගේ ප්‍රවේශ්‍යතාව ඉහළ නැංවීම සඳහා රත්නපුර සහ නුවරඑළිය ප්‍රදේශයේ අවම වශයෙන් ප්‍රාදේශීය කාර්යාල දෙකක් පිහිටුවීම.

- කොමිෂන් සභාවේ දැනට පවතින අනුමත කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු තනතුරු සඳහා කාර්ය මණ්ඩලය බඳවා ගැනීම

- ජාතික නිවාරණ යාන්ත්‍රණය (NPM) ස්ථාපිත කිරීම තුළින් අත්අඩංගුවේ සිටියදී වධහිංසා පැමිණවීම වැළැක්වීම

- කොමිෂන් සභාව සඳහා ජාත්‍යන්තර සබඳතා අංශය පිහිටුවීම

- පසුගිය වර්ෂවල ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සිද්ධීන් පිළිබඳව විමසීම සඳහා යාන්ත්‍රණයක් හඳුන්වාදීම

- මානව හිමිකම් ආරක්ෂකයින් සහ සිවිල් සමාජ සංවිධාන සමඟ සබඳතා ශක්තිමත් කිරීම

- මානව හිමිකම් පුහුණුව තුළින් කාර්ය මණ්ඩලයේ ධාරිතාව ඉහළ නැංවීම.

- හදිසි සිදුවීම් සහ තත්ත්වයන් නිරීක්ෂණය පිළිබඳ මානව හිමිකම් කොමිසමේ මැදිහත්වීම ශක්තිමත් කිරීම

- ජාතික මානව හිමිකම් ආයතන (APF)හි ආසියා ශාන්තිකර සංසදය, එක්සත් ජාතීන්ගේ නියෝජිතායතන සහ අනෙකුත් ජාත්‍යන්තර උනන්දුවක් දක්වන කණ්ඩායම් සමඟ සමීප සබඳතා ගොඩනඟා ගැනීම සුළුතර ප්‍රජාවන්ගේ අවශ්‍යතා සහ ප්‍රශ්න සලකා බලා තේමා අනුකමිටු යළි පිහිටුවීම

- මානව හිමිකම් කොමිෂන් සභාවේ මතය මාධ්‍ය ප්‍රකාශ හරහා නිරන්තරව ප්‍රචාරය කිරීම.